1

# ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ

**2015 වසරේ දී, ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය, 2014 වසරේ දී වාර්තා වූ සියයට 4.9 ක වර්ධනය හා සැසඳීමේ දී සියයට 4.8 කින් වර්ධනය විය.** ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වන සාම්ප්‍රදායික වෙළඳපොළ වෙතින් ඇති ඉල්ලුමෙහි වර්ධනය මන්දගාමීවීම, අපනයන අංශය මත බලපෑම් ඇති කරන ලද අතර, එක්සත් ජනපදයෙහි ආර්ථිකය ශක්තිමත් වීම හේතුවෙන් කෙටිකාලීන ප්‍රාග්ධන ප්‍රවාහ පිටතට ගලා යෑම කඩිනම් විය. ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් අඩු වීම හේතුවෙන් මෙම ප්‍රවණතාවන්ගේ බලපෑම තරමක් දුරට සමනය විය. එසේ වුවද, විශේෂයෙන් රාජ්‍ය අංශයේ සේවකයින්ගේ ආදායම් ඉහළ යෑම හේතුවෙන් දේශීය පරිභෝජනය යථා තත්ත්වයට පත් විය. 2015 වසර තුළ දී, කෘෂිකාර්මික හා සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්, පිළිවෙළින්, සියයට 5.5 කින් හා සියයට 5.3 කින් වර්ධනය වූ අතර, කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් සියයට 3.0 කින් වර්ධනය විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද.) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් ගණනය කරනු ලබන උද්ධමනය ප්‍රධාන වශයෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් අඩු වීම හේතු කොටගෙන 2015 ජූලි-සැප්තැම්බර් අතර කාලයේ දී සෘණ අගයක් වාර්තා කළේය. මෙය 1995 මාර්තු මාසයෙන් පසුව උද්ධමනය සෘණ අගයක් ගත් ප්‍රථම අවස්ථාව විය. කෙසේ වුවද, 2014 වසර අවසානයේ දී සියයට 2.1 ක් වූ මතුපිට උද්ධමනය 2015 වසර අවසානයේ දී සියයට 2.8 ක් ලෙස සටහන් විය. මේ අතර, කො.පා.මි.ද. භාණ්ඩ පැසෙහි බලශක්ති සහ තෝරාගත් ආහාර අයිතමයන් ඉවත් කොට ගණනය කෙරෙන මූලික උද්ධමනය, පෙර වසරේ අනුරූප කාලය පරිච්ඡේදයට සාපේක්ෂව, 2015 පෙබරවාරි මාසයේ දී පැවැති සියයට 0.8 සිට වසර අවසානය වන විට සියයට 4.5 ක් දක්වා ඉහළ ගියේය. මේ සඳහා, ප්‍රධාන වශයෙන් හේතු වූයේ, බැංකු විසින් සපයන ලද ණය වර්ධනය ඉහළ යෑම සහ රාජ්‍ය අංශයෙහි සහ ආර්ථිකයෙහි අනෙකුත් අංශවල සේවකයන්ගේ වැටුප් ඉහළ යෑමයි. මේ අතර, අඩු ඉන්ධන මිල ගණන් හා අඛණ්ඩව වර්ධනය වන සංචාරක අංශය තුළින් ඉහළ ප්‍රතිලාභ ලැබුණ ද, විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ ඇතුළුව ශුද්ධ විදේශ මූල්‍ය ප්‍රවාහ ලැබීම් මන්දගාමී වීම හා ප්‍රාග්ධන ප්‍රවාහ ආපසු ගලා යෑම් හේතුවෙන් ගෙවුම් ශේෂයේ හිඟයක් වාර්තා විය. රජයේ බදු සහ බදු නොවන ආදායම් අඩු වීමේ ප්‍රවණතාව වළක්වා ගැනීමට දරන ලද ප්‍රයත්නය තරමක් දුරට සාර්ථක වූ නමුත්, රාජ්‍ය අයවැයෙහි වියදම් විශාල ලෙස ඉහළ යෑම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.4 ක් වූ ඉලක්කගත අයවැය හිඟය, සියයට 7.4 ක් දක්වා ඉහළ යෑමට හේතු විය. 2015 වසර අවසානයේ දී මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 76.0 දක්වා ඉහළ ගියේය. 2015 වසරේ ජනාධිපතිවරණයෙන් පසු පිහිටුවන ලද ඒකාබද්ධ රජය එම වසරේ අගෝස්තු මස පැවැත්වූ මහ

**1.1 සංඛ්‍යා සටහන** **සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2011-2015)**

| දර්ශකය | ඒකකය | 2011 | 2012 | 2013 | 2014(අ) | 2015(ආ) |
|---|---|---|---|---|---|---|
| **මූර්ත අංශය සහ උද්ධමනය** | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය (ඇ) | සියයට | 8.4 | 9.1 | 3.4 | 4.9(ආ) | 4.8 |
| වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (ඇ) | රුපියල් බිලියන | 7,219 | 8,732 | 9,592 | 10,448(ආ) | 11,183 |
| ඒක පුද්ගල ද.දේ.නි. (ඇ) | එ.ජ.ඩොලර් | 3,129 | 3,351 | 3,610 | 3,853(ආ) | 3,924 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (ඈ) | සියයට | 6.7 | 7.6 | 6.9 | 3.3 | 0.9 |
| **විදේශීය අංශය** | | | | | | |
| වෙළඳ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -14.9 | -13.8 | -10.2 | -10.4 | -10.2 |
| ජංගම ගිණුමේ ශේෂය (ඇ) | ද.දේ.නි.යේ % වශයෙන් | -7.1 | -5.8 | -3.4 | -2.5 | -2.4 |
| සමස්ත ශේෂය | එ.ජ.ඩොලර් මිලියන | -1,059 | 151 | 985 | 1,369 | -1,489 |
| විදේශීය නිල සංචිත | එ.ජ.ඩොලර් මිලියන | 6,749 | 7,106 | 7,495 | 8,208 | 7,304 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඇ)** | | | | | | |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -0.8 | -0.9 | -0.7 | -1.2 | -2.2 |
| සමස්ත අය වැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -6.2 | -5.6 | -5.4 | -5.7 | -7.4 |
| මධ්‍යම රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 71.1 | 68.7 | 70.8 | 70.7 | 76.0 |
| **මුදල් අංශය (ඉ)** | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) | සියයට | 19.1 | 17.6 | 16.7 | 13.4 | 17.8 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය ($M_{2b}$ හි) | සියයට | 34.5 | 17.6 | 7.5 | 8.8 | 25.1 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඈ) කො.පා.මි. දර්ශකය (2006/07=100) මත පදනම් වේ.
(ඉ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

මැතිවරණයට පෙර කාලයේ දී දින සියයේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. 2015 අගෝස්තු මාසයේ දී පැවැති මහ මැතිවරණයෙන් පසු වෙනස් වන ගෝලීය ආර්ථික තත්ත්ව හමුවේ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර දැක්වීම සඳහා සැලකිය යුතු කාලයක් ගත විය. ඉහළ යමින් පැවැති ඉල්ලුම් පීඩන තුළින් මිල මට්ටම සහ මූල්‍ය ස්ථායීතාව කෙරෙහි ඇති වන අහිතකර බලපෑම් වැළැක්වීමට මෙන්ම, ගෙවුම් තුලනය මත ඇති වන පීඩනය සමනය කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිසිකලට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. විනිමය අනුපාතික කළමනාකරණය කිරීමේ දී වඩාත් නම්‍යශීලී පිළිවෙතක් අනුගමනය කිරීම, ඉල්ලුම කළමනාකරණ උපකරණයක් ලෙස සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ගයක් වන වටිනාකම් මත උපරිම ණය අනුපාතය පැනවීම සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ඉහළ නැංවීම මෙන්ම, පසුකාලීනව මහ බැංකුවෙහි ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම තුළින් දැඩි මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම යනාදිය මෙසේ ගන්නා ලද ක්‍රියාමාර්ග විය. අපනයන මූලික කරගත් ආර්ථික වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම සහ ඉහළ යන රජයේ ණය පාලනය කිරීමට හැකි වන පරිදි රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීම, රජයේ මැදිකාලීන ආර්ථික ක්‍රමෝපායේ ප්‍රධාන අරමුණු වන අතර, මේ සඳහා රජය විසින් යෝජනා කර ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ද අනුමත කරනු ඇතැයි අපේක්ෂිතය.

**යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය මැදි කාලයේ දී නැවතත් ඉහළ වර්ධන මාවතකට ප්‍රවේශ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මැදි කාලීනව තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පහළ මට්ටමක පැවැතීම හා අධික රාජ්‍ය වියදම, අපනයන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අඩු වීම සහ විදේශ සෘජු ආයෝජන ගලා ඒම ප්‍රමාණවත් නොවීම යනාදිය ඇතුළුව දැනටමත් හඳුනා ගෙන ඇති ආර්ථිකය මුහුණදෙනු ලබන ගැටලු විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. මීට අමතරව, රජයේ අවධානය යොමු විය යුතු අනෙකුත් ව්‍යුහාත්මක සහ පැනනැගෙමින් පවතින ගැටලු ගණනාවක් ඇත. ඒ අතර, ඉහළ ගුණාත්මක බවින් යුතු මානව ප්‍රාග්ධනය සඳහා වර්ධනය වන ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය කරනු ලබන නිපුණතා සංවර්ධනය කිරීම සඳහා වඩාත් කාර්යක්ෂම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම; රථවාහන තදබදය හේතුවෙන් ඇතිවන ආර්ථිකයට සිදුවන හානිය අවම කිරීම සඳහා පොදු ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම; පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම සහ

**1.1 රූප සටහන** **කාර්තුමය පදනම මත මූර්ත ද.දේ.නි. යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය**




බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම, බලශක්තිය හා මහජන උපයෝගීතා සේවා සඳහා වෙළඳපොළ පාදක කරගත් ක්‍රමවත් මිල සූත්‍ර හඳුන්වා දීම; අඩු ඵලදායීතාව, විවිධාංගීකරණය අඩු වීම, ආහාර අනාරක්ෂිතතාව සහ අකාර්යක්ෂම ජල කළමනාකරණය ආදී කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි ගැටලු සඳහා පිළියම් ලබා දීම; රාජ්‍ය සම්පත්වල පවතින සීමිත බව සැලකිල්ලට ගනිමින් සමාජ යටිතල පහසුකම් සැපයීම හා ආකර්ෂණීය ජීවනෝපාය මාර්ග සැලසීම; සමස්ත ශ්‍රම බලකාය ආවරණය වන පරිදි වෙළඳපොළ මූලික කරගත් විශ්‍රාම වැටුප් ක්‍රම හා විශ්‍රාම පාරිතෝෂික ක්‍රමයක් හඳුන්වා දෙමින් රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුපෙහි තිරසාර බව සහතික කිරීම; මූල්‍ය අතරමැදිකරණයෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, විවිධාකාර මූල්‍ය උපකරණ හා සේවා හඳුන්වා දීම, විධිමත් මූල්‍ය කටයුතු සඳහා වන ප්‍රවේශයන් වර්ධනය කිරීම මෙන්ම මැදි හා දිගුකාලීනව ශක්තිමත් ආර්ථික වර්ධන මාවතක් පවත්වා ගැනීම සඳහා දේශීය හා විදේශීය අංශ සඳහා ආරක්ෂණ ප්‍රතිපත්ති ගොඩනැගීම තුළින් මූල්‍ය අංශයේ කටයුතු පුළුල්වීම සඳහා ඉඩ සලසා දීම යනාදිය ප්‍රමුඛ වේ.

## 1.2 2015 වසරේ සාර්ව ආර්ථික වර්ධනයන්, ස්ථායීතාව සහ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර

### මූර්ත අංශයේ වර්ධනයන් සහ උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 2015 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය, 2014 වසරේ වාර්තා කළ සියයට 4.9 ට සාපේක්ෂව සියයට 4.8 කින් මූර්ත වශයෙන් වර්ධනය විය[1]. මූල්‍ය සේවාවන් (සියයට 15.8), නිශ්චල දේපළ කටයුතු (සියයට 9.6), ප්‍රවාහන කටයුතු (සියයට 5.5) හා තොග හා සිල්ලර වෙළඳාම (සියයට 4.7) යනාදී අංශයන්ගේ වර්ධනයත් සමඟ ද.දේ.නි.යෙන් සියයට 56.6 කට පමණ දායක වන සේවා අංශය සියයට 5.3 කින් වර්ධනය විය. ඉදිකිරීම් කටයුතු (සියයට -0.9) හා පතල් සහ කැණීම් කටයුතුවල (සියයට -0.9) සුළු පසුබෑම මධ්‍යයේ ප්‍රධාන වශයෙන්ම නිෂ්පාදන කටයුතුවල (සියයට 4.7) වර්ධනය හේතුවෙන් ද.දේ.නි.යෙන් සියයට 26.2 කට පමණ දායක වන කාර්මික කටයුතු, සියයට 3.0 කින් වර්ධනය විය. ධීවර කර්මාන්තය (සියයට -2.7), රබර් වගාව (සියයට -10.1) සහ තේ වගාව (සියයට -2.6) යන අංශයන්හි පහළ යෑම මධ්‍යයේ වුවද වී (සියයට 23.3) හා එළවළු (සියයට 24.9) වගාවන්හි සැලකිය යුතු වර්ධනය හේතුවෙන්, ද.දේ.නි.යෙන් සියයට 7.9 කට දායක වන කෘෂිකාර්මික කටයුතු සියයට 5.5 කින් ප්‍රසාරණය විය.

වියදම් ප්‍රවේශය යටතේ, 2015 වසරේ මූර්ත ද.දේ.නි.යෙහි වර්ධනය වැඩි වශයෙන් ම පාරිභෝජන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් සිදු වූ අතර ආයෝජන කටයුතු ද.දේ.නි.යට සුළු දායකත්වයක් දැක්වීය. 2015 වසරේ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් හා වේතනවල ඉහළ යෑම පිළිබිඹු කරමින් රාජ්‍ය අංශයේ පාරිභෝජන වියදම් ඉහළ වේගයකින් වර්ධනය විය.


1 2015 ජූලි මාසයේ දී, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් සංඛ්‍යාලේඛනවල පාදක වර්ෂය 2002 සිට 2010 දක්වා වෙනස් කරන ලද අතර එක්සත් ජාතීන්ගේ ජාතික ගිණුම් පද්ධතිය-2008 ප්‍රමිතිය පිළිගන්නා ලදී. මෙම වැඩිදියුණු වූ සම්පාදන ක්‍රමය පසුගිය දශකයේ ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සිදු වූ ව්‍යුහමය වෙනස්වීම් ග්‍රහණය කරන අතර ජාතික ගිණුම් පද්ධතියට නව ආර්ථික කටයුතු ද හඳුන්වා දෙයි. පදනම් වර්ෂය වෙනස් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු සාර්ව ආර්ථික දර්ශකයන්ට විවිධාකාරයෙන් බලපාන ලදී. මෙම වාර්තාවේ, 2015 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ විශ්ලේෂණයන් අලුත් ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වන අතර ඒවා තාවකාලික ඇස්තමේන්තු වේ.

ප්‍රධාන වශයෙන්ම පොලී අනුපාතික අඩු මට්ටමක පැවැතීම සහ මූර්ත වැටුප් ඉහළ යෑම හේතුවෙන් පෞද්ගලික පාරිභෝජන වියදම වසර තුළ දී වර්ධනය විය. කෙසේ වුවද, දළ ප්‍රාග්ධන සම්පාදනය මගින් මනිනු ලබන ආයෝජන කටයුතු 2015 වසර තුළ දී මන්දගාමී විය. මේ අතර, ප්‍රධාන වශයෙන්ම පාරිභෝගික භාණ්ඩ ආනයන ඉල්ලුම ඉහළ යෑමත්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තවල දුර්වල ඉල්ලුමත් යන දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස වසර තුළ දී ශුද්ධ විදේශීය ඉල්ලුම මූර්ත වශයෙන් අඩු විය.

**2015 වසරේ දී දේශීය ඉතුරුම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ වාර්තා වූ සියයට 24.0 සිට සියයට 22.6 ක් දක්වා පහළ ගියේය.** පෞද්ගලික ඉතුරුම් බොහෝසෙයින් නොවෙනස්ව පැවැති බැවින් අපේක්ෂිත ප්‍රමාණයට වඩා රජයේ ආදායම් අඩුවීමත් සමඟම පුනරාවර්තන වියදම අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වීම හේතුවෙන් රාජ්‍ය නිර්-ඉතුරුම් ඉහළ යෑම, වසර තුළ දේශීය ඉතුරුම් පිරිහීමට හේතු විය. මේ සමඟම, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල රුපියල් වටිනාකම, සුළු වශයෙන් ඉහළ ගිය ද, විදේශීය ශුද්ධ සාධක ආදායම් පිරිහීමත් සමඟ ආයෝජන ඉපැයීම් පහළ යෑම හා විදේශ විනිමය ගලා යෑම් ඉහළ යෑම 2015 වසර තුළ දී ජාතික ඉතුරුම්වලට අහිතකර ලෙස බලපෑවේය. මේ අනුව, ජාතික ඉතුරුම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ වූ සියයට 29.5 සිට 2015 වසරේ දී සියයට 27.8 දක්වා පහළ ගියේය. මේ අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආයෝජනවල පහළ යෑම ජාතික ඉතුරුම්වල පහළ යෑමට වඩා වැඩි වීම හේතුවෙන් ඉතුරුම් ආයෝජන පරතරය 2015 වසරේ දී පටු විය.

**2015 වසරේ දී කෘෂිකර්මය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධන ප්‍රවණතාව වේගවත් වූ අතර, ද.දේ.නි.ට වන දායකත්වය සියයට 7.9 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.**

**1.2 රූප සටහන** — **ඉතිරිකිරීම් හා ආයෝජන (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




කෘෂි, වන වගා සහ ධීවර කර්මාන්ත කටයුතුවල එකතු කළ අගය පෙර වසරේ දී වාර්තා කළ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.5 කින් වර්ධනය විය. වී වගා අංශයේ ඇති වූ සියයට 23.3 ක ඉහළ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2014 වසර තුළ දී අහිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් දැඩි ලෙස බලපෑමට ලක් වූ වී නිෂ්පාදනය, හිතකර කාලගුණික තත්ත්වයන් හා වී ගැනුම් මිල ඉහළ යෑම හේතුවෙන් 2014/15 මහ කන්නයේ දී හා 2015 යල කන්නයේ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය. පෙර වසර හා සැසඳීමේ දී යහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් 2015 වසරේ දී පොල් (සියයට 5.1), පලතුරු (සියයට 16.5) හා එළවළු (සියයට 24.9) යන උප අංශයන් ඇතුළත්ව අනෙකුත් ප්‍රධාන උප අංශ කිහිපයක එකතු කළ අගය වර්ධනය විය. කෙසේ වුවද, සැපයුම් අංශයේ සාධකවල බලපෑම මෙන්ම ප්‍රධාන අපනයන ගමනාන්තවලින් වූ ඉල්ලුම අඩු වීම ඇතුළුව ඉල්ලුම් තත්ත්වයන් කෙරෙහි ප්‍රතිචාර දක්වමින් තේ උප අංශය අඛණ්ඩව දෙවන වසරටත් සියයට 2.6 කින් පහළ ගියේය. ලෝක වෙළඳපොළ රබර් මිල ගණන් අඩුවීමට ප්‍රතිචාර දක්වමින් කුඩා වතු හිමියන්ගේ රබර් කිරි කැපීමේ කටයුතු මන්දගාමීව සිදු වූ අතර ඒ හේතුවෙන් රබර් වගා අංශය ද සියයට 10.1 කින් පහළ ගියේය. ඊට වෙනස්ව යමින් කිරි සඳහා සතුටුදායක නිෂ්පාදන මිල ගණන් පැවැතීම හා කර්මාන්තශාලාවල නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම හේතුවෙන්, කිරි නිෂ්පාදනය ඉහළ යෑමත් සමඟ 2015 වසරේ දී සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම් ද වර්ධනය විය. කෙසේ වුවද, මිරිදිය හා මුහුදු මත්ස්‍ය අංශයන්ගේ නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් ධීවර අංශයේ අගය එකතු කිරීම පහළ යන ලදී.

**2015 වසරේ දී රජය විසින් හඳුන්වා දෙන ලද ක්‍රියාමාර්ග කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීමට දායක විය.** වී සහ කිරි සඳහා වූ ගැනුම් මිල ඉහළ නැංවීම එම අංශවල නිෂ්පාදනය ඉහළ නැංවීමට උපකාරී විය. තේ, රබර් හා පොල් අංශවල ඵලදායිතාව ඉහළ නැංවීමේ අරමුණින් නැවත වගාව හා නව වගාව දිරිගැන්වීම සඳහා සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් හොඳම සාමාන්‍ය තේ දළු ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා "B Leaf 60" වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ගුණාත්මක බවින් යුතු තේ දළු සපයන කුඩා තේ වතු හිමියන් වෙනුවෙන් 2015 මාර්තු මස සිට සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. තවද, තේ කර්මාන්තශාලා හිමියන් මුහුණ දෙන මූල්‍යමය අපහසුතා මගහරවා ගැනීමේ අරමුණින් රජය විසින් කෙටිකාලීන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයක්

**1.2 සංඛ්‍යා සටහන** **සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් - ආයෝජන පරතරය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)**

| ශීර්ෂය | රුපියල් බිලියන | | වර්ධනය % | | ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 | 2014 | 2015 |
| **1. දේශීය ඉල්ලුම** | **11,285.0** | **12,013.7** | **8.3** | **6.5** | **108.0** | **107.4** |
| 1.1 පරිභෝජනය | 7,943.8 | 8,652.2 | 9.9 | 8.9 | 76.0 | 77.4 |
| පෞද්ගලික | 7,074.7 | 7,666.4 | 9.1 | 8.4 | 67.7 | 68.6 |
| රාජ්‍ය | 869.1 | 985.8 | 16.6 | 13.4 | 8.3 | 8.8 |
| 1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) | 3,341.2 | 3,361.5 | 4.8 | 0.6 | 32.0 | 30.1 |
| **2. ශුද්ධ බාහිර ඉල්ලුම** | **-836.5** | **-830.5** | **-1.2** | **0.7** | **-8.0** | **-7.4** |
| භාණ්ඩ හා සේවා අපනයන | 2,185.0 | 2,295.4 | 12.1 | 5.1 | 20.9 | 20.5 |
| භාණ්ඩ හා සේවා ආනයන | 3,021.5 | 3,125.9 | 8.9 | 3.5 | 28.9 | 28.0 |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි) (1+2)** | **10,448.5** | **11,183.2** | **8.9** | **7.0** | **100.0** | **100.0** |
| **4. දේශිය ඉතිරිකිරීම් (3-1.1)** | **2,504.7** | **2,531.0** | **6.0** | **1.1** | **24.0** | **22.6** |
| පෞද්ගලික | 2,632.4 | 2,777.8 | 8.3 | 5.5 | 25.2 | 24.8 |
| රාජ්‍ය | -127.7 | -246.8 | -88.5 | -93.3 | -1.2 | -2.2 |
| **5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඇ)** | **-236.7** | **-251.3** | **-4.7** | **-6.2** | **-2.3** | **-2.2** |
| **6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඇ)** | **813.1** | **833.5** | **11.6** | **2.5** | **7.8** | **7.5** |
| **7. ජාතික ඉතිරිකිරීම් (4+5+6)** | **3,081.1** | **3,113.2** | **7.5** | **1.0** | **29.5** | **27.8** |
| **8. ඉතිරිකිරීම් ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම් - ආයෝජන (4-1.2) | -836.5 | -830.5 | | | -8.0 | -7.4 |
| ජාතික ඉතිරිකිරීම් - ආයෝජන (7-1.2) | -260.0 | -248.3 | | | -2.5 | -2.2 |
| **9. විදේශීය ජංගම ගිණුම් ශේෂය (2+5+6) (ඇ)** | **-260.0** | **-248.3** | | | **-2.5** | **-2.2** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයන්වලින් වෙනස් වනුයේ ගණනය කිරීමේ දී ඇති වන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ක්‍රියාත්මක කරන ලද අතර, මෙම යෝජනා ක්‍රමය සඳහා මහ බැංකුව විසින් සියයට 2 ක පොලී සහනාධාරයක් ලබාදෙන ලදී. 2015 වසරේ දී ශ්‍රී ලංකාවේ සමස්ත මත්ස්‍ය අපනයනය සඳහා බලපෑ යුරෝපා සංගමයේ රටවල් වෙත මසුන් අපනයනය කිරීමට පනවා ඇති තහනම ඉවත් කර ගැනීම සඳහා, යුරෝපා කොමිසම විසින් පනවන ලද ප්‍රමිතීන් සපුරාලීමට ප්‍රයත්න දරන ලදී. 2016 වසර සඳහා වූ අයවැයෙන් යෝජිත කෘෂිකාර්මික ප්‍රතිපත්ති මගින් භෝග විවිධාංගීකරණය හා ඵලදායීතාව ඉහළ නැංවීම තුළින් ශ්‍රී ලංකාව අත්‍යවශ්‍ය භෝගවලින් ස්වයංපෝෂිත කිරීමටත්, අපනයන වෙළඳපොළට පිවිසීමේ හැකියාවත් සමඟ යැපුම් කෘෂිකර්මයේ සිට කෘෂි නිෂ්පාදන ව්‍යාපාර පදනම් කරගත් ආර්ථිකයක් දක්වා ගමන් කිරීම සැලසුම් කිරීමටත් ඉලක්ක කරන ලදී. ඒ අනුව, අයවැය මගින් වී, බඩඉරිඟු, තල, ගම්මිරිස් හා උඳු ආදී ධාන්‍ය ගබඩා කිරීමට නවීන තාක්ෂණික ක්‍රමවේදයන්ගෙන් සමන්විත ගබඩා පහසුකම් සහ එළවළු සහ පලතුරු සඳහා ශීත ගබඩා පහසුකම් ඇති කිරීම, දේශීය ධීවර වරායන් සංවර්ධනය කිරීම, කෘෂි, පශු සම්පත් හා මත්ස්‍ය සැකසුම් කලාපයක් ඉදිකිරීම මෙන්ම කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ආදිය සඳහා වන බදු ඉවත් කිරීම යනාදිය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් යෝජනා විය. කෘෂිකාර්මික යෙදවුම් වඩා නම්‍යශීලී ලෙස තෝරා ගැනීමට ගොවීන්ට අවස්ථාව ලබා දෙමින් මෙතෙක් ලබාදුන් පොහොර සහනාධාරය වෙනුවට සහනාධාරයක් ලෙස මුදල් ප්‍රදානයක් ලබා දීම සඳහා මූලික පියවර ගෙන ඇත. මේ අතර, වගා කටයුතු සඳහා අධික විෂ සහිත කෘෂි රසායන භාවිතය වැළැක්වීම අරමුණු කරගෙන 2016 මාර්තු මස මුල් කාලයේ දී "යහපත් කෘෂිකර්මාන්තයක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක් - වස විස නැති රටක්" යන තේමාව යටතේ තුන් අවුරුදු ජාතික වැඩ සටහනක් දියත් කරන ලදී. තවද, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන, ගෝලීය තරගකාරී මට්ටමක පවත්වා ගැනීම සඳහා කෘෂිකර්ම සංවර්ධන මහා කලාප 23 ක් පිහිටුවීමට යෝජනා කර ඇත. බස්නාහිර පළාතේ මහානගර

**1.3 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2010) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)**

| ආර්ථික කටයුතු | වටිනාකම (රු. මිලියන) | | ද.දේ.නි. ට දායකත්වය % | | වෙනස්වීමේ අනුපාතිකය % | | වෙනස්වීමට දායකත්වය % | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014(ඇ) | 2015 | 2014(ඇ) | 2015 | 2014(ඇ) | 2015 | 2014(ඇ) | 2015 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **641,493** | **676,899** | **7.8** | **7.9** | **4.9** | **5.5** | **7.8** | **9.0** |
| කෘෂිකර්මාන්තය සහ වන වගාව | 520,835 | 559,445 | 6.3 | 6.5 | 5.1 | 7.4 | 6.7 | 9.8 |
| ධීවර කර්මාන්තය | 120,658 | 117,453 | 1.5 | 1.4 | 3.7 | -2.7 | 1.1 | -0.8 |
| **කර්මාන්ත** | **2,194,167** | **2,259,223** | **26.7** | **26.2** | **3.5** | **3.0** | **19.6** | **16.5** |
| පතල් සහ කැණීම් කර්මාන්ත | 202,905 | 201,036 | 2.5 | 2.3 | 2.2 | -0.9 | 1.2 | -0.5 |
| නිෂ්පාදන කර්මාන්ත | 1,292,994 | 1,354,083 | 15.7 | 15.7 | 2.3 | 4.7 | 7.6 | 15.5 |
| විදුලිය, ගෑස්, ජලය සහ කසළ කළමණාකරණය | 108,157 | 119,105 | 1.3 | 1.4 | 4.7 | 10.1 | 1.3 | 2.8 |
| ඉදිකිරීම් | 590,111 | 584,999 | 7.2 | 6.8 | 6.6 | -0.9 | 9.6 | -1.3 |
| **සේවාවන්** | **4,634,805** | **4,881,273** | **56.3** | **56.6** | **5.2** | **5.3** | **59.9** | **62.6** |
| වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 1,914,236 | 2,002,655 | 23.3 | 23.2 | 4.0 | 4.6 | 19.3 | 22.5 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 44,102 | 49,613 | 0.5 | 0.6 | 11.6 | 12.5 | 1.2 | 1.4 |
| මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 945,090 | 1,061,757 | 11.5 | 12.3 | 8.1 | 12.3 | 18.6 | 29.6 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 1,007,434 | 1,020,397 | 12.2 | 11.8 | 4.3 | 1.3 | 11.0 | 3.3 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 723,943 | 746,852 | 8.8 | 8.7 | 5.5 | 3.2 | 9.8 | 5.8 |
| **මූලික මිලගණන් අනුව සමස්ත එකතුකළ අගය** | **7,470,465** | **7,817,394** | **90.8** | **90.7** | **4.7** | **4.6** | **87.3** | **88.1** |
| භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර | 758,521 | 805,431 | 9.2 | 9.3 | 6.9 | 6.2 | 12.7 | 11.9 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | **8,228,986** | **8,622,825** | **100.0** | **100.0** | **4.9** | **4.8** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | -189,495 | -196,496 | | | -2.9 | -3.7 | | |
| **වෙළඳපොළ මිල යටතේ දළ ජාතික ආදායම** | **8,039,492** | **8,426,330** | | | **4.9** | **4.8** | | |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සංවර්ධන ව්‍යාපෘතියේ කොටසක් ලෙස වැවිලි නගරය හා වනාන්තර නගරය ඇතුළත්ව සැලසුම්ගත ප්‍රදේශ 13 ක් ඉදිකිරීමට ද යෝජනා වී ඇත.

**2015 වසරේ දී කාර්මික අංශයේ වර්ධනය සියයට 3 ක අඩු අගයක පැවැති අතර ද.දේ.නි. ට එහි දායකත්වය සියයට 26.2 දක්වා සුළු වශයෙන් අඩු විය.** කර්මාන්ත අංශයේ මන්දගාමී වර්ධනයට, ඉදිකිරීම් අංශය සහ පතල් හා කැණීම් කටයුතුවල පහළ යෑම විශාල ලෙස දායක විය. කෙසේ වෙතත්, ආහාර හා පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත යන නිෂ්පාදනවල ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන කර්මාන්ත අංශයේ ප්‍රධානතම සංරචකය වන නිෂ්පාදන ක්‍රියාකාරකම් සියයට 4.7 කින් ප්‍රසාරණය වෙමින් කර්මාන්ත අංශයේ වර්ධනයට දායක විය. මෙයට අමතරව, නිෂ්පාදන කර්මාන්තයෙහි වර්ධන ප්‍රවණතාව සඳහා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, ලෝහ හා ලෝහ ආශ්‍රිත නිෂ්පාදිත සහ ගෘහභාණ්ඩ නිෂ්පාදනය කිරීම් ද දායක විය. මේ අතර, විදුලිය, ජලය සහ කසළ කළමනාකරණ ද කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනය සඳහා ධනාත්මකව දායක විය. 2015 වසර තුළ දී රෙදිපිළි, ඇගලුම් නිෂ්පාදන සහ සම් ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාකාරකම්වල එකතු කළ අගයෙහි කිසිදු වර්ධනයක් වාර්තා නොවීය.


**රාජ්‍ය මූල්‍ය සහන ලබා දීම, තාක්ෂණික සහාය ලබා දීම සහ ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන කටයුතු වර්ධනය කිරීම සඳහා යටිතල පහසුකම් ඉහළ දැමීම හරහා කර්මාන්ත සංවර්ධනය සඳහා වූ රජයේ දිරිගැන්වීම් අඛණ්ඩව ක්‍රියාත්මක විය.** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඇති අතර, දිස්ත්‍රික්ක 20 ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුමක් ද සකසන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට

ණය ලබා දීම ඉහළ දැමීමට වාණිජ බැංකු දිරිමත් කිරීමට මූලික පියවර ගන්නා ලදී. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රාදේශීය කාර්මික සංවර්ධන වැඩසටහන යටතේ පසුබෑමකට ලක් වූ ප්‍රදේශවල, විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි කාර්මික ජනපද සංවර්ධනය හා වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු කෙරුණි. ඒ අනුව, දිස්ත්‍රික්ක කිහිපයක පැතිරෙන පරිදි විශේෂ ආර්ථික කලාප ලෙස වෙනත් කාර්මික නගර කිහිපයක් සංවර්ධනය කිරීමට ද සැලසුම් කර ඇත. පුළුල් රාජ්‍ය අරමුණුවලට සමගාමීව, බස්නාහිර පළාත් මහානගර සැලසුම යටතේ, දැනුම පාදක කර ගත් නවෝත්පාදනවලින් මෙහෙයවනු ලැබූ ආර්ථිකයක් කරා ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීමට හැකි වන ලෙස විද්‍යා හා තාක්ෂණ නගරයක් සංවර්ධනය කිරීම යෝජනා වී තිබේ. රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම්, මධ්‍යකාලීනව ක්ෂුද්‍ර ආයතන සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රසාරණය ධෛර්යමත් කරන අතරම, එකතු කළ අගය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළ දැමීම, පරිසර හිතකාමී නිෂ්පාදිත ඉහළ දැමීම, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැනි දැනුම පාදක කරගත් අංශයන් ඉහළ දැමීම යනාදිය ඉලක්ක කර තිබුණි.

**ද.දේ.නි.යෙන් සියයට 56.6 කට දායක වන සේවා අංශය එකතු කළ අගය පදනම මත 2014 වසරේ දී වාර්තා කළ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව 2015 වසරේ දී සියයට 5.3 කින් වර්ධනය විය.** ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තුළින් ප්‍රතිලාභ ලද මූල්‍ය සේවා ක්‍රියාකාරකම්වල සියයට 15.8 ක් වූ ඉහළ වර්ධනය සේවා අංශයේ වර්ධනයට විශාල වශයෙන් දායක විය. මේ අතර, තොග වෙළඳාම හා සිල්ලර වෙළඳාම සහ ප්‍රවාහන ක්‍රියාකාරකම් යන ප්‍රධාන සේවා අංශ දෙක පිළිවෙලින් සියයට 4.7 කින් සහ සියයට 5.5 කින් වර්ධනය විය. එපමණක් නොව, 2015 වසර තුළ දී තොරතුරු තාක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය, නිවාස අයිතිය සහ රක්ෂණ සේවා ඇතුළු නිශ්චල දේපළ ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස වර්ධනය වීම සේවා අංශයේ වර්ධන ප්‍රවණතාවට උපකාරී විය. කෙසේ වෙතත්, අධ්‍යාපන සේවා, වෘත්තීමය සේවා, තැපැල් හා පණිවුඩ ක්‍රියාකාරකම් සහ ඉඳුම් හිටුම්, ආහාර හා පාන වර්ග සේවාවන්හි ඇති වූ පසුබෑම සේවා ක්‍රියාකාරකම්හි සමස්ත වර්ධනයට බලපෑවේය.

**විශේෂයෙන්ම කාන්තාවන්ගේ ශ්‍රම බලකා සහභාගිත්වයේ සුළු වර්ධනය මධ්‍යයේ සේවා වියුක්ති අනුපාතය, 2014 වසරේ වාර්තා කළ සියයට 4.3 හා සැසඳීමේ දී 2015 වසරේ දී සියයට 4.6 දක්වා ඉහළ ගියේය.**


**1.3 රූප සටහන** **වාර්ෂික සේවා වියුක්ති අනුපාතය**




2014 වසර හා සැසඳීමේ දී, 2015 වසරේ දී පුරුෂ සේවා වියුක්ති අනුපාතය සියයට 3.1 සිට සියයට 3.0 දක්වා අඩු වූ අතර කාන්තා සේවා වියුක්ති අනුපාතය සියයට 6.5 සිට සියයට 7.6 දක්වා ඉහළ ගියේය. තරුණයන් හා අ.පො.ස. උසස් පෙළ සහ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත වූවන් අතර විරැකියාව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ශ්‍රම බලකාය තුළ ග්‍රාමීය අංශයේ කාන්තා සහභාගිත්වය ඉහළ යෑමත් සමඟ 2015 වසරේ දී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය, 2014 වසර තුළ දී වූ සියයට 53.3 සිට සියයට 53.8 දක්වා ඉහළ ගියේය. ආර්ථිකයේ අංශ තුනෙහිම ධනාත්මක දායකත්වය සමඟ 2015 වසර තුළ දී ශ්‍රම ඵලදායීතාවය ඉහළ ගියේය. මේ අතර, මැද පෙරදිග භූ-දේශපාලන අවිනිශ්චිතතාව ඉහළ යෑම සහ ආර්ථික ක්‍රියාකාරීත්වයෙහි පසුබෑම හේතුවෙන් විදේශ රැකියා සඳහා රට හැර යන සංඛ්‍යාව සියයට 12.4 කින් තියුණු පසුබෑමකට ලක් විය. මෙය, සේවා වියුක්ති අනුපාතයටත් ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතයටත් බලපාන ලදී.

**ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ කිහිපයක මිල පහත හෙළීම, දේශීය හා විදේශීය වෙළඳපොළවල සැපයුම් අංශයේ පැවැති හිතකර වර්ධනයන් මෙන්ම මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා හේතුවෙන්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/07=100) මත පදනම් වූ උද්ධමනය, මැද තනි අගයක මට්ටමට පහළින් පැවැතුණි.** 2015 අතුරු අයවැයෙන් හඳුන්වා දුන් මිල සංශෝධන සමඟ, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව මනිනු ලබන මතුපිට උද්ධමනය, 2015 ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 3.2 හා සාපේක්ෂව 2015 පෙබරවාරි මාසයේ දී සියයට 0.6 දක්වා ශීඝ්‍ර ලෙස අඩු විය. ඉන්පසු, 2015 සැප්තැම්බර් මාසය වන තුරු, සියයට 1 ට අඩු මට්ටමේ

**1.4 රූප සටහන** වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය




පැවැති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වූ උද්ධමනය, 2015 ජූලි සිට සැප්තැම්බර් දක්වා කාලයේ දී සෘණ අගයක් වාර්තා කළේය. 2015 වසරේ සිව්වන කාර්තුව තුළ ඉහළ යමින් පැවැති උද්ධමනය වසර අවසානය වන විට සියයට 2.8 ක අගයක් වාර්තා කළේය. වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය, 2014 වසර අවසානයේ වාර්තා කළ සියයට 3.3 ට සාපේක්ෂව 2015 වසර අවසානය වන විට සියයට 0.9 දක්වා අඩු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය, 2014 වසර අවසානයේ වාර්තා කළ සියයට 3.5 ට සාපේක්ෂව 2015 වසර අවසානය වන විට සියයට 3.1 දක්වා අඩු වුවද, ආර්ථිකයේ ක්‍රමයෙන් වර්ධනය වන ඉල්ලුම් පීඩන පිළිබිඹු කරමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පදනම් වූ මූලික උද්ධමනය, 2014 වසර අවසානයේ වාර්තා කළ සියයට 3.2 සිට 2015 වසර අවසානය වන විට සියයට 4.5 දක්වා ඉහළ ගියේය. මේ අතර, 2015 වසරේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද. 2013=100) හඳුන්වා දෙනු ලැබූ අතර එමගින් ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2012/13 මත පදනම්ව සියලු පළාත්වල මිල උච්චාවචන සහ පාරිභෝජන රටාවල වෙනස්කම් ආවරණය කරනු ලබයි. 2015 වසර අවසානයේ, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය සියයට 4.2 ක් වූ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 3.8 ක් විය. විශේෂයෙන්ම, රාජ්‍ය අංශයේ වැටුප් අනුපාත දර්ශකයෙහි වෙනස මගින් පිළිබිඹු වන පරිදි රාජ්‍ය අංශයේ වැටුප් උද්ධමනය ඉහළ මට්ටමක පැවැතුණ අතර 2015 වසර තුළ දී රාජ්‍ය අංශයේ වැටුප් අනුපාත දර්ශකය නාමික වශයෙන් සියයට 31.7 ක් ද, මූර්ත වශයෙන් සියයට 27.0 ක් ද විය.

## විදේශීය අංශයේ වර්ධනයන්

**ගෝලීය ආර්ථික වාතාවරණය වෙනස්වීමේ බලපෑම මෙන්ම දේශීය ආර්ථිකයේ වර්ධනයන් රාශියක් ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය මගින් පිළිබිඹු විය.** ඛනිජතෙල් ආනයන වියදම අඩු වීමේ ප්‍රතිලාභය තිබියදීත් ඉන්ධන නොවන ආනයන වර්ධනය වීම සහ අපනයන ආදායම් අඩු වීම පිළිබිඹු කරමින් වෙළඳ හිඟය පෙර වසරට සාපේක්ෂව සියයට 1.7 කින් සුළු වශයෙන් පුළුල් විය. සංචාරක පැමිණීම් අඛණ්ඩව වර්ධනය වීම සහ සංචාරකයින්ගේ වියදම් වර්ධනය වීම හේතුවෙන් සංචාරක ඉපැයීම් වර්ධනය වූ අතර, වසර තුළ දී සේවා ගිණුමෙහි ක්‍රියාකාරිත්වය වර්ධනය වීමට මෙය විශාල ලෙස දායක විය. 2015 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් විය. කෙසේ වුවද, ද්විතීයික ආදායම් සහ සේවා ගිණුම්වල අතිරික්තයන්, විදේශීය ජංගම ගිණුමේ ඉහළ හිඟය අවම කිරීමට උපකාරී විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 2014 වසරේ පැවැති සියයට 2.5 හි සිට 2015 වසරේ දී සියයට 2.4 දක්වා සුළු වශයෙන් අඩු වුවද, නිරපේක්ෂ වශයෙන් එය සුළු වශයෙන් වර්ධනය විය. ජංගම ගිණුමෙහි පැවැති මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වය සමඟ රජය, බැංකු හා පෞද්ගලික අංශ වෙත ලැබුණු ණය හා සෘජු විදේශීය ආයෝජන අඩු වීම සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම් ආකාරයට මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු වීම හේතුවෙන් ගෙවුම් තුලනයෙහි එ.ජ.ඩොලර් මිලියන 1,489 ක හිඟයක් වාර්තා විය. ගෙවුම් තුලනයේ පිරිහීමත් සමඟ රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය 2014 වසරේ අවසානයේ පැවැති එ.ජ.ඩොලර් බිලියන 8.2 හි සිට 2015 වසර අවසානය වනවිට එ.ජ.ඩොලර් බිලියන 7.3 ක් දක්වා අඩු විය. මේ අතර, වසරේ පළමු මාස අට තුළ දී බොහෝ සෙයින් ස්ථායීව පැවැති රුපියලෙහි අගය, විනිමය අනුපාතය නිර්ණය කිරීමේ දී වෙළඳපොළ බලවේග අනුව ඉහළ නම්‍යශීලීතාවයක් ඇති කිරීමට මහ බැංකුව ගත් තීරණයත් සමඟ සැප්තැම්බර් මස මුල සිට ශීඝ්‍රයෙන් අවප්‍රමාණය විය. මේ අනුව, 2015 වසර අවසානය වන විට, එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 9.03 ක අවප්‍රමාණයක් වාර්තා කළේය.

**2015 වසරේ දී වෙළඳ ගිණුමෙහි හිඟය නාමික වශයෙන් සියයට 1.7 කින් පුළුල් වුවද ද.දේ.නියේ ප්‍රතිශතයක් ලෙස එය සුළු වශයෙන් අඩුවිය.** ආනයන වියදම මන්දගාමී වුවද අපනයන ආදායම විශාල ලෙස අඩු වීම 2015 වසරේ දී වෙළඳ හිඟය පුළුල් වීමට හේතු විය. මේ අනුව, වෙළඳ හිඟය 2014 වසරේ පැවැති එ.ජ.ඩොලර් මිලියන 8,287 හි සිට 2015 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 8,430 දක්වා වර්ධනය විය.

එසේ වුවද, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 2014 වසරේ පැවැති සියයට 10.4 හි සිට 2015 වසරේ දී සියයට 10.2 ක් දක්වා සුළු වශයෙන් අඩු විය.

**2014 වසරේ දී යහපත් වර්ධනයක් වාර්තා කළ අපනයන ආදායම, 2015 වසරේ දී ප්‍රධාන අපනයන කාණ්ඩ සියල්ලකම අඩු වීම් පිළිබිඹු කරමින් සියයට 5.6 කින් අඩු විය.** ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් අඩු වීම, දියුණු ආර්ථිකයන්ගේ ආර්ථික වර්ධන වේගයන් අඩු වීම, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත බොහොමයක භූ-දේශපාලනික අස්ථාවරභාවය සහ යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවෙන් මත්ස්‍ය ආනයනය සීමා කිරීම, අපනයන ආදායමේ සැලකිය යුතු අඩු වීම සඳහා හේතු විය. කුළුබඩු (සියයට 42.7) සහ ප්‍රවාහන උපකරණ (සියයට 60.5) අපනයන ආදායම් සැලකිය යුතු වර්ධනයන් වාර්තා කළ ද, තේ (සියයට -17.7), රබර් නිෂ්පාදිත (සියයට -14.5), රෙදිපිළි හා ඇඟලුම් (සියයට -2.2) සහ මුහුදු ආහාර (සියයට -35.5) අපනයන ආදායම අඩු වීම, අපනයන ආදායමේ සමස්ත අඩු වීම සඳහා දායක විය. ගෝලීය වශයෙන් සිදු වූ වර්ධනයන් පිළිබිඹු කරමින්, යුරෝපා සංගමය සහ මැදපෙරදිග වෙත සිදු කළ අපනයන පිළිවෙළින් සියයට 13.4 කින් සහ සියයට 11.8 කින් අඩු වූ අතර, ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ අපනයන පෙර වසරට සාපේක්ෂව සියයට 2.9 කින් වර්ධනය විය. කෙසේ වුවද, 2015 වසරේ දී අපනයන පරිමාව සාමාන්‍ය වශයෙන් සියයට 4.6 කින් වර්ධනය වූ අතර, එක්සත් ජනපද ඩොලර් අගය අනුව අපනයන මිලෙහි සියයට 9.8 ක අඩු වීමක් වාර්තා විය.

**2015 වසර තුළ දී ඉන්ධන නොවන ආනයන වියදම සියයට 9.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වුව ද සමස්ත ආනයන වියදම සියයට 2.5 කින් අඩු විය.** මෙම වසර තුළ දී, ඉන්ධන ආනයන වියදම එ.ජ.ඩොලර් බිලියන 2.7 දක්වා එ.ජ.ඩොලර් බිලියන 1.9 කින් අඩු වූ අතර මේ සඳහා ජාත්‍යන්තර ඉන්ධන මිල සැලකිය යුතු ලෙස අඩු වීම සහ ඉන්ධන යොදා ගනිමින් සිදු කරන තාප බලශක්තිය කෙරෙහි වූ අඩු රඳා පැවැත්ම හේතුවෙන් ආනයනය කළ ඉන්ධන පරිමාව අඩු වීම හේතු විය. කෙසේ වුවද, පෞද්ගලික රථවාහන සහ ආහාරමය නොවන අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම ඉහළ අගයක් ගැනීම, ඉන්ධන නොවන ආනයන වියදම වර්ධනය වීම සඳහා විශාල ලෙස දායක විය. රාජ්‍ය සේවකයන් සඳහා සහනදායී වාහන බලපත්‍ර සැපයීම, සිලින්ඩර ධාරිතාව ඝන සෙන්ටිමීටර 1,000 ට අඩු රථවාහන සඳහා වූ ආනයන බදු අඩු කිරීම, ජපාන යෙන් අගය අවප්‍රමාණය වීම, අඩු පොලී අනුපාත යටතේ ආනයන ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාව පැවැතීම සහ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වර්ධනය වීම රථවාහන ආනයනය විශාල ලෙස ඉහළ යෑම සඳහා බලපාන ලද හේතු ලෙස හඳුන්වා දිය හැක. කෙසේ වුවද, වසරේ අවසාන භාගයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය මගින් ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග විශේෂයෙන්ම රථවාහන ඇතුළු පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම අඩු වීම සඳහා හේතු විය. සාමාන්‍ය වශයෙන්, 2015 වසරේ දී ආනයන පරිමාව සියයට 10.6 කින් වර්ධනය වූ අතර එක්සත් ජනපද ඩොලර් අගය අනුව ආනයන මිල සියයට 11.8 කින් අඩු විය.


**වෙළඳ සහ ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟය පුළුල් වීම හමුවේ වුවද, සේවා හා ද්විතීයික ආදායම් ගිණුම්හි අතිරික්ත හේතුවෙන් 2015 වසරේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය 2014 වසරේ වාර්තා වූ අගයට බොහෝ දුරට සමාන විය.** සංචාරක සේවා උප අංශයෙහි ඉහළ ක්‍රියාකාරිත්වය සහ ප්‍රවාහන, සන්නිවේදන, පරිගණක හා තොරතුරු සේවා උප අංශයෙහි සතුටුදායක ක්‍රියාකාරිත්වය වසර තුළ දී විදේශීය සේවා ගිණුමෙහි වර්ධනය කෙරෙහි දායක විය. සංචාරක පැමිණීම්වල සහ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය හා කරනු ලබන වියදම ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී සංචාරක ඉපැයීම් සියයට 22.6 කින් වර්ධනය විය. ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) යන කර්මාන්තයන්හි අඛණ්ඩ වර්ධනය, විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා උප අංශයෙහි වර්ධනයට දායක විය. මේ අතර, සංචිත වත්කම් ආයෝජන කිරීම තුළින් වන ඉපැයීම් පහළ යෑම, පොලී ගෙවීම් ඉහළ යෑම සහ ලාභාංශ හා ප්‍රතිආයෝජනය කළ ඉපැයීම් ලෙස වූ ගෙවීම් හේතුවෙන් 2015 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් විය. විදේශීය සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ රජයේ සංක්‍රාම මන්දගාමී වීම හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුමෙහි අතිරික්තයෙහි යම් අඩුවීමක් සිදු විය. විදේශ විනිමය ඉපැයීමේ සාම්ප්‍රදායික මූලාශ්‍රයක් වන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2014 වසරේ දී වාර්තා කළ සියයට 9.5 ක වර්ධනය හා සැසඳීමේ දී 2015 වසරේ දී සියයට 0.5 කින් අඩු විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල වූ මෙම අඩු වීම කෙරෙහි ලෝක වෙළඳපොළේ තෙල් මිල ගණන් පහළ

මට්ටමක පැවතීම හේතුවෙන් මැද පෙරදිග තෙල් අපනයනය කරන රටවල ආදායම පහළ වැටීම සහ ගෘහ සේවිකාවන් ඇතුළු අර්ධ පුහුණු හා නුපුහුණු කාණ්ඩය යටතේ ශ්‍රම සංක්‍රමණ අඩු වීම දායක විය. වෙළඳ, සේවා, ප්‍රාථමික හා ද්විතීයික ආදායම් ගිණුම්හි මෙම ප්‍රවණතාවයන් සමඟ පෙර වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,988 ක හිඟයට සාපේක්ෂව 2015 වසරේ දී ජංගම ගිණුම එ.ජ.ඩොලර් මිලියන 2,009 ක හිඟයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය පසුගිය වසරේ වාර්තා වූ සියයට 2.5 සිට 2015 වසරේ දී සියයට 2.4 දක්වා සුළු වශයෙන් අඩු විය.

**2015 වසරේ දී ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුමෙහි ශුද්ධ විදේශ වගකීම් වෙනස්වීම් සහ ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් පෙර වසරට සාපේක්ෂව අඩු විය.** ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු දෙක තුළින් ලද එ.ජ.ඩොලර් මිලියන 2,150 සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇතිකර ගත් විදේශ විනිමය හුවමාරු ගිවිසුම තුළින් ලද එ.ජ.ඩොලර් මිලියන 1,500, 2015 වසරේ දී ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුමෙහි ප්‍රධානතම ලැබීම් විය. වසර තුළ දී විදේශීය ඍජු ආයෝජන, විවිධ ආයෝජන සහ රජය, බැංකු හා පෞද්ගලික අංශයට වූ විදේශීය ණය ලැබීම් මගින් මූල්‍ය ගිණුම වෙත වූ දායකත්වය සුළු විය. මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු මට්ටමක පැවැතීමට, 2015 වසරේ දී අසතුටුදායක ගෝලීය ආර්ථික තත්ත්වය යම් තරමකට හේතු වූ අතර, දේශීය වශයෙන් බලන කල ජාතික මැතිවරණ දෙකක් පැවැත්වීම හේතුවෙන් ආයෝජක විශ්වාසය අඩු වීම ද මීට දායක විය. මේ අතර, එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතය ඉහළ දමනු ඇතැයි වූ අපේක්ෂාව සහ පසුව පොලී අනුපාත ඉහළ දැමීම හේතුවෙන් විදේශීය ආයෝජකයින් විසින් නැගී එන ආර්ථිකයන්ගෙන් සිය ආයෝජන ඉවත් කර ගැනුණි. මේ අනුව, වසර තුළ දී, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් එ.ජ.ඩොලර් මිලියන 1,093 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. මීට අමතරව, නියමිත ණය සේවාකරණ ගෙවීම් සහ කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයෙහි පියවීම්, මූල්‍ය ගිණුම කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය.

**2014 වසරේ සමස්ත අතිරික්තයක් වාර්තා කළ ගෙවුම් තුලනය ප්‍රධාන වශයෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම හේතුවෙන් 2015 වසරේ දී හිඟයක් වාර්තා කළේය.** ගෙවුම් තුලනය, 2014 වසරේ දී පැවැති එ.ජ.ඩොලර් මිලියන 1,369 ක අතිරික්තයට සාපේක්ෂව 2015 වසරේ දී

**1.5 රූප සටහන** **ගෙවුම් තුලනය**




එ.ජ.ඩොලර් මිලියන 1,489 ක හිඟයක් වාර්තා කළේය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත 2014 වසර අවසානයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් බිලියන 8.2 ක සිට 2015 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 7.3 දක්වා පහත වැටුණි. නියමිත විදේශ ණය සේවාකරණ ගෙවීම්, කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීම, සමීපස්ථ ණය පහසුකම යටතේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අරමුදල) වෙත සිදු කළ ගෙවීම් සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම, දළ නිල සංචිත අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2015 වසර අවසානයේ පැවැති දළ නිල සංචිත මට්ටම මාස 4.6 ක භාණ්ඩ ආනයනය සඳහා සහ මාස 3.8 ක භාණ්ඩ හා සේවා ආනයනවලට සමාන විය. මේ අතර, මුළු විදේශ වත්කම් 2014 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් බිලියන 9.9 සිට 2015 වසර අවසානයේ එ.ජ.ඩොලර් බිලියන 9.3 කට අඩු වූ අතර, මුළු විදේශ වත්කම් ප්‍රමාණය භාණ්ඩ ආනයනික මාස 5.9 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.9 කට සමාන විය. 2015 වසර අවසානය වන විට දළ නිල සංචිත වත්කම් තත්ත්වය රටෙහි කෙටිකාලීන ණය හා වගකීම්වලින් සියයට 60 ක් ආවරණය කළේය.

**2015 වසරේ දී රජයේ සහ පෞද්ගලික අංශවල විදේශීය ණයවලින් සමන්විත රටෙහි මුළු විදේශීය ණය ඉහළ ගියේය.** රටෙහි මුළු විදේශීය ණය ප්‍රමාණයෙහි නාමික අගය ඉහළ යාම විදේශීය ණය වශයෙන් ලැබුණු ලැබීම් මන්දගාමී වීමෙහි සහ ණය සේවාකරණ යටතේ සැලකිය යුතු ගෙවීම් ප්‍රමාණයක් වාර්තා වීමෙහි ප්‍රතිඵලයකි. රටෙහි මුළු විදේශීය ණය ප්‍රමාණය 2014 වසර අවසානය වන විට පැවැති එ.ජ.ඩොලර් බිලියන 42.9 ට සාපේක්ෂව

2015 වසර අවසානය වන විට එ.ජ.ඩොලර් බිලියන 44.8 ක් විය. තවද, මුළු විදේශීය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසර අවසානයේ දී පැවැති සියයට 53.6 සිට 2015 වසර අවසානයේ දී සියයට 54.4 දක්වා ඉහළ ගියේය. මේ අතර, ණය වාරික සහ පොලී යන දෙවර්ගයෙහිම ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශීය ණය වගකීම් හා සම්බන්ධ ණය සේවාකරණ ගෙවීම් 2014 වසර තුළ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 3,479 සිට 2015 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 4,683 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ණය සේවාකරණ ගෙවීම්හි ඉහළ යෑම සහ භාණ්ඩ අපනයනවල පහළ යෑම හේතුවෙන් භාණ්ඩ හා සේවා අපනයනවල ප්‍රතිශතයක් ලෙස ණය සේවාකරණ ගෙවීම් 2014 වසරේ පැවැති සියයට 20.8 සිට 2015 වසරේ දී සියයට 27.7 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**2015 වසරේ සැප්තැම්බර් මස ආරම්භයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීව තීරණය වීමට ඉඩ හැරීමට තීරණය කළේය.** ජංගම සහ මූල්‍ය ගිණුම් වෙත වූ අපේක්ෂිත මට්ටමට වඩා අඩු විදේශ විනිමය ලැබීම්, ආනයන සහ ණය සේවාකරණ ගෙවීම් සඳහා විදේශ විනිමය යෙදවීම සහ රජයේ ණය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් ලද විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම, දේශීය විදේශ විනිමය වෙළඳපොළ මත සැලකිය යුතු මට්ටමක පීඩනයක් ඇති කළේය. මෙම වාතාවරණය යටතේ, විනිමය අනුපාතිකයෙහි අධික විචලනයන් අවම කිරීම සඳහා වසරේ පළමු මාස අට තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ශුද්ධ පදනම යටතේ එ.ජ.ඩොලර් බිලියන 1.9 ක් සැපයීය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී වඩා නම්‍යශීලීභාවයක් සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්තිමය තීරණය ගත් 2015 වසරේ සැප්තැම්බර් මස 03 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල සුළු වශයෙන් සියයට 2.57 කින් අවප්‍රමාණය විය. මෙම තීරණයට පසු වසර අවසානය දක්වා කාලය තුළ දී, එ.ජ.ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල සියයට 6.64 කින් අවප්‍රමාණය වීමක් වාර්තා කළ අතර, වසර තුළ දී සමස්ත ලෙස රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 9.03 කින් අවප්‍රමාණය විය. එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල නාමික වශයෙන් අවප්‍රමාණය වීම සහ බොහෝ වෙළඳ හවුල්කාර රටවල් හා සැසඳීමේ දී දේශීය උද්ධමනය සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පැවැතීම හේතුවෙන් 2015 වසර තුළ දී මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක පිළිවෙළින් සියයට 3.07 කින් සහ 2.26 කින් අවප්‍රමාණය විය.

## රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්


**2015 වසර සඳහා වන අතුරු අයවැය මගින් වසර තුළ දී අයවැය හිඟයෙහි ශීඝ්‍ර අඩුවීමක් අපේක්ෂා කළ ද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අභියෝගාත්මකව සිදු වූ වර්ධනයන් ගණනාවක් නිසා සැලසුම් කළ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ළඟා කර ගැනීමට බාධා ඇති විය.** ජනවාරි මාසයේ පැවැති ජනාධිපතිවරණයෙන් පසුව ඉදිරිපත් කළ අතුරු අයවැය මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියෙහි අපේක්ෂිත ප්‍රතිඵල ඉටු කර ගැනීමේ අරමුණින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ගණනාවක් හඳුන්වා දෙන ලදී. 2015 වසරේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවෙහි සඳහන් මැදිකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවෙහි (2014-2017) ඉලක්කයන්ට අනුකූලව රජයේ අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ වාර්තා වූ සියයට 5.7 සිට 2015 වසරේ දී සියයට 4.4 දක්වා අඩු කිරීමට අපේක්ෂා කළ අතර, 2015 වසර තුළ දී මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 72.0 ක මට්ටමක පවත්වා ගැනීමට ද අපේක්ෂා කරන ලදී. එසේ වුවද, වසර තුළ දී 2015 වසර සඳහා අතුරු අයවැයෙහි සඳහන් අයවැය ඉලක්කයන්ගෙන් සැලකිය යුතු ලෙස වෙනස් වෙමින් 2015 වසරේ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය පිරිහීමට ලක් විය. රජයේ ආදායම අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩු වීම විශේෂයෙන් වැටුප් සහ වේතන සඳහා වූ ඉහළ පුනරාවර්තන වියදම්, සුභසාධන වියදම් සහ පොලී ගෙවීම් ඇස්තමේන්තුගත අගයට වඩා ඉහළ යෑම යනාදිය 2015 සමස්ත අයවැය හිඟය මත සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය, මුල් අයවැයෙහි ඉලක්කය වූ සියයට 4.4 සැලකිය යුතු ලෙස අබිබවා යමින් 2014 වසරේ පැවැති සියයට 5.7 සිට 2015 වසරේ දී සියයට 7.4 දක්වා ඉහළ ගියේය. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කරන වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ පැවැති සියයට 1.2 සිට 2015 වසරේ දී සියයට 2.2 දක්වා ඉහළ ගිය අතර, සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීමේ වියදම් ඉවත්කර සකසන ප්‍රාථමික ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවැති සියයට 1.5 සිට සියයට 2.9 දක්වා වැඩි විය. වසර තුළ දී ලද විදේශීය මූල්‍යනය සාපේක්ෂව අඩු වීමත් සමඟ අයවැය හිඟය මූල්‍යනය කිරීම ප්‍රධාන වශයෙන්ම දේශීය මූලාශ්‍රවලින් සිදු විය. මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසර අවසානයේ පැවැති සියයට 70.7 සිට 2015 වසර අවසානයේ සියයට 76.0 දක්වා ඉහළ ගිය අතර, අයවැය හිඟය සහ ණය එක්රැස්වීම අඩු කිරීම සඳහා ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව එමගින් අවධාරණය කෙරෙයි.

**2015 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායමෙහි වර්ධනයක් පෙන්නුම් කළ අතර, එක් වරක් පමණක් ගෙවිය යුතු බදු කිහිපයකින් ලද ආදායම සහ ඉහළ ගිය මෝටර් වාහන ආනයන මත වූ නිෂ්පාදන බදු ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යෑම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.** රජයේ මුළු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවැති සියයට 11.4 සිට 2015 වසරේ දී සියයට 13.0 දක්වා ඉහළ ගිය ද, එය 2015 වසර සඳහා වූ අතුරු අයවැයෙහි සඳහන් ඉලක්කය වූ සියයට 13.3 ට වඩා අඩු විය. බදු නොවන ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවැති සියයට 1.4 සිට 2015 වසරේ දී සියයට 0.9 ක් දක්වා අඩු වූ අතර, බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවැති සියයට 10.1 සිට 2015 වසරේ දී සියයට 12.1 දක්වා ඉහළ ගියේය. නිෂ්පාදන බදු ආදායම, සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු, ආනයන තීරු බදු, සෙස් බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ විදුලි සංදේශ බද්ද යන බදුවලින් ලද ආදායම ඉහළ ගිය ද දේශීය ක්‍රියාකාරකම් මත සහ ආනයන මත වන එකතු කළ අගය මත බදු, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ රඳවා ගැනීමේ බද්ද මගින් ලද ආදායම් වසර තුළ දී අඩු විය. බදු ආදායමෙහි මෙම ඉහළ යෑමට බදු ක්‍රමය ක්‍රමවත් කිරීම සහ බදු පදනම පුළුල් කිරීම සඳහා වසර තුළ දී හඳුන්වා දෙනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රමෝපායයන් ද හේතු විය. වසර තුළ දී හඳුන්වා දුන් ප්‍රධාන ක්‍රමෝපායයන් අතරට සියලු සේවක අංශ සඳහා අඩු බදු අනුපාතිකයක් අදාළ කරමින් පුද්ගල ආදායම් බදු ඒකාග්‍ර කිරීම, එක් වරක් පමණක් ගෙවිය යුතු බදු ද ඇතුළුව නව බදු කිහිපයක් හඳුන්වා දීම සහ බදු අනුකූලතාව වර්ධනය කරන අතරම ආදායම් එකතු කරන ආයතනවල බදු පරිපාලනය ශක්තිමත් කිරීම ඇතුළත් වේ.

**රජයේ මුළු ආදායම නාමික වශයෙන් ගත් කල, 2014 වසරේ පැවැති රුපියල් බිලියන 1,195.2 සිට 2015 වසරේ දී රුපියල් බිලියන 1,454.9 දක්වා සියයට 21.7 කින් ඉහළ ගිය අතර, නිෂ්පාදන බදු, ආදායම් බදු සහ ආනයන තීරු බදුවලින් ලද ආදායම ඉහළ යෑම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.** නිෂ්පාදන බදු ආදායම 2015 වසරේ දී මුළු බදු ආදායමට තනි බද්දක් ලෙස ඉහළම දායකත්වය සැපයූ අතර, මෝටර් වාහන, මධ්‍යසාර සහ සිගරට් මත ඉහළ අගයකින් යුත් සංයුක්ත නිෂ්පාදන බද්දක් පැනවීමේ ප්‍රතිඵල එමගින් පිළිබිඹු විය. ඒ අනුව, නිෂ්පාදන බදු ආදායම වසර තුළ දී මුළු බදු ආදායමෙන් සියයට 36.7 කට සහ මුළු ආදායමෙන් සියයට 34.2 කට දායක විය. මේ අතර, සුපිරි වාසි බද්ද වැනි වසර තුළ දී හඳුන්වා දුන් එක්වරක් පමණක් ගෙවිය යුතු බදුවලින් රුපියල් බිලියන 50.0 ක ආදායමක් ලැබීම ද බදු ආදායමෙහි ඉහළ යෑමට සැලකිය යුතු දායකත්වයක් දැක්විය. වසර තුළ දී ගාස්තු සහ අයකිරීම්වලින් ලද ආදායම ඉහළ ගිය ද, බදු නොවන ආදායම සියයට 31.6 කින් සැලකිය යුතු ලෙස රුපියල් බිලියන 99.1 දක්වා අඩු වූ අතර, රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ලාභ සහ ලාභාංශ පැවරුම් අඩු වීම සහ පොලී ආදායම සහ කුලී ආදායම පහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය.

**මුළු වියදම සහ ශුද්ධ ණයදීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවැති සියයට 17.2 සිට 2015 වසරේ දී සියයට 20.5 දක්වා ඉහළ ගිය අතර, පුනරාවර්තන වියදමෙහි සහ රාජ්‍ය ආයෝජනවල සැලකිය යුතු ඉහළ යෑම එමගින් පිළිබිඹු විය.** වසර තුළ දී පුනරාවර්තන වියදම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවැති සියයට 12.7 සිට සියයට 15.2 දක්වා ඉහළ ගිය අතර, වැටුප් සහ වේතන, පොලී ගෙවීම්, වර්තන පැවරුම් සහ සහනාධාර මත වියදම ඉහළ යෑම එයට හේතු විය. පුනරාවර්තන වියදම නාමික වශයෙන්, 2014 වසරේ පැවැති රුපියල් බිලියන 1,322.9 සිට 2015 වසරේ දී රුපියල් බිලියන 1,701.7 දක්වා සියයට 28.6 කින් ඉහළ ගිය අතර එය අයවැය ඉලක්කය වූ රුපියල් බිලියන 1,552.0 ද ඉක්මවීය. කෙසේ වෙතත්, මධ්‍යම රජයේ සේවකයන්ගේ වැටුප් සහ වේතන නාමික වශයෙන් රුපියල් බිලියන 561.7 දක්වා සියයට 27.4 කින් ඉහළ ගිය අතර එමගින් රාජ්‍ය වියදම ඉහළ යෑම කෙරෙහි සැලකිය යුතු පීඩනයක් ඇති කරන ලදී. පොලී ගෙවීමේ වියදම ද 2015 වසරේ දී නාමික වශයෙන් රුපියල් බිලියන 509.7 ක් දක්වා සියයට 16.8 කින් ඉහළ ගිය අතර, ණය ගැනීම් ඉහළ යෑම සහ අනෙක් විදේශීය මුදල්වලට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය වීම ඒ සඳහා හේතු විය. ඒ අතරම, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014

**1.6 රූප සටහන** — **රාජ්‍ය ආදායම, වියදම සහ සමස්ත අයවැය හිඟය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




වසරේ පැවැති සියයට 4.5 සිට 2015 වසරේ දී සියයට 5.3 දක්වා ඉහළ ගියේය. ඒ අනුව නාමික වශයෙන් එය පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 473.0 හා සැසඳීමේ දී වසර තුළ දී රුපියල් බිලියන 588.7 ක් දක්වා සියයට 24.5 කින් ඉහළ ගියේය. එම ප්‍රවණතාවම නිරූපණය කරමින්, රාජ්‍ය ආයෝජන ද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවැති සියයට 4.7 සිට 2015 වසරේ දී සියයට 5.4 දක්වා ඉහළ ගිය අතර, රාජ්‍ය ආයෝජන නාමික වශයෙන් 2014 වසරේ පැවැති රුපියල් බිලියන 486.6 හා සැසඳීමේ දී 2015 වසරේ දී රුපියල් බිලියන 602.8 දක්වා සියයට 23.9 කින් ඉහළ ගියේය.

**2015 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 7.4 ක් වූ අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා රජය ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මත රැඳුණු අතර, බැංකු නොවන අංශය ඒ අතරින් විශේෂිත වේ.** ශුද්ධ දේශීය මූල්‍යනය 2014 වසරේ පැවැති රුපියල් බිලියන 378.7 සිට 2015 වසරේ දී රුපියල් බිලියන 592.7 දක්වා වැඩි වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුව වූ රුපියල් බිලියන 208.0 ට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ අගයක් විය. මුළු ශුද්ධ දේශීය මූල්‍යනයෙන් සියයට 50.8 ක් එනම් රුපියල් බිලියන 300.9 ක් බැංකු නොවන අංශයෙන් මූල්‍යනය කරන ලදී. ඒ අතර, බැංකු අංශයෙන් රජය ලබා ගත් ණය ද 2014 වසරේ පැවැති රුපියල් බිලියන 126.9 සිට වසර තුළ දී රුපියල් බිලියන 291.8 දක්වා ඉහළ ගිය අතර, එය ද 2015 වසර සඳහා වන අයවැයෙහි සඳහන් වාර්ෂික ඇස්තමේන්තුව වූ රුපියල් බිලියන 70.0 ට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයකි. භාණ්ඩාගාර බැඳුම්කර හරහා වාණිජ බැංකුවලින් ලබා ගත් ණය වසර තුළ දී ශුද්ධ ආපසු ගෙවීමක් වාර්තා කළ ද භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හරහා ලබා ගත් ණය වසර තුළ දී ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් හරහා මහ බැංකුවෙන් ලබා ගත් ශුද්ධ ණය ඉහළ යන ලදී. රුපියල්වලින් නාමනය කරන ලද විදේශිකයන් සතු භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල සිදු කළ ආයෝජනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් රටින් පිටතට ගලා යෑමක් සිදු වුවද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීමත් සමඟ විදේශීය මූලාශ්‍ර හරහා සිදු කරන ලද ශුද්ධ මූල්‍යනය ද 2014 වසරේ පැවැති රුපියල් බිලියන 212.5 සිට 2015 වසරේ දී රුපියල් බිලියන 236.8 දක්වා ඉහළ ගියේය.

**රජයේ මුළු ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ පැවැති සියයට 70.7 සිට 2015 වසර අවසානය වන විට සියයට 76.0 දක්වා ඉහළ ගිය අතර, රාජ්‍ය මූල්‍ය අංශයේ පැවැති දුර්වල කාර්යසාධනය සහ වසර තුළ දී ආර්ථික වර්ධනය නාමික වශයෙන් සාපේක්ෂව අඩුවීම එමගින් පිළිබිඹු විය.** නොපියවූ

**1.7 රූප සටහන** **මධ්‍යම රජයේ ණය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)**




රජයේ සමස්ත ණය ප්‍රමාණය නාමික වශයෙන්, 2014 වසර අවසානයේ පැවැති රුපියල් බිලියන 7,390.9 සිට 2015 වසර අවසානයේ රුපියල් බිලියන 8,503.2 දක්වා ඉහළ ගියේය. ආදායම් එක්රැස්කිරීම් අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස වැඩි වශයෙන් ණය ගැනීමට සිදු වීම සහ ප්‍රධාන විදේශීය මුදල්වලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම, රජයේ ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑමට දායක විය.

**රාජ්‍ය මූල්‍ය අංශයේ මෑතකාලීන කාර්යසාධනය මගින් රජයේ අයවැයකරණයෙහි පවත්නා ව්‍යුහාත්මක දුර්වලතාවන් පිළිබිඹු කරයි.** සංකීර්ණ බදු ක්‍රමය, සාපේක්ෂව අඩු ආදායම් පදනම, දුර්වල බදු අනුකූලතාව මෙන්ම බදු පරිපාලනය දියුණු කිරීමේ අවශ්‍යතාව යනාදිය ආදායම් රැස්කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. රජයේ අයවැයකරණය තුළ ආදායම් ගිණුමෙහි (වර්තන ගිණුම) හිඟය සැලකිය යුතු ලෙස ඉහළ යෑම මගින් පිළිබිඹු කරනුයේ, රජයේ නඩත්තු වියදම් පියවීමට පවා රටේ ආදායම ප්‍රමාණවත් නොවන බවයි. මේ නිසා, රජයේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා ද අඛණ්ඩව ණය ගැනීමට රජයට සිදු වී ඇත. අයවැයකරණයෙහි ඇති මෙම ව්‍යුහාත්මක දුර්වලතාව සංවර්ධන අවශ්‍යතාවයන් වෙත ප්‍රමාණවත් තරම් වියදම් සිදු කිරීමට ඇති හැකියාව සැලකිය යුතු ලෙස අඩු කරනු ලබයි. සම්පත් සඳහා වන ප්‍රබල අවශ්‍යතාව, ණය ගැනීම් හරහා වියදම් වැඩිකර ගැනීමට නැඹුරු වීමට හේතු වන අතර, රාජ්‍ය මූල්‍ය ඉලක්ක අපේක්ෂිත මට්ටම්වලින් බොහෝ සෙයින් වෙනස්වීමට හේතු වනු ඇත. මෙම තත්ත්වය ආදායම් අඩු වීම, වියදම් ඉහළ යෑම, ඉහළ අයවැය හිඟය, රජයේ ණය සහ ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑමටත්, එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ආයෝජන සහ අනෙකුත් අත්‍යවශ්‍ය වියදම් වැඩි කිරීමේ හැකියාව අඩු වීම යනාදී විෂම චක්‍රයක් ඇති වීම සඳහා හේතු වේ.

විශේෂ සටහන 1

## ස්ථායීතාව සහ ශක්තිමත්භාවය සඳහා වූ රාජ්‍ය මූල්‍ය අවකාශය

සාර්ව ආර්ථික ස්ථායිතාව සඳහා සහ කම්පනයන්ට මුහුණ දීමට ආර්ථිකය සතු හැකියාව වර්ධනය කිරීමට සහයෝගය දැක්වීම අරමුණු කරගනිමින් රාජ්‍ය මූල්‍ය අවකාශ නිර්මාණය කිරීම පිළිබඳව විශේෂයෙන්ම, මූල්‍ය අර්බුදයෙන් පසුව ගෝලීය රාජ්‍ය මූල්‍ය බලධාරීන්ගේ අවධානය යොමු වී ඇත. අවිනිශ්චිත ගෝලීය ප්‍රවණතා, ඉහළ යන ණය සේවාකරණ වගකීම් සහ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය තුළින් ඇති වන පීඩනයන්, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතුවල තිරසාරභාවය කෙරෙහි අඛණ්ඩව අභියෝග ඇති කරන අතර, දියුණු සහ නැගීඑන වෙළඳපොළ ආර්ථිකවල පවතින සංරෝධිත රාජ්‍ය මූල්‍ය වාතාවරණය හමුවේ රාජ්‍ය අයවැය තුළ රාජ්‍ය මූල්‍ය අවකාශයක් සඳහා ඇති අවශ්‍යතාව වැඩිදියුණු කරයි. රජයේ අනාගත රාජ්‍ය මූල්‍ය තත්ත්වය මත අනිසි පීඩනයක් ඇති නොකොට, ශීඝ්‍ර සංවර්ධනයක් ලබා ගැනීමේ අවශ්‍යතාව, ශ්‍රී ලංකාව වැනි නැගීඑන මැදි ආදායම්ලාභී රටවල අයවැය ක්‍රියාවලිය සඳහා බලපෑම් ඇති කර තිබේ. මෙය ශ්‍රී ලංකාව තුළ ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය අවකාශයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කරයි.

හෙලර් (2005) විසින් රාජ්‍ය මූල්‍ය අවකාශය යනු "රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ තිරසාරභාවයට හෝ ආර්ථික ස්ථායීතාවට හානියක් නොවන පරිදි, රජයට තම සම්පත් අපේක්ෂිත අවශ්‍යතා සඳහා ලබාදීමට අයවැය තුල පවතින ඉඩකඩ" වශයෙන් අර්ථ දක්වා ඇත[1]. එනම් රටෙහි සාර්ව ආර්ථික ස්ථායිතාවට හානි නොවන පරිදි වියදම්, ආදායම් හෝ ණය ලබාගැනීමේ විකල්ප පිළිබඳ තීරණ ගැනීමේ දී රජයට නම්‍යශීලී ලෙස තම අමතර සම්පත් උපයෝජනය සඳහා පවතින අවස්ථාව රාජ්‍ය මූල්‍ය අවකාශය වේ. රාජ්‍ය වියදම් සංයුතිය සහ ප්‍රවණතාව, බදු නැමියාව, ණය ලබාගැනීමේ නැමියාව මෙන්ම ආර්ථික වර්ධනය රාජ්‍ය මූල්‍ය අවකාශයේ ප්‍රධාන නිර්ණායකවලට ඇතුළත් වේ. එමනිසා ආදායම ඉහළ නැංවීම, වියදම් සීමා කිරීම හෝ දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ණය ලබාගැනීම අවම කිරීම සහ ආර්ථික වර්ධනය වේගවත් කිරීම මගින් රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කළ හැකි වේ. රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීමේදී, රාජ්‍ය මූල්‍ය වාතාවරණයේ තිරසාරභාවය කිසිසේත් කැපකළ යුතු නොවේ. එහිදී වියදම් වැඩසටහන් සඳහා සහ ණය සේවාකරණය සඳහා අවශ්‍ය කෙටිකාලීන සහ දිගුකාලීන මූල්‍ය ශක්‍යතාව පවතින බවට රජය සහතික කළ යුතුය.

### ශ්‍රී ලංකා රාජ්‍ය අයවැයෙහි ව්‍යුහය


සීමිත සම්පත් සහිත පරිසරයක් තුළ වියදම් තරගකාරීව වර්ධනය වීම මෑත අතීතයේ ශ්‍රී ලංකාවේ අයවැය ක්‍රියාවලියෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් විය. ආදායම් ලැබීම් අඩුවීම සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය හමුවේ ඉහළ වියදම් අවශ්‍යතාවල ප්‍රතිඵලයක් ලෙස සෑම රජයක්ම නිරන්තරයෙන් සාපේක්ෂ වශයෙන් ඉහළ අයවැය හිඟයක් වාර්තා කරන ලදී. 2010 - 2015 කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවෙහි අයවැය හිඟයෙහි සාමාන්‍යය ද.දේ.නි.යෙන් සියයට 6 ක් පමණ විය. රජයෙහි ආදායම් හා වියදම් ව්‍යුහය විමර්ශනය කිරීමේ දී, රාජ්‍ය මූල්‍ය අධිකාරීන් මුහුණ දෙන අභියෝග හඳුනාගත හැක. 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය වියදම්හි සාමාන්‍යය ද.දේ.නියෙන් සියයට 18.8 ක මට්ටමේ පවත්වා ගැනුණි. මෙම කාලසීමාව තුළ රජයේ වර්තන වියදම ද.දේ.නි.යෙන් සියයට 13.7 ක සීමාවෙහි පැවතුණ ද වර්තන වියදම් තුළ අයවැයෙහි නොවැළැක්විය හැකි වියදම් සංරචකයක් වන පොලී ගෙවීම් සහ වැටුප් හා දීමනා සඳහා වූ වියදම්, පුනරාවර්තන වියදමෙන් තුනෙන් දෙකකට වඩා දායකත්වයක් සපයමින් නොවෙනස්ව පැවතුණි. 2010 - 2015 කාලසීමාව තුළ දී වැටුප් හා වේතන සහ පොලී ගෙවීම්වල සාමාන්‍යය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 4.4 ක් සහ සියයට 4.7 ක් විය. තවද, මෙම කාලසීමාව තුළ දී අයවැයෙහි ඇතුළත් දිළිඳුකම අවම කිරීමෙහි ප්‍රධාන සංරචකයක් වන කුටුම්බ සඳහා ලබාදෙන සංක්‍රාම ද අයත්වන, සුබසාධන වියදම් සහ සංක්‍රාම ගෙවීම්හි සාමාන්‍යය ද ද.දේ.නි.යෙන් සියයට 3.0 ක් විය.

මෙම පසුබිම තුළ, අනෙකුත් අත්‍යවශ්‍ය මූල්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීමට, පවත්නා අයවැය තුළ ඇති ඉඩකඩ සීමා සහිත වේ. රජය විසින් ප්‍රමුඛ අංශ වන අධ්‍යාපන සහ සෞඛ්‍ය වැනි අංශ සඳහා අවශ්‍ය වියදම් දැරීමේ දී රාජ්‍ය මූල්‍ය බලධාරීන් මෙම ගැටලුවට මුහුණපාන අයුරු පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය. කාර්යයන් මත පදනම්ව වියදම් අධ්‍යයනය කිරීමේ දී සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි අංශ සඳහා අයවැයෙන් වෙන්කරන ලද අරමුදල්වල සාමාන්‍යය, සමස්ත අයවැයෙහි වියදමින් සියයට 16 ක් පමණ වන අතර, 2015 වසරේ වර්ධනයක් පෙන්නුම් කළ ද 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අධ්‍යාපන සහ සෞඛ්‍ය සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය, පිළිවෙළින්, සියයට 1.7 ක් සහ සියයට 1.3 ක් විය. සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි අංශ සඳහා කරනු ලබන වියදම් ඉහළ දැමීම මගින් දිගු කාලීනව මානව ප්‍රාග්ධනය සඳහා ඉහළ ප්‍රතිලාභ අත්කර දෙන බවට තර්කයක් ගොඩනැගිය හැකිය. කෙසේ වෙතත්, අයවැයෙහි වියදම් යම් අන්දමකට රජයට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට අවම හැකියාවක් ඇති වත්මන් වියදම් ව්‍යුහය සැලකීමේ දී මෙම අරමුණු සඳහා වන අරමුදල් ඉහළ නැංවීම සඳහා රජය විසින් රාජ්‍ය මූල්‍ය අවකාශයක් නිර්මාණය කිරීම අවශ්‍යව තිබේ.

1 Heller, P. (2005) 'Understanding Fiscal Space', Policy Discussion Paper PDP/05/4, Washington, DC : Fiscal Affairs Department, IMF

ආදායම් පාර්ශ්වය සැලකීමේ දී රජයේ මුළු ආදායම් ලැබීම්, සමස්ත වියදමට වඩා සැලකිය යුතු ලෙස පහළ අගයක පවතින අතර, එය පුනරාවර්තන වියදම පියවා ගැනීමට ද ප්‍රමාණවත් නොවේ. 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායමෙහි සාමාන්‍යය සියයට 12.4 ක් විය. ප්‍රධාන වශයෙන්ම රටෙහි පවතින දුර්වල බදු රැස් කිරීමේ ක්‍රියාවලිය, ආදායම පහළ මට්ටමක පැවැතීමට හේතු වී තිබේ. 2015 වසරේ දී එක් වරක් පමණක් ගෙවිය යුතු බදු කිහිපයක් පැනවීම ද හේතුවෙන් බදු ආදායම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.1 දක්වා ඉහළ ගිය ද 2014 වසරේ දී එය සියයට 10.1 දක්වා පහළ ගියේය. කලාපීය රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ බදු එකතු කිරීම අඛණ්ඩව දුර්වල මට්ටමක පවතී. විවිධ බදු නිදහස් කිරීම් හේතුවෙන් බදු පද්ධතියේ නම්‍යතාවය අඩු වීම, බදු පැහැරහැරීම් සහ දුර්වල බදු පරිපාලනය යන කරුණු ආදායම් එක්රැස් කිරීමෙහි දුර්වල කාර්යසාධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

රූප සටහන වි.ස. 1.1 ආදායම් සහ වියදම්වල ක්‍රියාකාරිත්වය




ඉහළ වියදම් මට්ටම සමඟ පහළ මට්ටමක පවතින ආදායම් ජනනය වීමත් ඒ හේතුවෙන් දැනට ඇති ඉහළ අයවැය හිඟයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ රාජ්‍ය ණය මට්ටමක් නිර්මාණය වී තිබේ. 2015 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ණය සියයට 76 දක්වා ඉහළ ගොස් ඇත. මේ තුළින්, ණය සේවාකරණ ගෙවීම් ඉහළ නංවන අතර, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පීඩනයක් ඇති කර තිබේ. වර්තමානයේ දී, බදු සහ බදු නොවන ප්‍රභව හරහා උපයනු ලැබූ ආදායමෙන් සියයට 90 ක් පමණ ණය සේවාකරණ ගෙවීම් සඳහා යොදවනු ලැබේ. මේ අතර, උද්ධමනාත්මක නොවන දේශීය මූලාශ්‍ර ඔස්සේ ණය ලබාගැනීමට ඇති ඉඩප්‍රස්ථා සීමා වී ඇති අතර විදේශ මූලශ්‍ර මගින් ලබාගන්නා ණය මට්ටම ඉහළ ගියහොත් රට බාහිර කම්පනයන්ට භාජනය වීමට ඇති අවදානම ද ඉහළ යනු ඇත. රාජ්‍ය මූල්‍ය අවකාශයක් නොමැති වීම තුළින් ආර්ථිකයේ වර්ධනය වන සම්පත් අවශ්‍යතා සපුරාලීම සඳහා ණය ගැනීම ඉහළ දැමීමට රජයට නොහැකි වී ඇති බව පිළිබිඹු වේ.

**ඉදිරි දැක්ම**

රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සඳහා අවකාශය අවම වීම හේතුවෙන් සමාජයේ විවිධ අංශ වෙතින් සම්පත් සඳහා ඇතිවන නව ඉල්ලුම් තත්ත්ව රජයේ අයවැය තුළින් සපුරාලීම ඉතා අපහසු කාර්යයක් වේ. රජයට අමතර ණය ලබාගැනීමට ඇති හැකියාව අවම වීම හේතුවෙන්, බදු සහ වියදම් ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීම කළ යුතු වේ. රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීම සඳහා පවතින අයවැය ව්‍යුහය විශාල ලෙස ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ. අවම වශයෙන් ශ්‍රී ලංකාවේ කලාපීය රටවල් හා සමගාමීව ආදායම් ජනනය කිරීම වර්ධනය කිරීම හරහා ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ඉලක්කගත කළ යුතු වේ. බදු පදනම ප්‍රසාරණය කිරීම සහ බදු අනුකූලතාව ඉහළ නැංවීම අරමුණු කරගෙන බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වේ. වියදම් පාර්ශ්වය සැලකීමේ දී, රජයේ වියදම් ප්‍රමුඛතා පිළිබඳ පුළුල් දර්ශනයක් සහිත මැදි කාලීන වියදම් රාමුවකට අනුරූපව, රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කළ යුතු වේ. එසේම, රටෙහි වියදම් සඳහා මූල්‍යමය වටිනාකමක් ලබාදීමට හැකි වන පරිදි වියදම් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම කළ යුතුය. මෙම තත්ත්වය තුළ එක් එක් වියදම් අයිතම, ආර්ථික, දේශපාලනික, සමාජීය සහ රජයේ වෙනත් සැලකිය යුතු කරුණුවලට අනුරූපව ක්‍රමානුකූලව විමර්ශනය කළ යුතුය. තවද, විධිමත්ව සකසන ලද අයවැයට අමතරව පසුව ගනු ලබන වියදම් පිළිබඳ තීරණ හරහා රාජ්‍ය මූල්‍ය අවකාශය අවම වන හෙයින් එවැනි තීරණ ගැනීම සීමා කළ යුතුය. රජය සතු ව්‍යවසායන්වල මූල්‍ය ශක්තිය වර්ධනය කිරීමෙන් සහ එම ආයතන අයවැය මත රඳා පැවැත්ම අවම කිරීම හරහා රාජ්‍ය ව්‍යවසායවල කාර්යසාධනය වැඩිදියුණු කිරීමට රජය විසින් කටයුතු කළ යුතුය. ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වේ. රජය විසින් කම්කරු සංවිධාන හා පොදු ජනතාව ඇතුළු සියලු පාර්ශ්ව සමඟ ක්‍රමවත් සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා ඇති විය හැකි විරෝධතා අවම කර ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

1

ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති


මේ නිසා, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කර ගැනීම අසීරු කාර්යයක් වනු ඇත. ඒ අනුව, අයවැය කටයුතු නිසි ලෙස සිදු වන පරිදි අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරමින් මෙම විෂම චක්‍රයේ සෑම අංශයක්ම සලකා බැලීමේ දැඩි අවශ්‍යතාවක් පවතී.

## මුදල් අංශයේ වර්ධනයන්

**අඛණ්ඩව පැවැති අඩු උද්ධමනකාරී පරිසරයක් තුළ, මහ බැංකුව විසින් වසර පුරා මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල්ව පවත්වා ගනු ලැබූ අතර, ඉහළ ණය හා මුදල් ප්‍රසාරණය හේතුවෙන් උද්ධමනය මත ඇතිවිය හැකි අධික ඉල්ලුම් පීඩන මැඩපැවැත්වීමේ අරමුණින් 2015 අග භාගයේ සිට මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම ආරම්භ කරන ලදී.** පසුගිය වසර කිහිපය මුළුල්ලේම පැවැති අඩු පොලී අනුපාතික පරිසරයෙහි බලපෑම හේතුවෙන් පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය නොකඩවා ඉහළ යෑම සැලකිල්ලට ගනිමින්, 2014 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වූ විවට වෙළඳපොළ කටයුතු යටතේ නිත්‍ය තැන්පතු පහසුකම සඳහා ප්‍රවේශ වීමේ දී පනවනු ලැබූ සීමා, 2015 මාර්තු මාසයේ දී මහ බැංකුව විසින් ඉවත් කරන ලදී. මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් කෙටිකාලීන පොලී අනුපාතිකවල ඇතිවිය හැකි ඉහළ උච්චාවචන මැඩපැවැත්වීම සඳහා, මහ බැංකුව 2015 අප්‍රේල් මාසයේ දී, සිය ප්‍රධාන පොලී අනුපාතික වන, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින්, සියයට 6.00 සහ සියයට 7.50 දක්වා පදනම් අංක 50 කින් අඩු කරන ලදී. පුරෝකථන ඉක්මවා යමින් ණය හා මුදල් සමස්ත තවදුරටත් ප්‍රසාරණය වීමත් සමඟ, 2015 වසර අවසානයේ සිට මහ බැංකුව ක්‍රමයෙන් සිය මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට කටයුතු කළේය. ඒ අනුව, එතෙක් ක්‍රියාත්මක වූ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙහි අවසානය සනිටුහන් කරමින්, 2016 ජනවාරි මස 16 වැනි දින ආරම්භ වන සංචිත කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 7.50 දක්වා ප්‍රතිශතාංක 1.50 කින් ඉහළ නංවන ලදී. මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ඇරඹීමටත් පෙර, ආර්ථිකයේ ඇතැම් තෝරාගත් අංශ වෙත අධික ලෙස ණය සැපයීම පාලනය කිරීම සඳහා 2015 අවසාන කාර්තුව තුළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රැසක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, රථවාහන මිලදී ගැනීම සහ භාවිතා කිරීමට ලබා දෙන ණය සහ අත්තිකාරම්වලට අදාළව, රථවාහන ආනයනය සඳහා වාණිජ බැංකු සමඟ ණයවර ලිපි විවෘත කිරීමේ දී බලපවත්වන ලද අවම ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාව පසුව සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ගයක් වශයෙන් ණය සහ අත්තිකාරම්වලට අදාළව වටිනාකම මත උපරිම ණය අනුපාතිකයක් මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී. මෙම ක්‍රියාමාර්ග තුළින් විනිමය අනුපාතික තීරණය කිරීමේ දී වඩාත් නම්‍යශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ රජය විසින් බදු ව්‍යුහයෙහි සිදු කළ වෙනස්කම් යනාදී ක්‍රියාමාර්ග සමඟ සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව ශක්තිමත් කරන අතරම, පෞද්ගලික ණය හා අත්තිකාරම්වල ඉහළ වර්ධනය පාලනය කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරිණි. එසේ වුවත්, අඛණ්ඩව පැවැති අධික මුදල් ප්‍රසාරණය හේතුවෙන්, ඉල්ලුමෙන් ඇදුණු උද්ධමන පීඩනයන් තවත් ඉහළ යෑමේ හැකියාව සලකා බලමින්, පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස, 2016 පෙබරවාරි 19 වන දිනය අවසානයේ සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පදනම් අංක 50 බැගින්, පිළිවෙළින්, සියයට 6.50 සහ සියයට 8.00 දක්වා ඉහළ නංවන ලදී.

**දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවැති රුපියල් ද්‍රවශීලතාව 2014 වසරේ දී දක්නට ලැබුණු මට්ටමට වඩා අඩු වුවද, 2015 වසර පුරා එය අතිරික්තව පැවතුණි.** මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම හා රජයට තාවකාලික අත්තිකාරම් ලබා දීම යන කරුණු හේතුවෙන් වසර මුල දී ඉහළ අතිරික්ත ද්‍රවශීලතාවක් පැවතුණි. කෙසේ වුවත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළට නොකඩවා විදේශ විනිමය සැපයීම, විදේශ ණය ආපසු ගෙවීම, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් නියමිත කාලයට පෙර පියවීම හා නිත්‍ය පදනම යටතේ විකිණීම සහ විශේෂයෙන්ම, මහ මැතිවරණ සමය තුළ ව්‍යවහාර මුදල් නිකුතුව ඉහළ යෑම පිළිබිඹු කරමින්, 2015 අගෝස්තු මාසය පමණ වනතුරු අතිරික්ත ද්‍රවශීලතාව ක්‍රමයෙන් පහළ ගියේය. ඒ අතර කෙටිකාලීන පොලී අනුපාතික ස්ථායීතාව පවත්වා ගැනීමේ අරමුණින්, මහ බැංකුව විසින් එක්දින, කෙටිකාලීන හා දිගුකාලීන පදනම් මත දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව පාලනය කළේය. කෙසේ වුවත්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුවෙන් ලද ලැබීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලට ගැනීම, ප්‍රාථමික වෙළඳපොළෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වැඩි වශයෙන් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයෙන් ලද ලැබීම්වලින් කොටසක් මහ බැංකුව මිලට ගැනීම හේතු කොට ගෙන, 2015 සැප්තැම්බර් මස සිට දේශීය මුදල් වෙළඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාව ඉහළ ගියේය. 2015 වසර තුළ, එක් දින අතිරික්ත ද්‍රවශීලතාව රුපියල් බිලියන 3.3 සිට රුපියල් බිලියන 149.6 දක්වා පරාසයක හා රුපියල් බිලියන 76.6 ක සාමාන්‍ය අගයක පැවැති අතර, 2015 වසර අවසානය වන විට සමස්ත අතිරික්ත ද්‍රවශීලතාව රුපියල් බිලියන 105.3 ක් විය.

**1.8 රූප සටහන** **නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික**




**මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය, මුදල් ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කරණය යන ද්විත්වයෙහිම ලක්ෂණ සහිත වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ ක්‍රියාත්මක කළේය.** මෙම වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ, ආර්ථිකයේ වර්ධනයට උපකාරී වෙමින් මැදිකාලීනව උද්ධමනය මැදි තනි අගයක ස්ථායීව පවත්වා ගැනීමට මහ බැංකුව උත්සාහ කරයි. මීට අදාළ ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාවලිය සැලකූවිට, මුදල් ප්‍රතිපත්තියෙහි මෙහෙයුම් ඉලක්කය වන කෙටිකාලීන පොලී අනුපාතික, විශේෂයෙන් ම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, අපේක්ෂිත දිශාවට හැසිරවීම සඳහා, මහ බැංකුව සිය ප්‍රතිපත්ති උපකරණ භාවිතා කරයි. සංචිත මුදල් තවදුරටත් මෙහෙයුම් ඉලක්කයක් ලෙස සලකනු නොලැබුව ද, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී  ප්‍රධාන අතරමැදි විචල්‍යයක් ලෙස පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) යොදා ගැනෙන අතර, අපේක්ෂිත උද්ධමන ඉලක්ක සහ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සැලකිල්ලට ගනිමින් සකස් කරනු ලබන වාර්ෂික මුදල් වැඩසටහනේ එය ප්‍රධාන විචල්‍යයක් වේ. කෙසේ වුවද, වසර තුළ දී පුළුල් මුදල් සැපයුමේ වර්ධනය, එහි පුරෝකථනය කරන ලද මට්ටම්වලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.


**රාජ්‍ය සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රසාරණය හේතුවෙන් පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනය 2015 වසර තුළ දී ඉහළ ගියේය.** වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් සැපයුමේ වර්ධනය 2014 වසර අවසානයේ පැවැති සියයට 13.4 හා සැසඳීමේ දී 2015 වසර අවසානය වන විට සියයට 17.8 දක්වා ඉහළ ගිය අතර, වසර තුළ දී පුළුල් මුදල් සැපයුමේ සාමාන්‍ය වර්ධනය සියයට 15.2 ක් විය. වසර තුළ දී බැංකු පද්ධතිය තුළ ශුද්ධ විදේශ වත්කම් අඩු වූ අතර, දේශීය ණය ප්‍රසාරණය හේතුවෙන් ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම, පුළුල් මුදල් ප්‍රසාරණය සඳහා මුළුමනින්ම හේතු විය. 2015 වසරේ පළමු මාස දහය තුළ දී බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 413.6 කින් සැලකිය යුතු ලෙස අඩු වුවද, මහ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද විදේශ විනිමයෙන් කොටසක් මිලදී ගැනීමත් සමඟ වසරේ අවසාන මාස දෙක තුළ ශුද්ධ විදේශීය වත්කම්වල යම් ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2015 වසර අවසානයේ දී ශුද්ධ විදේශීය වත්කම්වල පහළ යෑම රුපියල් බිලියන 313.3 ක් විය. මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ විදේශ විනිමය සැපයීම ඉහළ යෑමත් සමඟ, මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් වසර තුළ දී රුපියල් බිලියන 111.8 කින් අඩු විය. මේ අතර, කෙටිකාලීන විදේශ ණය ගැනීම් ඉහළ යෑම මෙන්ම, අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC) සහ නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල (RNNFC) ශේෂ ඉහළ යෑමත් සමඟ වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම් 2015 වසර තුළ දී රුපියල් බිලියන 201.5 කින් අඩු විය. රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙක වෙත ලබා දුන් ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන්, ශුද්ධ දේශීය වත්කම් 2015 වසර තුළ දී සියයට 26.0 කින් එනම් රුපියල් බිලියන 1,003.3 කින් වර්ධනය විය. ශුද්ධ දේශීය වත්කම් තුළ, රජයට ලබා දුන් ශුද්ධ ණය, රජයේ අයවැය මගින් ඇස්තමේන්තුගත සීමාව ඉක්මවා රුපියල් බිලියන 323.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රාජ්‍ය අංශය වෙත ලබා දුන් ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සඳහා, විදේශ මූල්‍ය සම්පත් ලැබීම් ප්‍රමාද වීම, ආදායම් රැස් කිරීම අඛණ්ඩව අඩු වීම සහ රාජ්‍ය වියදම් ඉහළ යෑම හේතුවෙන් රජය දේශීය ණය මූලාශ්‍ර කෙරෙහි වැඩි වශයෙන් යොමු වීම හේතු විය. භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම  ඉහළ යෑමත් සමඟ, මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය 2015 වසර තුළ දී රුපියල් බිලියන 80.3 කින් ඉහළ ගිය අතර, භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල වූ ආයෝජන ඉහළ යෑම හේතුවෙන් වාණිජ බැංකු විසින් රජයට ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 243.3 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, දිගු පරිණත කාල සහිත සුරැකුම්පත් සඳහා වාණිජ බැංකුවල ඇති වරණය අඩු වීම පිළිබිඹු කරමින්, වසර

තුළ දී වාණිජ බැංකු මගින් භාණ්ඩාගාර බැඳුම්කර මත කරන ලද ආයෝජන (ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් හැර) රුපියල් බිලියන 52.2 කින් අඩු විය. රාජ්‍ය බැංකු සමඟ පවත්වාගෙන යනු ලබන රජයේ නොපියවූ අයිරා ශේෂය, 2014 වසර අවසානයේ වාර්තා කළ රුපියල් බිලියන 114.6 හා සැසඳීමේ දී 2015 වසර අවසානය වන විට රුපියල් බිලියන 125.1 දක්වා රුපියල් බිලියන 10.5 කින් ඉහළ ගියේය. රාජ්‍ය සංස්ථා විසින් ලබා ගත් ණය ප්‍රසාරණය 2014 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 80.9 ක ඉහළ යෑම හා සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් බිලියන 76.9 දක්වා සුළු වශයෙන් අඩු විය. ශ්‍රීලංකන් ගුවන් සමාගම, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය සහ වී අලෙවි මණ්ඩලය යන ආයතන ලබාගත් ණය ප්‍රමාණය ඉහළ යෑම, වසර තුළ දී රාජ්‍ය සංස්ථාවලට ලබා දුන් ණය ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා පොහොර සමාගම හා කොළඹ වාණිජ පොහොර සමාගම සිය නොපියවූ ණයවලින් කොටසක් බැංකු අංශය වෙත පියවා ඇත.


**ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පැවැතීමෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකු පද්ධතිය මගින් පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණය ඉහළ වේගයකින් වර්ධනය විය.** වාර්ෂික ලක්ෂ්‍යමය පදනම අනුව, පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය 2014 වසර අවසානයේ වාර්තා කළ සියයට 8.8 ක වර්ධනයට සාපේක්ෂව, 2015 වසර අවසානයේ දී සියයට 25.1 දක්වා ඉහළ ගියේය. ඒ අනුව, පෞද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රමාණය 2014 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 223.9 හා සැසඳීමේ දී 2015 වසරේ දී රුපියල් බිලියන 691.4 කින් වැඩි විය. අඛණ්ඩව අඩු මට්ටමක පැවැති වෙළඳපොළ ණය පොලී අනුපාතික සහ ණය දෙන ආයතන විසින් සිදු කරන ලද තරගකාරී ප්‍රචාරණයෙහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ශීඝ්‍රයෙන් වර්ධනය විය. පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණයෙහි සාමාන්‍ය ඉහළ යෑමට අමතරව, 2015 ඔක්තෝබර් මාසයේ දී ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකුව සහ ඩී.එෆ්.සී.සී. පීඑල්සී ඒකාබද්ධ වී එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ආරම්භ කිරීම හේතුවෙන්, පුළුල් මුදල් සැපයුම තුළ පෞද්ගලික අංශයට බැංකු විසින් ලබා දුන් ණය තොගයට රුපියල් බිලියන 83 ක අමතර ණය ප්‍රමාණයක් ද එකතු වී ඇත. මේ අතර, සුරැකුම් මත ණය සහ අත්තිකාරම් වර්ගීකරණයට අනුව, මෝටර්රථ වාහන ආනයන සඳහා වූ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින්, කල්බදු සහ කුලීපිට ගැනුම් ණය ප්‍රමාණය පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 16.4 ක ඉහළ යෑම හා සාපේක්ෂව 2015 වසරේ දී රුපියල් බිලියන 65.6 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2014 වසරේ රුපියල් බිලියන 140.0 කින් සැලකිය යුතු ලෙස අඩු වූ උකස් ණය අත්තිකාරම්වල අඩු වීම 2015 වසරේ දී රුපියල් බිලියන 38.2 කට සීමා විය. තව ද, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, වසර තුළ දී ආර්ථිකයේ ප්‍රධාන අංශ වෙත ණය අඛණ්ඩව ගලා යෑම පිළිබිඹු කරමින්, සේවා සහ කර්මාන්ත යන අංශ සඳහා ලබා දුන් ණය ප්‍රමාණය, පිළිවෙළින්, සියයට 34.1 කින් සහ සියයට 25.0 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

**වෙළඳපොළ පොලී අනුපාතික වසරේ අවසාන කාලය තුළ දී යම් ඉහළ යෑමක් දක්නට ලැබුණ ද, 2015 වසර තුළ සාපේක්ෂව අඩු මට්ටමක පැවැතිණ.**

**1.9 රූප සටහන** **පුළුල් මුදල්හි ($M_{2b}$) සහ පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය**




**1.10 රූප සටහන** **ද.දේ.නි. යෙහි අනුපාතයක් ලෙස සහ ඉතුරුම්වල අනුපාතයක් ලෙස ණය**



2014 සැප්තැම්බර් මාසයේ සිට නිත්‍ය තැන්පතු පහසුකම් මත සීමා පැනවීම හේතුවෙන් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයටත් වඩා පහළ මට්ටමක පැවැති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය තැන්පතු පහසුකම සඳහා ප්‍රවේශ වීම මත පනවා තිබූ සීමා ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2015 මාර්තු මාසයේ දී ඉහළ ගියේය. 2015 අප්‍රේල් මස පොලී අනුපාතික පහළ දැමීමත් සමග බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඩු වී 2015 අගෝස්තු මාසය දක්වා ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව ආසන්නයෙහි පැවතුණ ද, අනතුරුව එහි කිසියම් ඉහළ යෑමක් පෙන්නුම් කළේය. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ මෙම වෙනස්වීම් තුළින්, දේශීය මුදල් වෙළඳපොළ තුළ අතිරික්ත ද්‍රවශීලතාව අඩු වීම පිළිබිඹු විය. ඒ අනුව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2014 වසර අවසානයේ පැවැති සියයට 6.21 හා සැසඳීමේ දී 2015 වසර අවසානයේ දී සියයට 6.40 ක් විය. මේ අතර, 2015 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම දේශීය ණය සුරැකුම්පත් සඳහා වන පොලී අනුපාතික මත වූ පීඩනය කිසියම් දුරකට අවම කිරීමට හේතු වුවද, රජය වෙත විදේශීය මූල්‍ය සම්පත් ලැබීම ප්‍රමාද වීම හමුවේ රජයේ ඉහළ දේශීය මූල්‍යන අවශ්‍යතා පිළිබඳ වෙළඳපොළ අපේක්ෂා සහ වෙන්දේසි ක්‍රමය මත පමණක් රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා මහ බැංකුව විසින් ගනු ලැබූ තීරණය හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත් ඵලදා අනුපාතික මත ඉහළ පීඩනයක් ඇති විය. මේ අතර, වාණිජ බැංකු විසින් තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී අනුපාතික 2015 වසර තුළ දී අඩු මට්ටමක පැවැතිය ද, වසරේ මැද භාගයේ සිට එම පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ යෑමක් දක්නට ලැබුණි. 2015 වසර අවසානයේ දී, බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය 2014 වසර අවසානයේ පැවැති අගයට සමාන මට්ටමක සියයට 6.20 ක් ලෙස පැවතුණි. බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය 2014 වසර අවසානයේ පැවැති සියයට 7.33 සිට 2015 වසර අවසානයේ දී සියයට 7.57 දක්වා පදනම් අංක 24 කින් ඉහළ ගියේය. ණය සහ අත්තිකාරම්වලට අදාළ මුළු ශේෂයන් මත බර තැබූ එම ණයවලට අදාළ ණය අනුපාතික නිරූපනය කරනු ලබන බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය 2014 වසර අවසානයේ පැවැති සියයට 11.91 සිට 2015 වසර අවසානය වන විට සියයට 11.00 දක්වා පදනම් අංක 91 කින් අඩු විය. කෙසේ වෙතත්, වසරේ අවසාන කාලය තුළ කෙටිකාලීන පොලී අනුපාතිකවල සිදු වූ ක්‍රමික ඉහළ යෑම පිළිබිඹු කරමින්, සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය 2014 වසර අවසානයේ පැවැති සියයට 6.26 සිට 2015 වසර අවසානයේ දී සියයට 7.53 ක් දක්වා පදනම් අංක 127 කින් ඉහළ ගියේය. මහ බැංකුව විසින් අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙන්ම මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අඩු වීම සහ රජයේ මූල්‍ය අවශ්‍යතා ඉහළ යෑම පිළිබිඹු කරමින්, 2016 වසරේ පළමු කාර්තුව තුළ දී ද පොලී අනුපාතික ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.

## මූල්‍ය අංශයේ වර්ධනයන්

**දේශීය මෙන්ම ගෝලීය අවිනිශ්චිතතාවයන් නිසා පැනනගින වෙළඳපොළ උච්චාවචනවලට ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පෙන්නුම් කරමින් මූල්‍ය අංශය 2015 වසරේ දී යහපත් කාර්යසාධනයක් පෙන්වීය.** මූල්‍ය ආයතන පිළිබඳව සලකා බැලූ කල බැංකු අංශය, අඩු පොලී අනුපාතික වාතාවරණය තුළ ණය ඉල්ලුම ඉහළ යෑම නිසා බැංකු ක්ෂේත්‍රයෙහි ව්‍යාපාරික කටයුතුවල ප්‍රසාරණයක් පෙන්නුම් කරන ලද අතර, ඉහළ ලාභදායීත්වය හා අභ්‍යන්තර ප්‍රාග්ධන උත්පාදනය අහිතකර කම්පන නිසා ඇතිවිය හැකි අවදානම් අවශෝෂණය කර ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීමට පාදක වී ඇත. වසර තුළදී බැංකු අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය වර්ධනය විය. මූල්‍ය හා කල්බදු සමාගම් අංශය ද ඉහළ කාර්යසාධනයක් වාර්තා කරන ලද අතර දේශීය මූල්‍ය පද්ධතියේ සමස්ත වත්කම්වලට දරන සාපේක්ෂ දායකත්වය ඉහළ යෑමෙන් මෙම තත්ත්වය පිළිබිඹු විය. ද්‍රවශීලතා ගැටලු සහිත මූල්‍ය ආයතන කිහිපයක තැන්පත්කරුවන් හා ආයෝජකයන් රැක ගැනීම සඳහා 2015 වසරේ දී ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමන මැදිහත්වීම් සිදු කරන ලදී. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ප්‍රාථමික වෙළඳුන්ගේ ව්‍යාපාර ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වුවද, මෙහෙයුම් කටයුතුවල ඉතා සුළු කාර්යසාධනයක් පෙන්නුම් කළ අතර, එක් ප්‍රාථමික ගනුදෙනුකරුවකු ද්‍රවශීලතා ගැටලුවලට මුහුණදීම හේතුවෙන් ආයෝජකයන්ගේ විශ්වාසය අඛණ්ඩව පවත්වා ගැනීමට හා රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි මෙහෙයුම් කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා නියාමන මැදිහත්වීම්වල අවශ්‍යතාව පැනනැගුණි. වෙළඳපොළ පැවැති අඩු පොලී අනුපාතික හමුවේ වුවද ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන පසුගිය වසරේ ලැබූ ප්‍රතිලාභවලට ආසන්න ව්‍යාපාර ප්‍රතිලාභයක් ලබා ගැනීමට සමත් විය. අනෙකුත් බැංකු නොවන මූල්‍ය ආයතන ද, ව්‍යාපාර වර්ධනයන් වාර්තා කළ ද ඒවායේ ව්‍යාපාර ආකෘති මෙන්ම පැවැති මූල්‍ය වෙළඳපොළ තත්ත්ව

හමුවේ මිශ්‍ර මෙහෙයුම් කාර්යසාධනයක් පෙන්වීය. වසර තුළ, ගෝලීය අවිනිශ්චිතතාව නිසා පැන නැගුණු මුදල් හා ගෙවුම් තුලන තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස දේශීය මූල්‍ය වෙළඳපොළ ඉහළ උච්චාවචනයකින් යුතුව මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී. මේ අතර, විශාල හා සුළු පරිමාණ වටිනාකම් සහිත දේශීය ගෙවීම් හා පියවීම් පද්ධතිය කිසිදු බාධාවකින් හා ස්ථායිතා ගැටලුවලින් තොරව සුමටව ක්‍රියාත්මක වූ අතර, මූල්‍ය අංශයේ වර්ධනය වෙමින් පවතින විවිධ ගෙවීම් අවශ්‍යතා සඳහා ඉහළ කාර්යක්ෂමතාවකින් හා සුරක්ෂිතතාවයකින් පහසුකම් සලසන ලදී.

**නව විචක්ෂණශීලී නියාමන පිළිබඳව සලකා බැලූ කල, බැංකුවල ද්‍රවශීලතා අවදානම කළමනාකරණය ශක්තිමත් කිරීමට හා බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය අවදානම කළමනාකරණය කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දීම, අවසර නොලත් මූල්‍ය ව්‍යාපාර මැඩලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම යනාදිය බලපත්‍රලාභී බැංකු හා බැංකු නොවන මූල්‍ය අංශයේ දක්නට ලැබුණු ප්‍රධාන ප්‍රවණතා වේ.** තවද, මහජනතාව අතර විද්‍යුත් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව වැඩි වටිනාකම් හා කුඩා පරිමාණයේ විද්‍යුත් මුදල් හුවමාරු සඳහා බැංකු මගින් ගනුදෙනුකරුවන්ගෙන් එක් ගනුදෙනුවකට අය කරන ගාස්තු සඳහා උපරිම සීමාවක් පනවන ලදී. රක්ෂණ සමාගම් අංශයෙහි හිමිකම්ලාභීන්ගේ සුරක්ෂිතතාවය සඳහා ව්‍යවස්ථාපිත කාලරාමුවක් තුළ රක්ෂණ හිමිකම් පියවීමට නියාමන රාශියක් ක්‍රියාවට නැංවීම, ප්‍රතිලාභ ස්ථායීතාවය ඉහළ නැංවීම සඳහා රක්ෂණ තැරැව්කරුවන්ට අවම ශුද්ධ ප්‍රාග්ධන මට්ටමක් පැනවීම, ගනුදෙනුකරුවන්ගේ සුරක්ෂිතභාවය සඳහා රක්ෂණ නියෝජිතයන් විසින් කරනු ලබන ව්‍යාපාර ප්‍රවර්ධනය සුසංවිධිත කිරීම, රක්ෂණ සමාගම්වල අවදානම් කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීමේ අරමුණින් සියලුම රක්ෂණ සමාගම් අවදානම් මත පදනම් වූ නුබුන්වත් ආන්තිකයන්ට අනුගත වීමේ අවශ්‍යතාව (අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධනය) ආදී නියාමන රාශියක් 2015 වසරේ දී ගනු ලැබිණ. නියාමනයේ පවතින අඩුපාඩු ආවරණය වන පරිදි ප්‍රාග්ධන වෙළඳපොළ වර්ධනය කිරීමේ ප්‍රධාන සැලැස්මක් ක්‍රියාවට නැංවීම, අවදානම් කළමනාකරණය සහ මහජනයා දැනුම්වත් කිරීම හා කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම් වර්ගීකරණය කිරීම සඳහා ගෝලීය කර්මාන්ත වර්ගීකරණ ප්‍රමිතියකට අනුගත වීම යනාදිය, ලැයිස්තුගත ණය, හිමිකම් ප්‍රාග්ධන හා ඒකකභාර අතර වෙළඳපොළවල් වර්ධනය සඳහා ගනු ලැබූ අනෙකුත් ප්‍රධාන ක්‍රියාමාර්ග වේ.

## 1.3 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරිදැක්ම

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook) අනුව, දියුණු ආර්ථිකයන් නැවත යථා තත්ත්වයට පත්වීම මධ්‍යස්ථ මට්ටමක පැවතීම හමුවේ වුව ද, නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි වර්ධනය අඩු වීම හේතුවෙන් 2015 වසරේ දී ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමීව පැවැතුණි.** වසර තුළ දී ඇතැම් දියුණු ආර්ථිකයන්හි නිමවුම් පරතරය අඩු වූ බැවින්, දියුණු ආර්ථිකයන් ගණනාවක සහ ඔවුන් සමඟ ගනුදෙනු කරන නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්ගේ ක්‍රියාකාරිත්වය එකිනෙකට වෙනස් වූ අතර නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්ට නව අභියෝගවලට මුහුණදීමට සිදුවිය. ප්‍රධාන නැගී එන වෙළඳපොළ ආර්ථික කටයුතුවල ප්‍රතිතුලනය සහ වෙළඳ භාණ්ඩවල මිල පහළ මට්ටමක පැවැතීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ගෝලීය වෙළඳපොළේ බනිජතෙල් මිල ගණන් අඛණ්ඩව පහළ යෑම ලෝකයේ බොහොමයක් රටවල උද්ධමනය පහළ මට්ටමක පවත්වාගෙන යෑමට උපකාරී වුවද, තෙල් අපනයනය කරන රටවල රාජ්‍ය මූල්‍ය අංශයේ මෙන්ම විදේශීය අංශයේ කටයුතුවලට ඇති අවකාශය සීමා විය. අඩු වර්ධන අපේක්ෂාවන්, දුර්වල වෙළඳ මිල අනුපාතය සහ ඇමෙරිකා එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමෙන් ඇති වන බලපෑම් හමුවේ වසර තුළ දී විදේශ ව්‍යවහාර මුදල් කිහිපයක් අවප්‍රමාණය වීමේ පීඩනයට ලක් විය.

**විශාල නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි ක්‍රියාකාරිත්වයෙහි අහිතකර බලපෑම හේතුවෙන් ගෝලීය ආර්ථික වර්ධනය අඩු මට්ටමේම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.** ඒ අනුව, ගෝලීය ආර්ථික වර්ධනය 2016 වසරේ දී සියයට 3.2 ක් ද 2017 වසරේ දී සියයට 3.5 ක් ද වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ගෝලීය වශයෙන් පවතින අභියෝග හමුවේ වුව ද, ඉහළ යන කුටුම්බ වියදම් සහ ශක්තිමත් වන ශ්‍රම වෙළඳපොළ හේතුවෙන් එක්සත් ජනපද ආර්ථිකය සුළු වශයෙන් වුවද අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි ෆෙඩරල් සංචිත බැංකුව අපේක්ෂා කෙරෙයි. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියෙන් වන සංකෝචනයන් මත බලපෑම අවම කරමින්, එංගලන්ත මහ බැංකුවෙහි ලිහිල් මුදල් ප්‍රතිපත්තිය සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය පෞද්ගලික ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් එක්සත් රාජධානි ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම ශක්තිමත් විය. කෙසේ වුවත්, 2016 වසර මැදදී පවත්වන්නට නියමිත එක්සත් රාජධානියේ යූරෝ කලාපීය

සාමාජිකත්වය පිළිබඳ ජනමත විචාරණයෙහි අවිනිශ්චිත තත්ත්වය මගින් එක්සත් රාජධානි ආර්ථිකයේ ධනාත්මක ඉදිරි දැක්ම කෙරෙහි බලපෑම් ඇති විය හැකිය. උද්ධමන අපේක්ෂාවන් දුර්වල මට්ටමක පවතින ජපානයේ ඉදිරි ආර්ථික දැක්ම පිළිබඳ පුරෝකථන පහත හෙළීම මගින් දියුණු ආර්ථිකයන්ගේ වර්ධන අපේක්ෂාවන් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කෙරිණි. මීට අමතරව, යූරෝ කලාපයේ උද්ධමනය, අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවැතීම, කලාපයේ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත. යුරෝපීය මහ බැංකුව මෑතකදී සිය ප්‍රධාන පොලී අනුපාතිකයන් අඩු කිරීම සහ බැඳුම්කර මිලදී ගැනීම ඉහළ දැමීම, උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම යහපත් කිරීමට උපකාරී විය හැකි වුව ද, ත්‍රස්ත ක්‍රියා ආශ්‍රිතව ඇතිවන තත්ත්වයන් සහ මැද පෙරදිග හා අප්‍රිකාවෙන් වූ සරණාගත පැමිණීම්හි වැඩිවීම හේතුවෙන් කලාපයේ වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම සීමා කරනු ඇත. නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් අතුරින්, චීනය සිය වර්ධන උපායමාර්ග, ආයෝජන පදනම් කරගත් වර්ධන උපායමාර්ගයක සිට දේශීය පරිභෝජනය පදනම් කරගත් උපායමාර්ගයක් වෙත වෙනස් කිරීම තුළින් පුළුල් පරාසයක පැතිරුණු ප්‍රතිවිපාක ඇති කරනු ඇතැයි අපේක්ෂිතය. කෙටි කාලීනව මෙම වෙනස්වීම වෙළඳ හා මූල්‍ය ප්‍රවාහ ඔස්සේ අනෙකුත් රටවලට බලපෑම් ඇති කරනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, ශක්තිමත් දේශීය ඉල්ලුම සහ පෞද්ගලික ආයෝජනය ඉහළ යෑම හා සමගාමීව අඩු උද්ධමන වාතාවරණය, සැලකිය යුතු ලෙස විදේශීය සෘජු ආයෝජන ලැබීම හා සැපයුම් අංශය සඳහා ගන්නා ලද විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් ඉන්දියාවේ ආර්ථික වර්ධනය තිරසාරව පවත්වා ගෙන යා හැකි වේ යැයි අපේක්ෂා කෙරෙයි.

**1.4 සංඛ්‍යා සටහන** **ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)**

| ශීර්ෂය | 2014 | 2015 | 2016 පුරෝකථන | 2017 පුරෝකථන |
|---|---|---|---|---|
| **ලෝක නිෂ්පාදිතය** | **3.4** | **3.1** | **3.2** | **3.5** |
| සංවර්ධිත ආර්ථිකයන් | 1.8 | 1.9 | 1.9 | 2.0 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 2.4 | 2.4 | 2.4 | 2.5 |
| යූරෝ කලාපය | 0.9 | 1.6 | 1.5 | 1.6 |
| එක්සත් රාජධානිය | 2.9 | 2.2 | 1.9 | 2.2 |
| ජපානය | 0.0 | 0.5 | 0.5 | -0.1 |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 4.6 | 4.0 | 4.1 | 4.6 |
| සංවර්ධනය වන ආසියාව | 6.8 | 6.6 | 6.4 | 6.3 |
| චීනය | 7.3 | 6.9 | 6.5 | 6.2 |
| ඉන්දියාව | 7.3 | 7.3 | 7.5 | 7.5 |
| **ලෝක වෙළඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **3.4** | **2.8** | **3.1** | **3.8** |
| ආනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 3.4 | 4.3 | 3.4 | 4.1 |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 3.7 | 0.5 | 3.0 | 3.7 |
| අපනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 3.4 | 3.4 | 2.5 | 3.5 |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 2.9 | 1.7 | 3.8 | 3.9 |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 1.4 | 0.3 | 0.7 | 1.5 |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 5.1 | 4.7 | 4.5 | 4.2 |
| වෙළඳ ද්‍රව්‍ය මිල (එ.ජ.ඩොලර්) | | | | |
| ඉන්ධන | -7.5 | -47.2 | -31.6 | 17.9 |
| ඉන්ධන නොවන | -4.0 | -17.5 | -9.4 | -0.7 |
| **එ.ජ.ඩොලර් තැන්පතු මත සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය (සියයට)** | **0.3** | **0.5** | **0.9** | **1.5** |

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස

මූලය: World Economic Outlook (2016 අප්‍රේල්), ජා.මූ.අ.

**2015 වසර මුළුල්ලේ වෙළඳ භාණ්ඩ මිල අඩු වීම ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි අභියෝග ගණනාවක් ඇති කළේය.** මෑත කාලීනව ජාත්‍යන්තර වෙළඳපොළ තුළ භාණ්ඩ මිල පහළ යෑම, බලශක්ති, ලෝහ හා ඛනිජ වර්ග සහ කෘෂිකර්ම යන අංශ ද ඇතුළත්ව සියලු වෙළඳ භාණ්ඩ අංශ වෙත පැතිරුණි. සමස්තයක් වශයෙන්, වෙළඳ භාණ්ඩ අපනයනය කරන රටවල්, අඩු ආර්ථික වර්ධන අපේක්ෂාවන්, දේශීය මුදල් ඒකක අවප්‍රමාණය වීම්, අපනයන ආදායම් අඩු වීම සහ ජංගම ගිණුමේ පිරිහීම් යන තත්ත්වයන්ට මුහුණ දුණි. මෙම ආර්ථිකයන් මුදලේ අවප්‍රමාණය වීම සහ ප්‍රාග්ධන ගලා යෑම් සඳහා ප්‍රතිචාර දැක්වීමක් ලෙස මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීමට සහ විදේශ විනිමය වෙළඳපොළෙහි මැදිහත්වීම ඉහළ දැමීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කළේය. භාණ්ඩ මිල අඩු වීම තුළින් ශුද්ධ ආනයන අගයක් පවතින රටවලට වාසි සහගත තත්ත්වයක් ඇති වී ඇති අතර ශුද්ධ අපනයනකරුවන් සහ ශුද්ධ ආනයනකරුවන් අතර ඇති සම්බන්ධය නිසා භාණ්ඩ මිල අඩු වීම හේතුවෙන් වූ ඉතිරිකිරීම්වල බලපෑම, ප්‍රේෂණ, සංචාරක ඉපැයීම්, ප්‍රාග්ධන ප්‍රවාහ සහ විදේශීය ප්‍රදාන ආදී ලැබීම් අඩු වීම නිසා අඩු විය.

**ගෝලීය ආර්ථික වාතාවරණයේ සිදු වූ වෙනස්වීම් 2015 වසරේ දී ශ්‍රී ලංකාවට අභියෝග කිහිපයක් මතු කළ අතර, මෙම තත්ත්වයන් 2016 වසරේදී ද තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ගෝලීය තෙල් මිල අඛණ්ඩව අඩු වීම මධ්‍යයේ, මැදපෙරදිග රටවල පැවැති මන්දගාමී ආර්ථික වර්ධනය, විදේශ විනිමය ලැබීමේ ප්‍රධාන මූලාශ්‍ර වන විදේශීය නියුක්තිකයින්ගේ ප්‍රේෂණ

සහ තේ අපනයනයෙන් ලැබෙන ආදායම කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කළේය. මෙම ප්‍රවණතාවය සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කෙරෙහි මෙන්ම ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන් සඳහා වන අනාගත රැකියා අවස්ථා කෙරෙහි තවදුරටත් බලපෑම් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, 2015 වසරේ දී සංචාරක ඉපැයීම් සැලකිය යුතු ලෙස වර්ධනය වුවද, ශ්‍රී ලංකාව වෙත සංචාරකයන් පැමිණෙන ප්‍රධාන මූලාශ්‍ර වන යුරෝපය, රුසියාව සහ චීනය වැනි රටවල වර්ධන ප්‍රවණතාව අඩු වීම නිසා ඉදිරි වසර තුළ දී සංචාරක ඉපැයීම් අඩු විය හැක. එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය සාමාන්‍යකරණය කරනු ඇතැයි යන අපේක්ෂාව හේතුවෙන් සියලුම නැගී එන ආර්ථිකයන්හි දේශීය රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් ද විදේශීය ආයෝජන සැලකිය යුතු ලෙස ආපසු ගලායෑමක් වසර තුළදී වාර්තා විය. 2015 වසරේ දෙසැම්බර් මස ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දැමීමෙන් අනතුරුව සහ 2016 වසරේ දී පොලී අනුපාතික තවදුරටත් ඉහළ දමනු ඇතැයි යන අපේක්ෂාවන් සමඟ මෙම ප්‍රවණතාව තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. මීට අමතරව, ශ්‍රී ලංකා රජය, පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් විචල්‍ය පොලී අනුපාතික යටතේ ලබාගත් විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් ඉහළ යනු ඇත. ගෝලීය ආර්ථික වර්ධනය අඩු වීම සහ භූ-දේශපාලනික වෙනස්කම් යනාදී කරුණු මත ඇති වූ ගෝලිය ආර්ථික අවිනිශ්චිතතා හේතුවෙන්, මූලික වශයෙන් චීනය සහ එහි වෙළඳ හවුල්කාර රටවලින් සහ මැදපෙරදිග රටවල්වලින් ලැබෙන විදේශීය සෘජු ආයෝජන සඳහා සෘජු හෝ වක්‍ර බලපෑමක් ඇති කළ හැකිය.

## 1.4 මධ්‍යකාලීන සාර්ව ආර්ථික දැක්ම

**ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2016 වසරේ දී සියයට 5.8 ක අනුපාතයකින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, මධ්‍ය කාලීනව ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කරමින් සියයට 7 ක පමණ ඉහළ වර්ධන මාවතකට පිවිසීමට අපේක්ෂා කෙරේ.** පසුගිය කාලයේ අඩු වී තිබූ ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ යෑම තුළින් අපේක්ෂිත වර්ධන මාවත ළඟා කර ගැනීමට අපේක්ෂිතය. තවදුරටත්, ආයෝජනයට සුදුසු වාතාවරණයක් නිර්මාණය කිරීම තුළින් පෞද්ගලික අංශයේ දායකත්වය ඉහළ දැමීම සහ ආර්ථිකයේ සියලු අංශයන්හි වර්ධනය වේගවත් කිරීමට රජය නව ප්‍රතිපත්ති හඳුන්වා දීම යනාදිය ද මැදි කාලීනව ආර්ථිකයේ වර්ධනයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකය තුළට අවතීර්ණ වීමට සුළු හා මහා පරිමාණ ව්‍යවසායකයන් දිරිමත් කිරීමට ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ එමගින් ශ්‍රී ලංකාව ගෝලීය අගය දාමය තුළ පිහිටුවීම මගින් කාර්මික, කෘෂිකාර්මික සහ සේවා යන අංශ සියල්ලෙහිම වර්ධනයට වන දායකත්වය ඉහළ නැංවීමට අපේක්ෂිතය. ඒ අනුව, දියුණු තාක්ෂණය භාවිතා කිරීම සහ එමගින් ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම, තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර ප්‍රමුඛයන් ඇතුළත් නව ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ සමාජ ආර්ථික යටිතල පහසුකම්වල ඵලදායීව උපයෝජනය කිරීම මගින් ආර්ථිකයේ වර්ධන විභවතාව වැඩිදියුණු කිරීමට අපේක්ෂා කර ඇත. ගෝලීය ආර්ථිකය ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීම, ශ්‍රී ලංකාවේ බාහිර ඉල්ලුම යහපත් මට්ටම්වල පවත්වා ගෙන යෑමට අවශ්‍ය පසුබිම සැකසෙනු ඇතැයි ද අපේක්ෂිතය. කෙසේ වුවද, මෙම වර්ධනය වූ බාහිර ඉල්ලුම තුළින් අපේක්ෂිත ඉහළ ආදායම් මට්ටම්, ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් රටක් බවට පත්වීමට උපකාරී වනු ඇති නමුත් මැදි ආදායම් ලබන රටක් ලෙස දිගු කාලයක් රැඳී සිටීමේ අවදානම හා සම්බන්ධ නව අභියෝගවලට මුහුණ දීමට සිදු වනු ඇත. වඩා සුදුසු මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ආයෝජන සඳහා උචිත පරිසරයක් නිර්මාණය කරනු ඇතැයි අපේක්ෂිතය. ඒ අනුව, උද්ධමනය සියයට 4.0 ක පමණ වූ පහළ අගයක පවත්වා ගෙන යෑමට ඇස්තමේන්තු කර ඇත. මේ අතර, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම කෙරෙහි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුළින් අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත.

**මෑතකාලීනව ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ බද්ධ වූ දේශීය සහ ගෝලීය ආර්ථිකයේ ධනාත්මක වර්ධනයන්හි ප්‍රතිඵලයක් ලෙස මධ්‍ය කාලීනව විදේශීය අංශයේ දැක්ම හිතකර වනු ඇතැයි අපේක්ෂිතය.** ජංගම ගිණුමේ හිඟය පහළ යෑමට, වෙළඳ භාණ්ඩ හා සේවා වෙළඳාම වැඩිදියුණු වීම වැඩි වශයෙන් උපකාරී වනු ඇතැයි අපේක්ෂිතය. ජාත්‍යන්තර තෙල් මිල ගණන් පහළ මට්ටමක පැවැතීම සහ විදේශ විනිමය අනුපාතය නිර්ණය වීමට ඉහළ නම්‍යතාවයක් ලබාදීම හේතුවෙන් මෝටර් රථ ආනයනය පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, 2016 වසරේ දී ආනයන වියදම පහළ යෑමක් අපේක්ෂා කළ ද ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල ගණන්වල අපේක්ෂිත ඉහළ යෑම හා ආර්ථිකය නව වර්ධන මාවතට පිවිසීමට අවශ්‍ය ආයෝජන භාණ්ඩ ආනයනය වර්ධන වීමෙන් පසුව, ඉදිරියේදී ආනයන වියදම්වල ඉහළ යෑමක් අපේක්ෂා කරයි. ඵලදායීතාව ඉහළ යෑම මගින් ඉහළ ගිය බාහිර

තරගකාරිත්වය සහ ගෝලීය ඉල්ලුම යථා තත්ත්වයට පත්වනු ඇතැයි වන අපේක්ෂාව සමඟ 2015 වසරේ දී පසුබෑමක් වාර්තා කළ අපනයන, මැදිකාලයේ දී ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, ශ්‍රී ලංකාව ගෝලීය අගය දාමය තුළ ස්ථාපිත කිරීමට හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබීම මගින් වෙළඳ අංශයේ සේවා ඉපැයුම් ක්‍රමිකව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දේශීය රැකියා අවස්ථා ඉහළ යෑම, අර්ධ-පුහුණු හා පුහුණු කාණ්ඩ යටතේ සංක්‍රමණය අධෛර්යමත් කිරීම සහ මැදපෙරදිග හා යුරෝපය වැනි සාම්ප්‍රදායික ගමනාන්තවල ආර්ථික හා භූ-දේශපාලන අවිනිශ්චිතාවයන්හි ප්‍රතිඵලයක් ලෙස විදේශ රැකියා සඳහා වන සංක්‍රමණයන් අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල පසුබෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ. මූල්‍ය ගිණුමේ ගලාඒම්වල අපේක්ෂිත ඉහළ යෑම සමඟ ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය ද මැදි කාලීනව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආයෝජකයන් සඳහා බාධා රහිත පරිසරයක් නිර්මාණය කිරීමට ආයෝජන මණ්ඩලය මගින් සියලු කාර්යයන් එකම ස්ථානයකින් ඉටුකර ගැනීමේ පහසුකම් සහිත ඒකකයක් (one-stop-shop) පිහිටුවීම ඇතුළුව රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් විදේශ ඍජු ආයෝජන සැලකිය යුතු ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂිතය. ගෙවුම් තුලනයේ අපේක්ෂිත වර්ධනයත් සමඟ රටෙහි විදේශ සංචිත ශක්තිමත් කරමින් බාහිර කම්පනයන්ට මුහුණ දීමේ හැකියාව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීමේ පුළුල් සංවර්ධනාත්මක අරමුණු ළඟාකර ගැනීම සඳහා උපකාරී වන පරිදි අයවැය හිඟය සහ රජයේ ණය තිරසාර මට්ටමක පවත්වා ගනිමින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා රජයේ මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් යොමු වී ඇත.** රජයේ ආදායම ඉහළ නැංවීම සහ වියදම් තාර්කීකරණය කිරීම සඳහා රජය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රමෝපායයන් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය මැදි කාලීනව ඉටුකර ගැනීම සඳහා පහසුකම් සලසනු ඇත. 2003 අංක 03 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතෙහි සංශෝධනයන් සහ 2015 නොවැම්බර් මාසයේ දී රජය විසින් ප්‍රකාශයට පත්කළ පරිදි, වසර 2020 වන විට අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.5 දක්වා අඩු කිරීමට අපේක්ෂිත අතර, රාජ්‍ය ණය සහ ද.දේ.නි. අතර අනුපාතය මෙම කාලය තුළ සියයට 60.0 දක්වා අඩු කිරීමට අපේක්ෂිතය. ආදායම් අංශය සැලකීමේ දී සරල බදු ක්‍රමයක්, පුළුල් බදු පදනමක්, ඉහළ බදු අනුකූලතාවක් සහ වැඩි දියුණු වූ බදු පරිපාලනයක් මගින් රජයේ ආදායම් රැස් කිරීම ඉහළ නැංවීමට අපේක්ෂිතය. මේ අතර, ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා රේගුවෙහි තනි ප්‍රවේශ පද්ධතිය සහ මහා භාණ්ඩාගාරයෙහි ඒකාබද්ධ භාණ්ඩාගාර තොරතුරු හා කළමනාකරණ පද්ධතීන් මගින් ආදායම් පරිපාලන ක්‍රියාවලියෙහි සැලකිය යුතු වර්ධනයක් සිදු වනු ඇතැයි අපේක්ෂිතය. දැනට සිදු කෙරෙමින් පවතින රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියට තවදුරටත් සහාය දක්වමින් රාජ්‍ය වියදම් තාර්කීකරණය කිරීම හා රාජ්‍ය ආයෝජන තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව තුළ අයවැය ක්‍රියාත්මක කිරීමේ හා නියාමනය කිරීමේ ඒකකය පිහිටුවීම වැනි ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී. වියදම් අංශය සැලකීමේ දී, රජයේ වියදම් තාර්කීකරණය සඳහා වන රජයේ ප්‍රයත්නය සහ ඵලදායී නොවන වියදම් කපා හැරීම මගින් පුනරාවර්තන වියදම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මැදි කාලීනව සියයට 15.0 ට වඩා අඩු මට්ටමක පවත්වාගෙන යාමට අපේක්ෂිතය. ඒ අනුව, රජයේ ඉතුරුම් තත්ත්වය පිළිබිඹු කරන වර්තන ගිණුමේ ශේෂය මැදි කාලීනව ක්‍රමයෙන් වර්ධනය වෙමින් තිරසාර මාවතකට යොමු වනු ඇතැයි අපේක්ෂිතය.

**මැදිකාලීන මුදල් ප්‍රතිපත්තිය, උද්ධමනය මැදි-තනි අගයක මට්ටමේ පවත්වා ගැනීම සහ ආර්ථිකයට ළඟාකර ගත හැකි උපරිම නිෂ්පාදන මට්ටම අත්කර ගැනීමට පහසුකම් සැපයීම කෙරෙහි යොමු වනු ඇත.** ඒ යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්, මිල හා ආර්ථික ස්ථායීතාව ඉලක්ක කරගනිමින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවකට නැඹුරු වූ වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් තුළ ක්‍රියාත්මක කරනු ඇත. මෙම මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත දිශාවට හැසිරවීම සඳහා විශේෂයෙන්, වෙළඳපොළ පදනම් කරගත් ප්‍රතිපත්ති පොලී අනුපාතික උපකරණ සහ විවට වෙළඳපොළ ක්‍රියාකාරකම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ. පුළුල් මුදල් සැපයුම, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී යොදා ගන්නා ප්‍රධාන අතරමැදි විචල්‍යයක් ලෙස අඛණ්ඩව පවතිනු ඇත. ඒ අනුව, පුළුල් මුදල් සැපයුමේ වර්ධනය ප්‍රධාන විචල්‍යයක් ලෙස සලකනු ලබන වාර්ෂික මුදල් වැඩසටහන, අපේක්ෂිත නාමික දළ දේශීය නිෂ්පාදිතයට හා ගැළපෙන පරිදි පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. මේ අතර, මෑතකදී ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ලබාගනිමින් 2015

**1.5 සංඛ්‍යා සටහන**

**මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව (අ)**

| දර්ශකය | ඒකකය | 2014 (ආ) | 2015 (ඇ) | පුරෝකථන | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 | 2017 | 2018 | 2019 |
| **මූර්ත අංශය** | | | | | | | |
| මූර්ත ද.දේ.නි. වර්ධනය (ඈ) | සියයට | 4.9(ඇ) | 4.8 | 5.8 | 6.3 | 7.0 | 7.0 |
| වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (ඈ) | රුපියල් බිලියන | 10,448(ඇ) | 11,183 | 12,307 | 13,614 | 15,155 | 16,863 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය | සියයට | 3.3(ඇ) | 0.9 | 4.0 | 4.0 | 4.0 | 4.0 |
| ඒක පුද්ගල ද.දේ.නි (ඈ) | එ.ජ.ඩොලර් | 3,853(ඇ) | 3,924 | 4,008 | 4,298 | 4,704 | 5,181 |
| මුළු ආයෝජන (ඈ) | ද.දේ.නි.යේ % වශයෙන් | 32.0(ඇ) | 30.1 | 30.3 | 30.9 | 31.0 | 32.0 |
| දේශීය ඉතිරිකිරීම් (ඈ) | ද.දේ.නි.යේ % වශයෙන් | 24.0(ඇ) | 22.6 | 23.8 | 24.6 | 25.3 | 26.7 |
| ජාතික ඉතිරිකිරීම් (ඈ) | ද.දේ.නි.යේ % වශයෙන් | 29.5(ඇ) | 27.8 | 28.1 | 29.1 | 29.5 | 30.6 |
| **විදේශීය අංශය** | | | | | | | |
| වෙළඳ පරතරය (ඈ) | ද.දේ.නි.යේ % වශයෙන් | -10.4 | -10.2 | -9.5 | -9.7 | -9.7 | -9.6 |
| අපනයන | එ.ජ.ඩොලර් මිලියන | 11,130 | 10,505 | 10,853 | 11,542 | 12,057 | 12,589 |
| ආනයන | එ.ජ.ඩොලර් මිලියන | 19,417 | 18,935 | 18,920 | 20,500 | 21,940 | 23,387 |
| ජංගම ගිණුමේ ශේෂය (ඈ) | ද.දේ.නි.යේ % වශයෙන් | -2.5 | -2.4 | -2.1 | -1.8 | -1.5 | -1.4 |
| විදේශීය නිල සංචිත | ආනයනික මාස වශයෙන් | 5.1 | 4.6 | 4.0 | 4.2 | 4.5 | 4.6 |
| **රාජ්‍ය මූල්‍ය අංශය (ඉ)** | | | | | | | |
| සමස්ත ආදායම් සහ ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 11.5 | 13.1 | 12.7 | 13.5 | 13.9 | 14.9 |
| වියදම හා ශුද්ධ ණය දීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 17.2 | 20.5 | 18.0 | 18.5 | 18.4 | 18.9 |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -1.2 | -2.2 | -1.4 | -0.7 | 0.0 | 0.6 |
| සමස්ත අයවැය හිඟය | ද.දේ.නි.යේ % වශයෙන් | -5.7 | -7.4 | -5.4 | -5.0 | -4.5 | -4.0 |
| මධ්‍යම රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 70.7 | 76.0 | 74.0 | 70.0 | 66.0 | 63.0 |
| **මුදල් අංශය (ඊ)** | | | | | | | |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) | සියයට | 13.4 | 17.8 | 9.0 | 10.5 | 11.5 | 11.5 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය | සියයට | 8.8 | 25.1 | 12.0 | 11.0 | 11.5 | 12.0 |

(අ) 2016 මාර්තු මැද වනවිට පැවැති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඉ) මැදි කාලීන රාජ්‍ය මූල්‍ය දර්ශක මුදල් අමාත්‍යාංශය විසින් සංශෝධනය කරන ලද 2016 වසර සඳහා වූ සංඛ්‍යා දත්ත මත පදනම් වේ.
(ඊ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ දී ඉහළ අගයකින් වර්ධනය වූ ණය සහ මුදල් සමස්තවල වර්ධනය මැදිකාලීනව මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් උද්ධමනය මැදි-තනි අගයක මට්ටමේ පවත්වා ගැනීම සහතික කරනු ඇත. උද්ධමන අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන අතරම, ආර්ථිකය ඉහළ වර්ධන මාවතකට අවතීර්ණ වීම සඳහා පහසුකම් සැපයීමට ප්‍රමාණවත් පරිදි ණය ආර්ථිකය තුළ පවත්වා ගැනීම තහවුරු කිරීමට මහ බැංකුව ක්‍රියාකරනු ඇත. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීමට රජය විසින් ගන්නා ප්‍රයත්නයන්ට සමගාමීව බැංකු අංශය වෙතින් රජයට ලබාදෙන ණය පහළ යනු ඇතැයි අපේක්ෂිත අතර, එමගින් වඩාත් ඵලදායී පෞද්ගලික ආයෝජන සඳහා අමතර සම්පත් ප්‍රමාණයක් මුදාහැරිය හැකි වනු ඇත. ගෙවුම් ශේෂයෙහි මූල්‍ය ගිණුම සඳහා වන අපේක්ෂිත ඉහළ ලැබීම් සමග බැංකු පද්ධතිය සතු විදේශීය වත්කම් ඉහළ යනු ඇතැයි ද අපේක්ෂිතය.

## 1.5 ගැටලු සහ ප්‍රතිපත්ති

සැලසුම් කරන ලද මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ළඟා කරගැනීම, රාජ්‍ය ණය අඩුකර ගැනීම සහ යහපත් සාර්ව ආර්ථික දැක්මක් සඳහා වන අපේක්ෂාවන් ශක්තිමත් කිරීම සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ තුළින් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය වර්ධනය කරගැනීම ප්‍රධාන අවශ්‍යතාවක් වේ. රජයේ ආදායම ඉහළ නැංවීම, රජයේ වියදම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ විශේෂයෙන් රජය සතු ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු අනෙක් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වර්ධනය කිරීම මෙහිදී වැදගත් වේ. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ළඟාකර ගැනීම සඳහා පසුගිය රජයන් විසින් ප්‍රයත්න දැරුව ද විශේෂයෙන් බදු ආදායම ඇතුළු රජයේ ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසර කිහිපයේ දී අඩු විය. කෙසේ නමුත්, එක් වරක් පමණක් ගෙවිය යුතු බදු හඳුන්වා දීම

සහ මෝටර් වාහන ආනයන මත වූ නිෂ්පාදන බදු ආදායම ඉහළ යැම හේතුවෙන් 2015 වසරේ දී ආදායම ඉහළ යන ලදී. බදු ගෙවීම් පැහැරහැරීම සහ මගහැරීම, අධික බදු සහන හා බදු නිදහස් කිරීම්, කලින් කලට ගනු ලබන රාජ්‍ය ආදායම ආශ්‍රිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ආදායම් පරිපාලනයෙහි පවතින දුර්වලතා මේ සඳහා විශාල වශයෙන් හේතු විය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම අඩුවීමේ ප්‍රවණතාව තිරසාර පදනමක් යටතේ වෙනස් කිරීම සඳහා හා බදු ක්‍රම තුළින් බදු රැස් කිරීමට ඇති හැකියාව වර්ධනය කර ගැනීම සඳහා රටෙහි බදු ව්‍යුහය තවදුරටත් තාර්කීකරණය කිරීම අවශ්‍ය වේ. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා බදු ව්‍යුහය සරල කිරීම, බදු පදනම පුළුල් කිරීම, බදු අනුකූලතාව ඉහළ නැංවීම, බදු සහන හා නිදහස් කිරීම් අවම කිරීම, බදු පද්ධතියෙහි සාධාරණ බව ඇති කිරීම සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා රජයේ අවධානය යොමු වීම අවශ්‍ය වේ. විශේෂයෙන්ම, දැනට පවතින ඍජු බදු සහ වක්‍ර බදු අතර අනුපාතය තුළ ඍජු බදු ඉහළ නැංවීම කෙරෙහි රජයේ ප්‍රතිපත්තිය යොමු වී ඇති බැවින් ආදායම් බදු ආදායම තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. ඊට සමගාමීව, දැනට සිදු වන බදු නීති නැවත කෙටුම්පත් කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීමට නෛතික රාමුව සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා බදු නීතිවල පවතින දුර්වලතා මෙන්ම සංකීර්ණතා හඳුනා ගැනීමට බදු නීති සම්බන්ධ විවිධ අංශ ආවරණය වන පරිදි පුළුල් ඇගයීමක් කිරීම ද අවශ්‍ය වේ. සාපේක්ෂව ආනයනය හා සම්බන්ධ බදු මත අධික ලෙස රඳා පැවැතීම නිසා රටෙහි බදු පද්ධතිය විදේශීය අංශයේ කාර්යසාධනය මත අවදානමකට ලක් විය හැකි අතර, රටෙහි බදු පද්ධතිය නැවත සකස් කිරීමේ දී මෙම තත්ත්වය සැලකිල්ලට ගත යුතුය. මෙවැනි ප්‍රතිව්‍යුහගත කිරීමක් මගින් රටෙහි විදේශීය තරගකාරීත්වය සහතික කිරීම සඳහා ද පහසුකම් සැපයිය යුතු වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ද ඇතුළුව පරිගණකගත කරන ලද බදු පරිපාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වන රජයේ උත්සාහය පැසසිය යුතු අතර, සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු අංශ සඳහා බදු අනුකූලතාවය වර්ධනය කිරීමට තවදුරටත් උත්සාහ ගත යුතුය. බදු පද්ධතිය සරල කිරීම මෙන්ම ගැටලු නිරාකරණය සඳහා වන යාන්ත්‍රණය වේගවත් කිරීම, ආදායම් ඉපැයීම කෙරෙහි ධනාත්මකව බලපෑමට අමතරව, ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර පවත්වා ගෙන යැමේ (Doing Business) ශ්‍රේණිගත කිරීම ද ඉහළ නංවනු ඇත. වියදම් අංශය සැලකීමේ දී, වියදම් වැඩසටහන්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම අවශ්‍ය වන අතර, ඒ සඳහා රජය ඵලදායී නොවන වියදම් අඩු කිරීම සහ වැඩි වශයෙන්ම අවශ්‍යතා පවතින පුද්ගලයන් සඳහා අවශ්‍ය සහයෝගය සැපයීමට දැනට ක්‍රියාත්මක වන සහනාධාර යෝජනා ක්‍රමයන්හි තිරසාර බව තක්සේරු කළ යුතුය. වේගයෙන් ඉහළ යන පුනරාවර්තන වියදම් නිසා රාජ්‍ය ආයෝජන සඳහා වෙන් කළ හැකි සම්පත් ප්‍රමාණය සීමා කෙරෙන අතර, එමගින් රටේ වර්ධන අපේක්ෂාවන්ට බලපෑම් ඇති කරනු ලබයි. ඉහළ රාජ්‍ය ණය ප්‍රමාණයක් පවතින වාතාවරණයක් තුළ මූල්‍ය සම්පත්වලින් විශාල ප්‍රමාණයක් ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම් සඳහා වෙන් කිරීමට සිදුවන අතර එම නිසා ආර්ථික වර්ධන කටයුතු සහ අත්‍යවශ්‍ය සුභ සාධන සේවා පවත්වාගෙන යැම සඳහා රාජ්‍ය මූල්‍ය කටයුතු සිදුකිරීමේ හැකියාව සැලකිය යුතු ලෙස අඩුවේ. ඒ අතරම, ඉහළ අයවැය හිඟයක් මධ්‍යයේ රජයේ ණය ගැනීම් ඉහළ යැමෙන් පෞද්ගලික අංශයේ ආයෝජන අඩු විය හැකි අතර, බැංකු අංශයෙන් ණය ලබාගැනීමෙන් මුදල් කළමනාකරණය මත මෙන්ම විනිමය අනුපාත ස්ථායීතාව පවත්වා ගැනීම කෙරෙහි ද අභියෝග ඇති කරනු ඇත. එබැවින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා වන ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමට යුහුසුළුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

**ඒ හා සමාන වැදගත් ගැටලුවක් වන රජය සතු වාණිජ ව්‍යවසායයන් සඳහා වන ප්‍රතිසංස්කරණ ඉතා කල්පනාකාරී සහ අවධානයෙන් යුතුව උපායමාර්ගික ලෙස රටේ සමාජ, ආර්ථික සහ දේශපාලන පසුබිම තුළ ක්‍රියාත්මක කළ යුතු අතර, සියලු පාර්ශ්වකරුවන් සහ මහජනතාවට එම ප්‍රතිසංස්කරණ ඇති කිරීමේ පදනම සහ එවැනි ප්‍රතිසංස්කරණ නොමැති වීමෙන් මැදි කාලීනව සහ දිගු කාලීනව ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳ ප්‍රමාණවත් පරිදි දැනුම්වත් කිරීම සහ පහදා දීම සිදු කළ යුතුය.** පිරිවැය පිළිබිඹු නොවන මිල ප්‍රතිපත්ති, දුර්වල මූල්‍ය කළමනාකරණය, දුර්වල යහ පාලනය, සේවකයන් අඩු ඵලදායීතාවකින් යුතුව භාවිතා කිරීම, දුර්වල අභ්‍යන්තර පාලනය, ව්‍යුහාත්මක දුර්වලතා සහ දේශපාලන මැදිහත්වීම් යනාදී හේතු ගණනාවක් මත රජය සතු බොහෝ වාණිජ ව්‍යවසායයන් වසර ගණනාවක් තිස්සේ අඛණ්ඩව පාඩු ලබා ඇත. රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ මෙම අලාභ සැලකිය යුතු ප්‍රමාණයකින් එක් රැස්වීම රටේ ආර්ථික අපේක්ෂා සඳහා අඛණ්ඩව බාධා ඇති කරන බරපතල ගැටලුවක් වී ඇත. මෙම ගැටලු හා අලාභ සඳහා හේතු නිසි ලෙස හඳුනා ගැනීම සහ අදාළ ආයතන නැවත නගාසිටුවීම සඳහා උචිත විකල්ප ක්‍රම සමාලෝචනය කිරීම, පිරිවැය

පිළිබිඹු වන මිල ක්‍රමෝපායයන්, කළමනාකරණය හා අලෙවිකරණ විශේෂඥ දැනුම, වඩා හොඳ පාලනයන්, ප්‍රතිප්‍රාග්ධනීකරණය ඇතුළු අවශ්‍යතා හඳුනා ගැනීම වැනි ප්‍රායෝගික ක්‍රමෝපාය අනුගමනය කිරීම, රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ මූල්‍ය ශක්‍යතාව ඉහළනැංවීම සඳහා වැදගත් වේ.

**බාහිර කම්පනයන්ට ඔරොත්තු දීමට හැකිවන පරිදි විදේශීය අංශය ශක්තිමත්ව පවත්වා ගැනීම සඳහා, විදේශීය සෘජු ආයෝජනයන් සහ ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට උපකාරී වන දිගුකාලීන මූල්‍ය ගලාඒම් වැනි ණය නොවන විදේශ ආයෝජනයන් රට වෙත ආකර්ෂණය කර ගැනීමේ අභියෝගය ජය ගැනීමට සාමූහික ප්‍රයත්නයක් අවශ්‍ය වනු ඇත.** මෑත වසර කිහිපය තුළ දී වාර්තා කළ වර්ධනයන් හැරුණු විට, ශ්‍රී ලංකාව දිගින් දිගටම ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟයන් පවත්වා ගෙන ගොස් ඇති අතර, එය, ණය බර ඇති කරන මූල්‍ය ප්‍රවාහවලින් හෝ එසේ නැතහොත් විදේශ සංචිත මගින් එම හිඟය මූල්‍යනය කිරීමේ අවශ්‍යතාව ඇති කරන ලදී. ශ්‍රී ලංකාවේ වැඩිහිටි යැපුම් අනුපාතය ඉහළ යෑම සමඟ ජන සංයුතියෙහි වෙනස් වීමක් සිදු වෙමින් පවතින බැවින් ජනගහනයෙන් මෙම කාණ්ඩය සඳහා වන රාජ්‍ය වියදම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමගින් රාජ්‍ය අංශයේ ඉතුරුම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති වනු ඇත. මීට අමතරව, පවත්නා ශ්‍රම බලකායේ ඵලදායීතාව හා සාංගමික ඉතුරුම් ඉහළ නැංවීම සිදු නොකළහොත් පෞද්ගලික අංශයේ ඉතුරුම් අඩුවනු ඇත. ජංගම ගිණුමේ හිඟය හා සමාන ඉතුරුම්-ආයෝජන පරතරය තවදුරටත් පුළුල් වනු ඇති අතර, එම පරතරය විදේශ මූලාශ්‍රවලින් මූල්‍යනය කිරීමට සිදුවනු ඇත. 2015 වසරේ දී, තෙල් මිල පහළ යෑම සහ මැදපෙරදිග රටවල පැවැති නොසන්සුන්භාවය හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල කැපී පෙනෙන අඩු වීමක් සිදු වූ පරිදි, ලොව පුරා සිදුවන ආර්ථික හා භූ-දේශපාලන වෙනස්වීම් මගින් පෙන්නුම් කර ඇත්තේ අදාළ රටවල ආර්ථික හා දේශපාලන විචලතාවන්ට පහසුවෙන් නතු වන බැවින් ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීම සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශීය ණය ගැනීම් මත සම්පූර්ණයෙන් රඳා සිටීම දුෂ්කර වන බවයි. ශ්‍රී ලංකාව සහනාදායී කොන්දේසි මත බහුපාර්ශ්වීය ආයතනවලින් ණය ලබාගැනීමේ දී සාර්ථක වී තිබූ නමුත්, පහළ මධ්‍යම ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වීමේ ප්‍රතිඵලයක් ලෙස තවදුරටත් එසේ ණය ලබාගැනීමට නොහැකි වනු ඇත. තවද, දියුණු ආර්ථිකයන් තුළ සිදු වෙමින් පවතින මුදල් ප්‍රතිපත්ති සාමාන්‍යකරණය මගින් ණය ගැනීමේ පිරිවැය ඉහළ නංවනු ඇත. ව්‍යාපාර ඇරඹීමේ පහසුකම් කාර්යක්ෂම කිරීම, නව්‍යතා ඇති ප්‍රධාන විදේශ වෙළඳපොළවල ආයෝජන ප්‍රවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සහ අයෝජන අවස්ථා පිළිබඳ තොරතුරු ලබාදීම වැනි ක්‍රියාමාර්ග තුළින් විදේශීය සෘජු ආයෝජන සහ පෞද්ගලික අංශයේ අනෙකුත් ප්‍රවාහ ඉදිරි වසර කිහිපය තුළ දී කඩිනමින් ලබාගැනීම සඳහා වන ප්‍රතිපත්ති යුහුසුලුව ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාව ලබාදිය යුතුය. විනිමය පාලන රෙගුලාසි ලිහිල් කිරීම, සාර්ව ආර්ථික පරිසරය ශක්තිමත් කිරීම මෙන්ම රට තුළ ඉහළ දේශපාලන ස්ථාවරභාවයක් පැවැතීම මගින් ආයෝජන දිරිගන්වනු ඇති අතර, විදේශ ආයෝජන දිරිමත් කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගත යුතුය. ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීමට සහ ආර්ථිකයේ ලබාගත හැකි උපරිම වර්ධන තත්ත්වයට පත්කර ගැනීමට ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. ඉහළ වර්ධනය සහ අඩු හා ස්ථායී උද්ධමනය වැනි හිතකර ආර්ථික දර්ශකවලට අමතරව, යහ පාලනය හා ඉඩම් හිමිකම් ඇතුළුව දේපළ අයිතිය සහතික කිරීම ද දේශීය ආර්ථිකය කෙරෙහි ආයෝජක විශ්වාසය වර්ධනය කරනු ඇත. තවද, දේපළ අයිතිය හා සම්බන්ධ නීති අවිනිශ්චිතතාව, එකිනෙකට අනුකූල නොවන හා ප්‍රතිතෝලන බදු ප්‍රතිපත්ති සහ නීති ක්‍රියාත්මක කිරීමේ හා බලාත්මක කිරීමේ යාන්ත්‍රණය දුර්වල වීම වැනි ප්‍රතිපත්ති නොගැළපීම් විදේශ ආයෝජන අධෛර්යමත් කරන බැවින් එවැනි ගැටලු ඉවත් කිරීම සඳහා නිසි අවධානය යොමු විය යුතුය.

**විදේශීය අංශයේ තිරසාරබව ශක්තිමත් වීම, ඉහළ තරගකාරිත්ව තුළින් ප්‍රතිලාභ ලබන භාණ්ඩ හා සේවා යන දෙඅංශයේම විදේශ වෙළඳාමේ ක්‍රියාකාරීත්වය මත විශාල වශයෙන් රැඳී පවතිනු ඇත.** ආනයන වර්ධනයට සාපේක්ෂව අපනයන වර්ධනය අඩුවීම හේතු කොටගෙන සැලකිය යුතු ඉහළ වෙළඳ හිඟයක් පැවැතීම හේතුවෙන් ශ්‍රී ලංකාව දිගින් දිගටම පීඩාවට පත් විය. නාමික වශයෙන් ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන ඉහළ ගිය ද, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අපනයන 2000 වසරේ දී වූ සියයට 33.3 සිට 2015 වසරේ දී සියයට 12.8 දක්වා පහත වැටුණි. අනෙකුත් තරගකාරී රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අපනයනවල තරගකාරිත්වය අඩු වීම පෙන්නුම් කරමින් ගෝලීය අපනයන සඳහා ශ්‍රී ලංකාවේ අපනයන දක්වන දායකත්වය ද මීට සමාන ආකාරයකින් අඩු විය. එම නිසා, විදේශ වෙළඳ ගිණුම වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ බාහිර තරගකාරිත්වය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ.

විශේෂ සටහන 2

## ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා සම්බන්ධයෙන් වන සමාජ-ආර්ථික අභියෝග

නිදහස ලැබූ දින සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව ක්‍රමයෙන් කෘෂිකර්මාන්තය මූලික කරගත් අඩු ආදායම් ආර්ථිකයක සිට වඩා විවිධාංගීකරණය වූ සේවා මූලික කරගත් පහළ මැදි ආදායම් ලබන ආර්ථිකයක් බවට පත්වී ඇත. විශේෂයෙන්ම අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි සමාජ සංවර්ධන අංශ තුළ ඇති වූ කැපී පෙනෙන සංවර්ධනය මෙම ආර්ථික පරිවර්තනයට වඩාත් උපකාරී විය. ශ්‍රී ලංකාව සංවර්ධන ප්‍රතිපත්ති චක්‍රය තුළ ජයග්‍රහණයක් අත්කරගෙන තිබුණ ද විශේෂයෙන්ම දරිද්‍රතාවය, ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා වැනි අංශවල පවතින ගැටලු හේතුවෙන් එම වර්ධනය පවත්වාගෙන යෑමේ දී සමාජ ආර්ථික පරිවර්තනය කෙරෙහි අවධානය යොමුකිරීමට සිදුව ඇත. ආර්ථිකයේ සෑම අංශයකම විවිධ අභියෝග පවතින අතර, දරිද්‍රතාවය, ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා වැනි ගැටලු මගින් ආර්ථික වර්ධනය දැඩි ලෙස දුර්වල කිරීමට සහ සමාජ නොසන්සුන්තාව ඇති කිරීමට හැකි බව අධ්‍යයන මගින් පෙන්වා දෙයි. එම නිසා, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහ තිරසාර ආර්ථික වර්ධනය හා සංවර්ධනය ළඟාකර ගැනීමට මෙම විශේෂිත අංශ තුනෙහි අභියෝග සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

### දරිද්‍රතාවය

"දරිද්‍රතාවය යනු කුමක් ද කියා මගෙන් නොවිමසන්න. මක් නිසා ද යත්, මගේ නිවසින් පිටත දී ඔබට එය හමු වී ඇත. නිවස දෙස බලා එහි ඇති සිදුරු සංඛ්‍යාව ගණන් කරන්න. මා ඇඳ සිටින ඇඳුම් සහ මගේ උපකරණ දෙස බලන්න. සියලු දෙයක් දෙසම බලා ඔබ දකින දේ ලියන්න. ඒ ඔබ දකින දෙය දරිද්‍රතාවයයි."

- දිළිඳු පුද්ගලයෙක්, කෙන්යාව 1997[1]

දරිද්‍රතාවය ලෙස සාමාන්‍යයෙන් නිර්වචනය කරනු ලබන්නේ කුටුම්භයන්ට හා පුද්ගලයින්ට ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට සම්පත් හෝ හැකියාවන් පවතී ද යන්නයි. දරිද්‍රතාවය හා සබැඳි වූ දුෂ්කරතාවයන් නැති කිරීම සඳහා බහුවිධ ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද තවදුරටත් පවතින දරිද්‍රතාවයේ සංකේත හේතුවෙන්, ගෝලීය සංවර්ධන න්‍යාය පත්‍රයේ දරිද්‍රතාව අඩු කිරීම සඳහා නිරන්තරයෙන්ම ප්‍රමුඛස්ථානයක් ලැබී ඇත.

ශ්‍රී ලංකාව දරිද්‍රතාවය අඩු කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර ඒ අනුව නියමිත කාලය වූ 2015 ට වසර 7 කට පෙරාතුව ජාතික මට්ටමින් දිළිඳුබව අඩකින් අඩු කිරීමේ සහශ්‍ර සංවර්ධන අභිමතාර්යන්හි (Millennium Development Goals) වන ඉලක්ක සපුරා ගැනීමට හැකියාව ලැබී ඇත. දරිද්‍ර රේඛාවට[2] පහළින් ජීවත් වන පුද්ගලයින් මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දක්වන ජනගහන දරිද්‍රතා දර්ශකය, දරිද්‍රතාවය මැනීම සඳහා බහුලවම භාවිතා කරන මිම්ම වන අතර, ඒ අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය 1995/96 වසරේ පැවැති සියයට 28.8 සිට 2009/10 වසර වන විට සියයට 8.9 දක්වා ද 2012/13 වසර වන විට සියයට 6.7 දක්වා ද අඩු වී ඇත. 2009/10 වසරේ දරිද්‍රතා දර්ශකය අනුව මිලියන 1.8 ක් වූ දරිද්‍රතාවයෙන් පෙලෙන පුද්ගලයින් සංඛ්‍යාවට සාපේක්ෂව 2012/13 වසරේ දී දළ වශයෙන් මිලියන 1.3 ක් පමණ විය. පුද්ගලයෙකු සඳහා දිනකට එ.ජ. ඩොලර් 1.25 ක් (2005 වසරේ දී ක්‍රය ශක්ති සාම්‍යයට) ලෙස සංසන්දනය කිරීම සඳහා භාවිතා කරනු ලබන දැඩි දරිද්‍රතා රේඛාව භාවිතා කරන ලද ලෝක බැංකු වාර්තාවකට අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අන්තර්ජාතික සම්මතයට වඩා අඩු අගයක පවතී.[3] මෙම නිර්වචනයට අනුව, 2002 වසරේ සියයට 13 ක් ව පැවැති ශ්‍රී ලංකාවේ දැඩි දරිද්‍රතා මට්ටම 2012/2013 වසරේ දී සියයට 3 කට වඩා අඩු අගයකට පහත වැටුණි.

දරිද්‍රතාවයේ මෙම සැලකිය යුතු පහළ යෑම, විශේෂයෙන්ම දරිද්‍රතා රේඛාවෙන් පහළ මට්ටමේ ජීවත් වන පුද්ගලයින් ඇතුළුව අඩු ආදායම්ලාභී ජන කොටස්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා පැවැති රජයන් විසින් ක්‍රියාත්මක කරන ලද නොයෙකුත් වැඩසටහන්වල ප්‍රතිඵලයක් විය. සෘජු මූල්‍ය ආධාර, ජීවනෝපායන් සඳහා ආධාර වැඩ සටහන්, සාමාන්‍යයෙන් අඩු ආදායම් සහිත පුද්ගලයින් ඉලක්ක කර ගත් සහනාධාර වැඩසටහන්, ආහාර සහනාධාර වැඩසටහන් සහ නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි සාමාන්‍ය පොදු සුබසාධනය සඳහා වූ රාජ්‍ය වියදමින් සිදු කළ වැඩසටහන් යනාදිය මේ සඳහා ඇතුළත් විය.

වසර ගණනාවක් තුළ දරිද්‍රතාව ක්‍රමයෙන් අඩු කර ගනිමින් සහ 2000-2015 අතර කාලය තුළ දරිද්‍රතාවය හරි අඩකින් අඩු කිරීමේ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සපුරාගත් රටක් ලෙස ශ්‍රී ලංකාව, 2030 වසරේ දී තිරසාර සංවර්ධන අභිමතාර්ථ යටතේ ළඟා කර ගැනීමට අපේක්ෂා කරන

1 "Can Anyone Hear Us? Voices From 47 Countries". Deepa Narayan with Raj Patel, Kai Schafft, Anne Rademacher and Sarah Koch-Schulte, Poverty Group, PREM" World Bank" December 1999, P.26.

2 2005 වසරේ ක්‍රයශක්ති සාම්‍යයට අනුව, මාසික ඒක පුද්ගල මුළු මූර්ත පරිභෝජන වියදම රුපියල් 3,624 ට අඩු ගෘහ කාණ්ඩයන්හි වෙසෙන පුද්ගලයින් දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් ලෙස ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව අර්ථ දක්වා ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වසර තුනකට වරක් පවත්වනු ලබන ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ (HIES) දත්ත ඇසුරින් මූලික අවශ්‍යතා සඳහා වියදම් (Cost of Basic Needs) ක්‍රමය යොදා ගෙන නිල දරිද්‍රතා රේඛාව නිර්ණය කර ඇත. නවතම ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2012/13 වර්ෂ සඳහා විය.

3 Oxfam Issue Briefing, Wealth: Having it All and Wanting More, January 2015

සෑම තැනකම සියලුම ආකාරවලින් පවතින දරිද්‍රතාව අවසන් කිරීමේ නව අභියෝගයට මේ වන විට මුහුණ දී ඇත. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල විශේෂයෙන්ම අඩු අවධානයට ලක් වූ දිස්ත්‍රික්ක තුළ පවතින අන්ත දුප්පත්කම තුරන් කරවිය විය හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව මෙමගින් ඉස්මතු කර දක්වයි.

ශ්‍රී ලංකාවේ 2012 ජන හා නිවාස සංගණනය සහ 2012/13 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ලෝක බැංකුවේ ගෝලීය දරිද්‍රතා පරිචයන් පිළිබඳ කණ්ඩායම සකස් කළ දරිද්‍රතා සිතියම මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ දරිද්‍රතා අනුපාත අතර පවතින සැලකිය යුතු භූ-ගෝලීය විෂමතා ඉස්මතු කර දක්වයි.[4] උදාහරණයක් ලෙස මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 5.3 සිට සියයට 45.1 දක්වා විශාල ලෙස විචලනය වී ඇත. මොණරාගල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සැලකිය යුතු මට්ටමේ උග්‍ර දරිද්‍රතාවයක් පැවතිණි. සමහර දිස්ත්‍රික්කවල දරිද්‍රතාව අඩු මට්ටමක පැවැති අතර සමස්තයක් ලෙස ගත් කල මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කින්නියා වැනි සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල දරිද්‍රතාවයෙන් පෙලෙන ප්‍රදේශ පැතිර පවතී. ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 0.6 ක් වාර්තා වී ඇති ශ්‍රී ලංකාවේ අඩුම දරිද්‍රතාවයක් පවතින කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 45.1 ක් වාර්තා වී ඇති මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුනෙයි-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අතර පවතින පරතරය මගින් වැඩි වශයෙන් පවතින දරිද්‍රතාවයේ භූ-ගෝලීය විෂමතා නිරීක්ෂණය කළ හැක. ජනගහන දරිද්‍රතා දර්ශකය ඉහළ මට්ටමක පැවතීම මගින්, ජනගහනයෙන් ඉහළ ප්‍රතිශතයක් දිළිඳුභාවයෙන් පෙළෙන බව සෑම විටම පිළිබිඹු නොකරන බව දරිද්‍රතාවයේ ප්‍රාදේශීය ව්‍යාප්තිය මගින් ද පෙන්වා දෙයි. මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල ජනගහන දරිද්‍රතා දර්ශක අගයන් පිළිවෙළින් සියයට 28.8 ක් සහ සියයට 20.1 ක් වුව ද මෙම දිස්ත්‍රික්කවල සිටින ජනගහනය රටෙහි මුළු දිළිඳු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.4 ක් පමණක් වීම සහ ජනගහන දරිද්‍රතා දර්ශක අගය සියයට 6.5 ක් වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිළිඳු ජනගහන ප්‍රතිශතය සියයට 7.6 ක් වීම මගින් මෙය පිළිබිඹු වේ.

මෙම කලාපීය විෂමතා, සමස්ත දරිද්‍රතාවය අඩු කර ගැනීමෙන් මේ දක්වා රට ළඟා කර ගත් ජයග්‍රහණ සඳහා පීඩාවන් එල්ල කර ඇති බැවින් පවත්නා අසමත් අංශයන්

**සංඛ්‍යා සටහන වි.ස. 2.1**

**දිස්ත්‍රික්කය අනුව ජනගහන දරිද්‍රතා දර්ශකය : 2009/10 සහ 2012/13**

| දිස්ත්‍රික්කය | සමීක්ෂණ කාලය | |
|---|---|---|
| | 2009/10* | 2012/13 |
| කොළඹ | 3.6 | 1.4 |
| ගම්පහ | 3.9 | 2.1 |
| කළුතර | 6.0 | 3.1 |
| නුවර | 10.3 | 6.2 |
| මාතලේ | 11.5 | 7.8 |
| නුවරඑළිය | 7.6 | 6.6 |
| ගාල්ල | 10.3 | 9.9 |
| මාතර | 11.2 | 7.1 |
| හම්බන්තොට | 6.9 | 4.9 |
| යාපනය | 16.1 | 8.3 |
| මන්නාරම | - | 20.1 |
| වවුනියාව | 2.3 | 3.4 |
| මුලතිව් | - | 28.8 |
| කිලිනොච්චි | - | 12.7 |
| මඩකලපුව | 20.3 | 19.4 |
| අම්පාර | 11.8 | 5.4 |
| ත්‍රිකුණාමලය | 11.7 | 9.0 |
| කුරුණෑගල | 11.7 | 6.5 |
| පුත්තලම | 10.5 | 5.1 |
| අනුරාධපුර | 5.7 | 7.6 |
| පොළොන්නරුව | 5.8 | 6.7 |
| බදුල්ල | 13.3 | 12.3 |
| මොනරාගල | 14.5 | 20.8 |
| රත්නපුර | 10.5 | 10.4 |
| කෑගල්ල | 10.8 | 6.7 |
| **ශ්‍රී ලංකාව** | **8.9** | **6.7** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

* මන්නාරම, මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල දත්ත ඇතුළත් නොවේ.

සහ රටෙහි උග්‍ර දරිද්‍රතාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා අරමුණු කරගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. විවිධ අංශ ඔස්සේ වන දරිද්‍රතා පරතරය සඳහා ආදායම් ප්‍රමාණය අන්තර්ගත වුවද ඒ මත සීමා නොවන බවට අධ්‍යයනයන් මගින් පෙන්වා දුන් පරිදි දරිද්‍රතාවයේ බහුමාන ස්වභාවය කෙරෙහි ප්‍රතිපත්ති අරමුණුගත කිරීම වැදගත් වේ. දුර්වල අධ්‍යාපනය, මූලික පහසුකම් ලබා ගැනීමට ඇති නොහැකියාව (ආරක්ෂිත ජලය, සනීපාරක්ෂාව, සෞඛ්‍ය, ඌන පෝෂණය වැනි), දුර්වල ශ්‍රම වෙළඳපොළ සබඳතා සහ සමස්තයක් ලෙස සඵල ආර්ථික වත්කම් ලබා ගැනීමට ඇති නොහැකියාව මේ තුළ අන්තර්ගත වේ. රටක දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් හට ද, සමාජ ආර්ථික යටිතල පහසුකම් ලබා ගැනීමට නීතිමය අයිතිවාසිකමක් ඇති බැවින් ඔවුන්ගේ ගැටලු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට රජයට වගකීමක් ඇත. අන්ත දුගීභාවයෙන් පෙළෙන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වන රජයේ සුභසාධන වැඩසටහන්වලින් ආවරණය වන ප්‍රමාණය ඉහළ දැමීමට අමතරව එවැනි වැඩසටහන්වල ඵලදායීතාව වර්ධනය කිරීමට අවශ්‍ය ඉලක්ක සහතික කිරීම

4 The Spatial Distribution of Poverty in Sri Lanka, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - Sri Lanka and Poverty Global Practice, ලෝක බැංකු සමූහය - 2015 අගෝස්තු


වැදගත් වේ. අනෙකුත් සාර්ව මට්ටමේ ක්‍රියාමාර්ග රැකියා වියුක්තියෙන් පෙළෙන තරුණ කොටස් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම, යටිතල පහසුකම් සඳහා වන රාජ්‍ය ආයෝජන වැඩි කිරීම, ග්‍රාමීය ප්‍රදේශවල පොදු භාණ්ඩ සඳහා වන ප්‍රතිපාදන ඉහළ නැංවීම සහ වයස්ගත ජනගහනය අරමුණු කරගත් සමාජීය ආරක්ෂණ උපායමාර්ග නිර්මාණය කිරීම යනාදිය සඳහා සාර්ව මට්ටමේ ක්‍රියාමර්ග අවශ්‍ය වේ.

### ආදායම් විෂමතාවය

"බෙදී යෑම මගින් අතිරික්ත ඉවත් කළ යුතු අතර ප්‍රමාණවත් තරම් සෑම මිනිසෙකුටම හිමි විය යුතුය."

- විලියම් ශේක්ෂ්පියර්, ඉංග්‍රීසි නාට්‍ය රචක (1564-1616)

**රූප සටහන වි.ස. 2.1 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ප්‍රාදේශීය ව්‍යාප්තිය - 2012/2103**




මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආදායම් බෙදීයාමේ අසමානතාව, පරිභෝජනය සහ සමස්ත ජනගහනයේ පරිභෝජනය හෝ වෙනත් කටයුතු, අවධානය යොමු කළ යුතු අනෙකුත් වැදගත් අංශයක් වේ. ඔක්ස්ෆාම් (Oxfam) ට අනුව, 2014 වසරේ දී ලෝකයේ ධනවත්ම සියයට 1 ක පිරිසට ගෝලීය ධනයෙන් සියයට 48 ක් අයිති වූ අතර ඉතිරි සියයට 52, වැඩිහිටි ජනගහනයේ අනෙකුත් සියයට 99 ක පිරිස අතර බෙදී ගොස් ඇත.[5] නැගීඑන ආර්ථිකයන්හි වර්ධනය හේතුවෙන් රටවල් අතර පවත්නා අසමානතාවයන් සුළු වශයෙන් අඩු වී ඇති අතර, රටවල් අතර පවතින එම විෂමතාවන්වලින් ජනතාවට බොහෝ ගැටලු ඇති වේ. ලොව පුරා රටවල්වල වෙසෙන ධනවත් සුළුතරය විසින් ජාතික ආදායමෙහි වැඩි වන කොටස් හිමිකම සෑමවිට ම අත් කර ගනී. මෙම ප්‍රවණතාවයෙන් පෙන්නුම් කෙරෙන පරිදි රටවල් තුළ සහ රටවල් අතර වන විෂමතාවයෙහි අඩු වීම, දරිද්‍රතාවයෙහි ප්‍රාදේශීය ව්‍යාප්තිය යටතේ වන එක් මූලික අරමුණක් ලෙස හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල ආදායම 2003 වසරේ දී එ.ජ. ඩොලර් 981 සිට 2015 වසරේ දී එ.ජ. ඩොලර් 3,925 තෙක් ඉහළ ගිය ද, සැලකිය යුතු ආදායම් විෂමතාවන් අඛණ්ඩව පැවතුණි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012/13 නවතම ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව, මධ්‍යන්‍යය හා මධ්‍යස්ථ මාසික ගෘහ ඒකක ආදායම් පිළිවෙළින් රුපියල් 45,878 ක් හා රුපියල් 30,814 ක් විය. දිස්ත්‍රික්ක මට්ටමේ සංඛ්‍යා සැලකූ විට, කොළඹ දිස්ත්‍රික්කය ඉහළම මාසික මධ්‍යන්‍ය ගෘහ ඒකක ආදායම (රුපියල් 77,723) වාර්තා කළ අතර, මුලතිව් දිස්ත්‍රික්කය පහළතම අගය වූ රුපියල් 23,687 ක් වාර්තා කරන ලදී. ඒ අනුව, ප්‍රතිශත වශයෙන් ගත් කල, ඉහළම දශමක සමස්ත කුටුම්භ ආදායමෙන් සියයට 38 ක ප්‍රතිශතයක් ලබා ගන්නා ලද අතර, ඉහළම සියයට 20 ක ප්‍රතිශතය සමස්ත කුටුම්භ ආදායමෙන් සියයට 53 ක ප්‍රතිශතයක් හිමි කර ගන්නා ලදී. සංසන්දනාත්මකව බැලූ කල, රට තුළ ආදායම් බෙදී යෑමේ සැලකිය යුතු විෂමතාවයක් පිළිබිඹු කරමින් ගෘහ ඒකකයන්ගෙන් සියයට 50 ක්, සමස්ත ගෘහ ඒකක ආදායමෙන් සියයට 20 ක අගයකට හිමිකම් කියයි.

**සංඛ්‍යා සටහන වි.ස. 2.2 දශමක කාණ්ඩ සහ ආදායම් බෙදීයෑම**

| දශමක කාණ්ඩය<br>කාණ්ඩය | <br>සමුච්චිත අගය (%) | ආදායම් කාණ්ඩය (රුපියල්) | ආදායම් බෙදීයෑම (%) | ආදායම් බෙදීයෑම සමුච්චිත (%) |
|---|---|---|---|---|
| 1 | 10 | 10,836 ට අඩු | 1.5 | 1.5 |
| 2 | 20 | 10,836 - 16,531 | 3.0 | 4.5 |
| 3 | 30 | 16,532 - 21,286 | 4.1 | 8.6 |
| 4 | 40 | 21,287 - 25,903 | 5.1 | 13.7 |
| 5 | 50 | 25,904 - 30,814 | 6.2 | 19.9 |
| 6 | 60 | 30,815 - 36,758 | 7.3 | 27.2 |
| 7 | 70 | 36,759 - 45,000 | 8.9 | 36.1 |
| 8 | 80 | 45,001 - 57,495 | 10.9 | 47.0 |
| 9 | 90 | 57,496 - 83,815 | 14.9 | 61.9 |
| **10** | **100** | **83,815 ට වැඩි** | **38.0** | **100.0** |


මූලයː ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/13, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

5 Oxfam Issue Briefing, Wealth: Having It All and Wanting More, 2015 ජනවාරි

1

ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

**රූප සටහන වි.ස. 2.2** **ආදායම් අසමානතාව හා ආදායම් බෙදීයෑම**




මූලය: ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/13, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ තනි පුද්ගල හෝ ගෘහ ඒකක අතර ආදායම් බෙදී යෑම පූර්ණ සමානුපාතික බෙදී යෑමකින් අපගමනය වන ප්‍රමාණය මනිනු ලබන ගිනි සංගුණකය[6] 0.48 ක අගයක පැවතිණි. 2009/10 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය අනුව වාර්තා වූ 0.49 හා සැසඳීමේ දී ආදායම් ව්‍යාප්තියේ ආංශික වර්ධනයක් පිළිබිඹු කළ ද, ආදායම් සමතාව වැඩිදියුණු කිරීමට සුදුසු උපායයන් ක්‍රියාත්මක කිරීමේ ඇඩි අවශ්‍යතාවක් පවතී.

### ළමා පෝෂණ ඌනතාවය[7]

*"කුසගින්න හා මන්දපෝෂණය, ළමයින්ට අනිටු ප්‍රතිවිපාක ඇති කරන අතර, අඩු බර උපත් හා උපත් විකලතා, ස්ථූලතාව, මානසික හා ශාරීරික සෞඛ්‍ය ගැටලු සහ අධ්‍යාපන කටයුතු දුර්වලවීම යනාදිය සමග ද සම්බන්ධය."*

- මේරියන් රයිට් එඩ්ල්මන්, ප්‍රාරම්භක/ළමා ආරක්ෂණ අරමුදලේ සභාපති[8]

උග්‍ර දරිද්‍රතාවය මන්දපෝෂණය හා ගැබ් වූ කරුණක් බව, ආහාර බහුල ලෝකයක පවතින කුසගින්න හා පෝෂණ ඌනතාවය මගින් අඟවනු ලබයි. කෙස් වෙතත්, පෝෂණ ඌනතා විශේෂයෙන්ම ක්ෂුද්‍ර පෝෂණ ඌනතා, දරිද්‍රතාවයෙන් මිදීමට පුද්ගලයන්ට ඇති හැකියාවට බලපෑම් කරන හෙයින් දරිද්‍රතාවයට ප්‍රධාන වශයෙන් හේතු වේ. ශාරීරික හා මානසික සංවර්ධනයට ළමුන්ගේ ඇති හැකියාව අඩු වීම, පාසල් පැමිණීම හා කාර්යසාධනය නතර වීමට ප්‍රබලව බලපාන අතර, එම නිසා අධ්‍යාපනය සඳහා වූ ආයෝජනයන්ගේ ඵලදායීතාව හීන වීම සහ ඉන් අනතුරුව ඔවුන් ශ්‍රම බලකායට ඇතුළත් වීමේ දී නිෂ්පාදන ධාරිතාවට අහිතකරව බලපානු ලබයි. එවැනි පුද්ගලයන් පසුව කුසගින්න, අඩු ඵලදායීතාව සහ ඇඩි දරිද්‍රතා උගුලට හසු වේ.

2012 වසරේ දී අවුරුදු 5 ට අඩු සියලු ළමුන්ගෙන් සියයට 13 ක් වර්ධනය නතර වූවන් ලෙස සහ සියයට 24 ක් අඩු බරැති ළමුන් ලෙස වාර්තා වෙමින් ශ්‍රී ලංකාව ඇඩි බරක් වූ ළමා පෝෂණ ඌනතාවයකට මුහුණදෙනු ලබයි. නීරක්තිය, අඩු බර උපත්, වර්ධනය නතර වීම, අඩුබර හා උසට සරිලන බර නොමැති වීම යනාදී විවිධ දර්ශක සැලකූ කල, ශ්‍රී ලංකාවේ කාර්යසාධනය, ඉහළ සෞඛ්‍ය ජයග්‍රහණයන් ලබා ගත් රටවලට වඩා ඉතා පහළ මට්ටමේ සෞඛ්‍ය තත්ත්වයන් ඇති රටවල්වලට වඩා සමීප මට්ටමක පවතී.

ආර්ථිකය ඉහළ වර්ධන ප්‍රවණතාවක පැවතීම සහ ජීවන තත්ත්වය ඉහළයෑම මධ්‍යයේ වුවද මෙම අංශය තුළ පසුගිය දශකය තුළ සිදු වූ වැඩිදියුණුවීම් ඉතා සුළු හා මන්දගාමී විය.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් ද ශ්‍රී ලංකාව තුළ ළමා පෝෂණය සම්බන්ධයෙන් පහත දැක්වෙන වැදගත් නිරීක්ෂණ සිදු කර ඇත[9].

- පෝෂණ ඌනතාවය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැටලුවක් ව පවතී.
- ශ්‍රී ලංකාවේ ළමයින්ගේ වැඩීම වළක්වන අනුපාතය (අවුරුදු 5 ට අඩු සියලු ළමුන්ගෙන් සියයට 13) ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය වැනි කලාපයේ අනෙක් රටවලට වඩා අඩු අතර, චීනය, තායිලන්තය හා මැලේසියාව වැනි වෙනත් මැදි ආදායම් ලබන ආසියානු රටවලට වඩා ඉහළ මට්ටමක පවතී.
- 2009 සිට අඩු බර හා උසට සරිලන බරක් නොමැති වීම ඉහළ ගිය අතර දිස්ත්‍රික්ක 25 න් 24 කම උසට සරිලන බරක් නොමැති වීම, (අවුරුදු 5 ට අඩු සියලු ළමුන්ගෙන් සියයට 15 ට වඩා) බරපතළ කරුණක් ලෙස පෙනී ගොස් තිබේ.
- වැඩීම නතර වූ ළමුන්ගෙන් අඩක් පමණ සහ උසට සරිලන බරක් නොමැති ළමුන්ගෙන් සියයට 27 ක්, වයස අවුරුදු දෙකට අඩු අය වෙති.
- ශ්‍රී ලංකාවේ අවුරුදු 5 ට අඩු ළමුන්ගෙන් සියයට 2.3 ක් පමණ (40,000) දරුණු මන්දපෝෂණයෙන් (SAM) පෙළෙන අතර මිලියන හතරකට වඩා, විශේෂයෙන්ම කාන්තාවෝ හා ළමයි නීරක්තියෙන් පෙළෙති.
- ප්‍රාදේශීයව සහ ආදායම් මට්ටම වැනි කරුණු මත මෙහි ව්‍යාප්තියෙහි සැලකිය යුතු විෂමතාවයන් පවතී.

6 ගිනි දර්ශකය ආර්ථිකයක පුද්ගලයන් හා පවුල් ඒකක අතර ආදායම බෙදී යෑම හෝ සමහර අවස්ථාවල පරිභෝජන වියදම පූර්ණ සමානුපාතික බෙදීයෑමකින් අපගමනය වන ප්‍රමාණය මගින් මනිනු ලැබේ. ලෝරන්ස් චක්‍රය, වඩාත්ම දිළිඳුතම පුද්ගලයන්ගෙන් හෝ පවුල් ඒකකයෙන් පටන්ගෙන සමුච්චිත මුළු ආදායමේ ප්‍රතිශතය සමුච්චිත ලබන්නන්ගේ මුළු ගණනට සමානුපාතව ලකුණු කර පෙන්වයි. ගිනි දර්ශකය, පූර්ණ සමානාත්මකව පෙන්වන මනඃකල්පිත රේඛාවක් හා ලෝරන්ස් චක්‍රය අතර ප්‍රදේශය, රේඛාවෙන් පහළ උපරිම ප්‍රදේශයේ ප්‍රතිශතයක් ලෙස මනිනු ලබයි. එබැවින්, 0 කට සමාන ගිනි දර්ශකය පූර්ණ සමානතාව නියෝජනය කරන අතර, 1 පූර්ණ අසමානතාව පෙන්වයි. (ලෝක බැංකුව, http://data.worldbank.org/indicator/Si.Pov.GINI)

7 "ශ්‍රී ලංකාවේ ළමා පෝෂණ ඌනතාව පිළිබඳ අභියෝග" (ප්‍රකාශයට පත් නොවූ), පෝෂණ විශේෂඥ වෛද්‍ය - රේණුකා ජයතිස්ස, සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ, ශ්‍රී ලංකාව, මත පදනම් වී ඇත.

8 "Preventable Hunger in Our Land of Plenty" ළමා ආරක්ෂණ අරමුදල, ඇ.එ.ජ.

9 "Nutrition, UNICEF, http(//www.unicef.org/srilanka/Nutrition(1).pdf"

ශ්‍රී ලංකාවේ ළමා පෝෂණ ඌනතා ගැටලුව, වියළි කලාපීය ප්‍රදේශවල විශේෂයෙන්ම උතුරු මැද පළාත, කිලිනොච්චිය හා මොණරාගල සහ මධ්‍යම කඳුකරයේ හා වතු ආශ්‍රිත දුප්පත් පවුල් ඒකකයන් තුළ ඒකරාශී වී ඇත. ධනවත් පවුල්වලට වඩා දුප්පත් පවුල් තුළ සහ රටේ අනෙක් ප්‍රදේශයන්ට වඩා වතු ආශ්‍රිතව අඩු බර උපත් සහ ළමා පෝෂණ ඌනතාව පැතිරීම තුන් ගුණයකින් ඉහළ වේ.

ශ්‍රී ලංකාව පෝෂණ දර්ශකයන්ගෙන් අඩු ප්‍රගතියක් පෙන්වීමට ප්‍රධානතම හේතූන් වනුයේ දරිද්‍රතාව, ආහාර අනාරක්ෂිතතාව සහ එහි ප්‍රතිඵලයක් ලෙස මව්වරුන්ගේ දුර්වල සෞඛ්‍ය තත්ත්වය වේ. මේ අතරින් ශ්‍රී ලංකාව තුළ මේ සඳහා හේතු වන ප්‍රධානතම සාධකය වන්නේ, අඩු බර උපත්, ළමා වැඩීම නතර වීම හා අඩු බර සඳහා තුනෙන් දෙකකට වඩා දායක වන, දරිද්‍රතාවයේ ප්‍රතිඵල වන ආහාර අනාරක්ෂිතතාව හා දරිද්‍රතාවයයි. ආහාර අනාරක්ෂිතතාව, ආහාර පරිභෝජනයේ මදකම පමණක් නොව සෞඛ්‍ය සම්පන්න සමබර ආහාර වේලක් ලබා ගැනීමට ඇති නොහැකියාව ද පිළිබිඹු කරයි.

දරිද්‍රතා මට්ටම්වලට සමගාමීව ඉහළ යන අඩු බර උපත් හා වැඩීම නතර වීම සමඟ ශ්‍රී ලංකාව තුළ අඩු බර උපත් හා වැඩීම නතර වීම සඳහා දායක වන ප්‍රධානම සාධකය කුටුම්භ ආදායම ලෙස, 1993 සහ 2012 අතර අනුක්‍රමිකව සිදු කළ ජාතික සමීක්ෂණ විශ්ලේෂණ මගින් සොයා ගෙන ඇත. දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් බොහොමයකට ආහාර සපයා ගැනීමේ හැකියාව, පවුලේ සියලු සාමාජිකයන්ට පිළිගත් අවම ශක්ති අන්තර්ගතය ලබා ගැනීම තහවුරු කිරීමට කෙසේවත් ප්‍රමාණවත් නොවේ. ඒ අනුව, ශක්ති ඌනතාවය ආදායම සමඟ සමීප සම්බන්ධතාවක් පවතී. දෛනික කුටුම්භ කැලරි ඌනතාව 2,000-3,500 අතර වෙමින්, ශක්ති ඌනතාවයන්ට මුහුණදෙන ඉතා දරිද්‍රතාවයෙන් යුතු කුටුම්භයන්ගේ ශක්ති පරිභෝජනය, ධනවත් කුටුම්භයන්ගේ ශක්ති පරිභෝජනයෙන් තුනෙන් දෙකකට සමාන වේ. දරිද්‍රතාවෙන් යුතු කුටුම්භයන් ඔවුන්ගේ මුළු ආදායම ම ආහාර සඳහා වැය කරන බව සැලකූ විට ද, ඔවුන්ට තනිවම මෙම පරතරය අවම කිරීමට හැකියාවක් නැත. හොඳම වෛද්‍ය තත්ත්ව යටතේ වුවද, දරිද්‍රතාවයෙන් යුත් පවුල්වල ළමුන් සාමාන්‍ය වර්ධන ප්‍රමාණයන්ට ළඟා වීම හෝ කැලරි ඌනතාවෙන් යුත් මව්වරුන්ට සාමාන්‍ය බරෙන් යුත් දරුවන් ප්‍රසූත කිරීම ජෛව විද්‍යාත්මක වුවද අපේක්ෂා කළ නොහැකි වේ.

1990 දශකයේ සිට ශ්‍රී ලංකාව අත්කරගත් ඒක පුද්ගල ආදායමට සාපේක්ෂව සියයට 5-6 අතර වූ වාර්ෂික වර්ධනය සාපේක්ෂව පෝෂණ ඌනතා දර්ශකයන්ගේ සුළු වර්ධනයක් දක්නට ලැබුණි. ආර්ථික වර්ධනයේ අසමාන බෙදීම මේ සඳහා ආංශික වශයෙන් දායක වේ. මෙම ඉහළ වර්ධනයෙන් ලද ප්‍රතිලාභයන් බොහොමයක් දිළිඳු නොවන යුතු වූවන්ට ලබා දෙමින් දරිද්‍රතාවයෙන් යුතු වූවන්ට සුළු ප්‍රතිලාභ ප්‍රමාණයක් ගෙන දුණි. මෙය දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන අයගේ ජීවන තත්ත්වයේ පවතින අඩුපාඩුවල ප්‍රතිඵලයක් වේ. ශ්‍රී ලාංකිකයන්ගෙන් සියයට 40 ක් වූ දරිද්‍රතාවයෙන් යුතු වූවන්ට ලැබෙන ආදායම් කොටස 1990 දී සියයට 21 සිට 2012/13 වසරේ දී සියයට 13.7 දක්වා පහළ යෑමට වර්ධන විෂමතා හේතු විය. මේ සමග, රජයේ සහනාධාර ඉලක්ක කිරීම දුර්වල මට්ටමක පැවතීම ශ්‍රී ලංකාවේ දුප්පත් ම ජනගහනයේ ආහාර සුරක්ෂිතාව කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

රට තුළ පෝෂණ ඌනතාවය හා පාදක ප්‍රශ්නවල සමාජ-ආර්ථික වැදගත්කම හේතුවෙන් රජය මගින් දැනට සිදු කරගෙන යනු ලබන ප්‍රයත්නයන්ට අමතරව, දරිද්‍රතාවයෙන් යුතු වූවන් අතර පෝෂණ තත්ත්වයන් වැඩිදියුණු කිරීමට බහුවිධ ප්‍රවේශයෙන් යුතු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. ඵලදායී ජාතික උපායමාර්ගයක් මගින් අවදානමට ලක් වූ පවුල්වලට ඵලදායී හා ප්‍රමාණවත් ආහාර සැපයුම හා දේශීය නිෂ්පාදනයන් ඉහළ දැමීමට හා විවිධාංගීකරණයට අවශ්‍ය කෘෂිකාර්මික උපායයන්, සහ එවැනි මූලික මැදිහත්වීම් සඳහා සහාය දීම, දැනුම් දීම සහ සැපයුම වැනි ක්ෂුද්‍ර මැදිහත්වීම් අන්තර්ගත විය යුතුය. මෙම ගැටලුව නිරාකරණය කිරීමට පෝෂණ ක්ෂේත්‍රයේ සෞඛ්‍ය සේවකයන්ගේ ශක්‍යතාව ගොඩනැංවීම සඳහා ප්‍රමාණවත් මූල්‍යයනයන් සැලසීම වැනි සෞඛ්‍ය නොවන මැදිහත්වීම් ද අත්‍යවශ්‍ය වේ. ඊට අමතරව, පෝෂණ මට්ටම්වල විෂමතා පුළුල් වීම පිළිබිඹු කරනු ලබන, ළමුන් අතර අධිපෝෂණය ඉහළ යෑමේ කරුණු සලකා බලා, අනාගත පරපුර අතර දියවැඩියාව හා හෘද රෝග වැනි තත්ත්වයන්ගේ වර්ධනය වැළැක්වීමට කඩිනම් අවධානය යොමු කළ යුතු වේ.

**ඉදිරි දැක්ම**

ශ්‍රී ලංකාව මැදිකාලීනව ඉහළ ආර්ථික වර්ධනයක් ස්ථාවරව පවත්වාගෙන යාමට අපේක්ෂා කරන අතර එය ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට අවස්ථාවන් ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් හේතුවෙන් පීඩාවට පත්විය හැකි ජනගහනය දරිද්‍රතාවයෙන් නගාසිටුවීම සඳහා, ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභයන් "පහළට කාන්දු වීම" (trickling down) මත ප්‍රතිපත්ති සම්පාදකයන්ට සම්පූර්ණයෙන් විශ්වාසය තැබීමට නොහැකි වී ඇත. එබැවින්, සර්ව සහභාගිත්ව වර්ධනය තුළින් සෞභාග්‍ය බෙදා ගැනීම සඳහා, රජය විසින් සමස්ත මහජනතාවම වර්ධන ක්‍රියාදාම සඳහා දායක වීම පමණක් නොව, එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට හැකි වන වර්ධන ක්‍රියාදාමයක් නිර්මාණය කර එය ශක්තිමත්ව හා අඛණ්ඩව පවත්වාගෙන යෑම අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතුය.

සීමිත සම්පත් ප්‍රමාණයක්, කුඩා දේශීය වෙළඳපොළක් හා ආයෝජන ධාරිතාවයක් සහිත රටක් ලෙස ශ්‍රී ලංකාව අපනයන මූලික කරගත් ක්‍රමෝපායයන් කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර ආනයන ආදේශන යෝග්‍ය පරිදි ධෛර්යමත් කළ යුතුය. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය නිෂ්පාදනවල තරගකාරිත්වය අඩු වීම කෙරෙහි බලපා ඇති පොදු ගැටලු වන්නේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වන ආයෝජන ප්‍රමාණවත් නොවීම, විශේෂයෙන්ම අපනයන සඳහා මූල්‍ය පහසුකම් නොපැවතීම, වෙළඳ ප්‍රවර්ධනය ප්‍රමාණවත් නොවීම, වෙළඳ ප්‍රදර්ශන හා වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා සහභාගිවීමට කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවලට ලැබෙන සහාය අඩු වීම, පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟකම නිසා ඵලදායීතාව අඩු වීම සහ ඉහළ බලශක්ති පිරිවැයයි. මීට අමතරව, අපනයන නිෂ්පාදිත සහ වෙළඳ ගමනාන්ත විවිධාංගීකරණය නොවී පැවතීම, අපනයන ආදායමෙහි අස්ථාවරභාවයක් ඇති කිරීමට හේතු විය හැකි බැවින් ඒ පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම හැරුණු කොට, අපනයන කර්මාන්ත අගය දාමයේ ඉහළට ගෙන යෑම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධ වූ බහුවිධ ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන්, ගෝලීය අගය දාම තුළ සංසන්දනාත්මක ප්‍රතිලාභ භුක්තිවිඳිය හැකි ඉහළ අපනයන හැකියාවක් ඇති කර්මාන්ත ඒකාබද්ධ කිරීමේ හැකියාව සොයා බැලීම හා ඒ සඳහා ධෛර්යමත් කිරීම කළ යුතු අතර, මෙම අංශවල සිටින අනෙකුත් ආයෝජකයින් සහ විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම ද කළ යුතුය. එමනිසා, ශ්‍රී ලංකාව තරගකාරී කර්මාන්ත ප්‍රවර්ධනය කළ යුතු අතර ප්‍රාග්ධනයට අමතරව නවීන තාක්ෂණය, කළමනාකරණ කුසලතා, තාක්ෂණික විශේෂඥ දැනුම සහ සුරක්ෂිත වෙළඳපොළ සහිතව පැමිණෙන ආයෝජකයන් ආකර්ෂණය කර ගත යුතුය.

**වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ අපනයන නිෂ්පාදිත විවිධාංගීකරණය කිරීම සඳහා අපනයනකරුවන් විසින් දැනට පවතින වෙළඳ ගිවිසුම් සහ වෙළඳාමට පහසුකම් සැපයීම සඳහා ඇති ක්‍රියාමාර්ග උපරිමයෙන් භාවිතා කළ යුතුය.** සමස්ත අපනයනයෙන් තුනෙන් දෙකක පමණ ගැනුම්කරුවන් වන යුරෝපා සහ ඇමෙරිකා එක්සත් ජනපද වෙළඳපොළ මත ශ්‍රී ලංකාවේ අපනයන බොහෝදුරට රඳා පැවතීම සහ සාම්ප්‍රදායිකව පවතින අපනයන වෙළඳපොළ මත අඛණ්ඩව රැඳී සිටීම හේතුවෙන් ශ්‍රී ලංකාව බාහිර කම්පනවල අවදානමට ලක් වී ඇත. ජාත්‍යන්තර වෙළඳාම ශක්තිමත් හා වැඩිදියුණු කිරීම සඳහා මෑත වසරවල දී කලාපීය වෙළඳ ගිවිසුම් මූලිකත්වය ගෙන තිබෙන අතර, ඒ හරහා ප්‍රධාන වශයෙන් අන්‍යෝන්‍ය වශයෙන් වන වෙළඳ බාධක අඩු කර ගෙන ඇත. ශ්‍රී ලංකාව ද බොහෝ දුරට කලාපීය රටවල් ඉලක්ක කරගනිමින් ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් සඳහා අත්සන් තබා ඇත. කෙසේ වුවද, වරණීය වෙළඳ ගිවිසුම් හතරක් පමණක් සහිතව ශ්‍රී ලංකාව මේ සම්බන්ධයෙන් මඳක් පසුපසින් සිටී. ශක්‍යතා සහිත අපනයන වෙළෙඳපොළ ලෙස විශාල ආර්ථිකයන්ගෙන් ප්‍රයෝජන ගැනීම සඳහා චීනය සමඟ නිදහස් වෙළඳ ගිවිසුමක් ඇතිකර ගැනීමට ඇති හැකියාව සලකා බලමින් සිටින අතර, එය චීනය වෙත සිදුකරන අපනයන ඵලදායී ලෙස වර්ධනය වී දැනට පවතින වෙළඳ පරතරය අඩුවන ආකාරයට සැලකිලිමත්ව කෙටුම්පත් කළ යුතුය. අධ්‍යනයන්ගෙන් හෙළිදරව් වී ඇති ආකාරයට තීරුබදු සහන අඩු මට්ටමක පැවැතීම, නිශේධනාත්මක ලැයිස්තු, තීරු බදු නොවන බාධක, ක්‍රමිකව අඩු කිරීමේ ප්‍රවේශය (Phase-down approach), නිෂ්පාදන ව්‍යුහයේ හා පාරිභෝජන රටාවේ ඇති සමානකම් සහ නීති විරෝධී වෙළඳාම යනාදිය මත දකුණු ආසියානු කලාපීය වෙළඳ ගිවිසුම්වල සාර්ථකත්වය සීමිත වී ඇත. වරායවල පවතින අවහිරතාවලට අමතරව වෙළඳ නොවන බාධක, නිෂ්පාදිත රට තහවුරු කර ගැනීමේ දී පවතින නීතිමය ගැටලු, ආනයන සලාක සීමා, ආනයන බලපත්‍ර අවශ්‍යතාවන්, ලේබල්කරණය පිළිබඳව පවතින නියමයන් සහ තාක්ෂණ අනුමැතීන් ලබාගැනීමේ දී ඇතිවන පිරිවැය හා පමාව යනාදී වෙළඳ නොවන බාධක හේතුවෙන් ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙන් ලබාදී ඇති ප්‍රතිලාභ අත්කරගැනීම සඳහා අවහිරතාවන් නිර්මාණය වී ඇත. මෙවැනි ගැටලු හේතුවෙන් පවතින නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳව අපනයනකරුවන්ගේ විශ්වාසය පලුදු වී ඇත. කෙසේ වුවද, ඉන්දියානු වෙළඳපොළෙහි විශාලත්වය සහ වර්ධනය සැලකූ විට ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සඳහා විශාල, ප්‍රයෝජනයට නොගත් හා දියුණු කළ හැකි වෙළඳපොළක් නිර්මාණය වී ඇති බැවින් බදු නොවන බාධක පිළිබඳ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. මේ යටතේ, ඉන්දියානු තොටුපළවලදී මුහුණ දීමට සිදුවන බාධක අවම කර ගැනීම සඳහා අනුකූලතා ඇගයුම් ක්‍රියාපටිපාටි (Conformity Assessment Procedures) වෙනුවෙන් අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ ගිවිසුම්වලට (Mutual Recognition Agreement) එළැඹීම පිළිබඳ සලකා බැලීම ඵලදායී වනු ඇති අතර, ඒ සමඟම අවම පිරිවැයක් යටතේ ජාත්‍යන්තර හෝ ආනයනය කරන රටවල ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි අපනයනය

කළ හැකි වන ලෙස අපනයනකරුවන්ගේ හැකියා ඉහළ නැංවීම සහතික කිරීම සඳහා ද ක්‍රියාමාර්ග ගත යුතුය. තවද, විශේෂයෙන් බඳු නොවන බාධක පිළිබඳ ඉන්දියාව සමඟ ද්විපාර්ශ්වික කතිකාවත් තවදුරටත් පවත්වා ගත යුතු අතර, ඊට සම්බන්ධ පාර්ශ්වකරුවන් වෙත ඵලදායී ලෙස තොරතුරු බෙදාහැරීම සිදු කළ යුතුය. එසේම, බහුපාර්ශ්වීය නිදහස් වෙළඳ ගිවිසුම් හරහා ගෝලීය නිෂ්පාදන අගය දාමයේ සහභාගීත්වය ඉහළ නංවා ගැනීමටත්, එමගින් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලබා ගැනීමටත් ක්‍රියා කළ යුතුය. මේ සම්බන්ධයෙන් ආසියානු සැපයුම් දාමයේ ප්‍රධාන ක්‍රියාකාරීන් වන දකුණු කොරියාව, ජපානය, සිංගප්පූරුව සහ මැලේසියාව සමඟ ආර්ථික සහයෝගීතාවන් හෝ නිදහස් වෙළඳ ගිවිසුම්වලට එළැඹීම ඵලදායී වන අතර, වෙළඳාම වැඩිදියුණු කර ගැනීම සඳහා එවැනි ගිවිසුම් ආසියාවෙන් බැහැර වූ ප්‍රධාන අපනයන ගමනාන්තයන් සමඟ ද ඇතිකර ගැනීම යෝග්‍ය වේ. එසේම, ශ්‍රී ලාංකීය තොරතුරු තාක්ෂණ නිෂ්පාදන අපනයනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන පසුබිමක ලෝක වෙළඳ සංවිධානය සමඟ තොරතුරු තාක්ෂණය පිළිබඳ ගිවිසුමට එළැඹීමෙන් ඇති විය හැකි බලපෑම පිළිබඳ ඇගයීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ශක්‍යතාවන් පවතින වෙළඳපොළ සඳහා වරණීය වෙළඳ ගිවිසුම් නොමැති වීම මෙන්ම ශ්‍රී ලංකාවේ තරගකරුවන් මෙවැනි රටවල් සමඟ වරණීය තීරුබදු ක්‍රමයන්ට ප්‍රවේශ වීම තවත් සැලකිල්ලට ගත යුතු කරුණකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර වෙළඳපොළෙහි අසමාන තත්ත්වයන් යටතේ තරග කිරීමට මෙරට අපනයනකරුවන්ට සිදු වී ඇති අතර, එය ශ්‍රී ලංකාවට අවාසිදායක තත්ත්වයක් නිර්මාණය කර ඇත. වෙළඳපොළ වෙත ප්‍රවේශවීම සඳහා නිදහස් වෙළඳ ගිවිසුම් සහ වරණීය වෙළඳ ගිවිසුම් ආරම්භ කිරීම සහ එම ගිවිසුම් නිසි ලෙස උපයෝජනය කිරීම ශ්‍රී ලංකාවේ තරඟකරුවන් අතර තරඟකාරී ප්‍රතිලාභයක් ලබා ගැනීමට උපකාරී වනු ඇති අතර ජාත්‍යන්තර වෙළඳපොළ සමග සබඳතා ඇතිකර ගැනීමට ඉඩ සලසයි. මේ අතර, වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ වන සහන ලබාගැනීම සහ යුරෝපා වෙළඳපොළ වෙත මත්ස්‍ය අපනයනය සඳහා වන තහනම ඉවත් කිරීම සඳහා ප්‍රයත්නයන් කඩිනම් කළ යුතුව ඇත.

**සමාජ ආර්ථික යටිතල පහසුකම් සඳහා අඛණ්ඩ රාජ්‍ය ආයෝජන පැවැතිය ද, ශ්‍රී ලංකාව මැදි ආදායම් ආර්ථිකයක් බවට පත්වීම තුළින් පැනනගින සංවර්ධන අභියෝග, සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් නිර්මාණය කිරීම සඳහානිසි ලෙස ඉලක්කගත වූ සහ කේන්ද්‍රගත වූ ප්‍රායෝගික ප්‍රතිපත්ති තුළින් නිරාකරණය කළ යුතුය.** සම තත්ත්වයේ පවතින කලාපීය රටවල් සහ අනෙකුත් අඩු-මැදි ආදායම් ආර්ථිකයන් සමඟ සසඳන විට ශ්‍රී ලංකාව සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ මගින් ස්ථාපිත කළ ඉලක්ක බොහොමයක් ඉටුකර ගැනීමේ දී ඉදිරියෙන්ම ඇති අතර, ඒවායින් සමහර ඉලක්ක 2015 වසරට පෙරම ළඟාකර ගෙන ඇත. එසේ නමුත්, දුර්වල අධ්‍යාපන තත්ත්වය, සෞඛ්‍ය හා පෝෂණ දර්ශකවල අඩු ක්‍රියාකාරීත්වය සහ සුරක්ෂිත පානීය ජලය, සනීපාරක්ෂාව හා විදුලිය වැනි මූලික යටිතල පහසුකම් වෙත වූ ප්‍රවේශය අවම වීම මෙන්ම මූල්‍ය සාක්ෂරතාවයේ හා මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශ වීමේ අඩුපාඩු පැවතීම ආදී කරුණු හේතුවෙන් රටෙහි ඇතැම් ප්‍රදේශ සහ ජන කොටස් අවදානම් සහගත තත්ත්වයේ පවතින බව අධ්‍යයන මගින් පෙන්වා දෙයි. 2015 වසරේ දී ලෝක බැංකුව ප්‍රකාශයට පත්කර ඇති වාර්තාවකින් දක්වන පරිදි, 2002 සිට 2012/13 අතර කාලය තුළ දී දරිද්‍රතාවය විශාල ලෙස අඩු වුව ද, සෑම පුද්ගලයින් හතර දෙනෙකුගෙන් එක් අයෙකු නිල දරිද්‍රතා රේඛාවට ඉහළ ජීවන මට්ටමක් ඇති නමුත්, දෛනික ආදායම 2005 ක්‍රය ශක්ති සාම්‍යයට ගලපන ලද එ.ජ. ඩොලර් 2.50 ට අඩු අතර දරිද්‍රතාවට ආසන්න මට්ටමක සිටී. මෙය විශේෂයෙන්ම ආර්ථික කම්පන සහ ස්වාභාවික විපත් පවතින කාලවල දී ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් අතර ඉහළ මට්ටමේ අනාරක්ෂිත බවක් පවතින බව විදහා දක්වයි. අභ්‍යන්තර අර්බුදය නිම වීමෙන් පසු සමයේ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය වේගවත් වී තිබුණ ද, සමහර පළාත් රටේ ඉහළ වර්ධනයෙහි ප්‍රතිලාභ සඳහා දායකවීමට සහ එහි ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී වර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන ප්‍රවාහයේ සීමාවෙන් පිටත අඛණ්ඩව රැඳී සිටීම, පළාත් අතර පවතින සැලකිය යුතු දරිද්‍රතා විෂමතා මගින් ඉස්මතු කර දක්වයි. පළාත්වලින් ද.දේ.නි.යට දක්වන දායකත්වයෙහි පවතින අසමානතා මගින් මෙය තවදුරටත් සනාථ කෙරෙන අතර, එමගින් සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධන ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට ප්‍රතිපත්ති නැවත මෙහෙයවීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරෙයි. මෙබඳු ප්‍රතිපත්ති මගින් අධ්‍යාපනය හා සෞඛ්‍ය, යටිතල පහසුකම් හා ප්‍රදේශ අතර සම්බන්ධතාව, ශ්‍රම වෙළඳපොළට ප්‍රවේශය සහ රැකියා අවස්ථා පැවතීම ආදී වූ පොදු සේවාවන් බෙදාහැරීමේ දී ප්‍රාදේශීයව පවතින පරතර හේතුවෙන් පැනනගින අභියෝගයන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එබඳු මැදිහත්වීම්වල සඵලතාව, පසුගාමී පළාත්වල තනිපුද්ගල අවශ්‍යතා හඳුනා ගැනීම සහ

ඔවුන්ගේ විශේෂ අභියෝග සපුරාලීමට සමත් බහු ආංශික මැදිහත්වීම් සංවර්ධනය කිරීම මත බොහෝ සෙයින් රඳා පවතිනු ඇත. මෙම මැදිහත්වීම් නිසි ලෙස ඉලක්ක කිරීම මගින් බලාපොරොත්තු වන ප්‍රතිඵල වේගයෙන් ළඟාකර ගැනීම සහතික කරනවා පමණක් නොව මූල්‍ය කාර්යක්ෂමතාව ද සහතික කරනු ඇත.

**ඉහළ ගුණත්වයෙන් යුතු මානව ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා, වැඩි වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම පිණිස ඵලදායී ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.** කෘෂිකර්මය මුල් කරගත් ආර්ථිකයේ සිට කාර්මික සහ සේවා අංශ මුල් කරගත් ආර්ථිකයක් බවට පත්වෙමින් රටේ ආර්ථිකයේ අතීතයේ සිට සිදු වී ඇති ව්‍යුහාත්මක පරිවර්තනයත් සමඟ, මෙම අරමුණු ළඟාකර ගැනීම සඳහා නිෂ්පාදන සහ අගය එකතු කළ සේවා වැඩිදියුණු කිරීම වැදගත් වේ. ආර්ථික සහ සමාජීය සංවර්ධනයේ ඉහළ මට්ටමක් කරා ළඟා වීම සඳහා ඉහළ ක්‍රියාකාරිත්වයක් සහිත සේවා අංශයට අමතරව දියුණු කාර්මික අංශයක් පැවැතීම අත්‍යවශ්‍ය බව නිරීක්ෂණය කර ඇත. කෘෂිකාර්මික අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට අඩු දායකත්වයක් තිබියදීත්, කෘෂිකාර්මික අංශය තවදුරටත් ප්‍රධානම සේවා යෝජකයා වන අතර, එය මුළු සේවා නියුක්තියෙන් සියයට 28.2 ක් පමණ වේ. මෙයට අමතරව, රාජ්‍ය අංශය සේවා නියුක්තියෙන් සියයට 15 කට පමණ දායකත්වයක් සපයයි. මෙය, අනෙකුත් අංශ සඳහා ශ්‍රම හිඟයක් නිර්මාණය කරමින් සාපේක්ෂව අඩු ඵලදායීතා පැවතීම ඉහළ යෑමට හේතු වේ. කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තියේ පෙන්නුම් කරනු ලබන අඩු වීම තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කරන නමුත් මෙම ශ්‍රමිකයන් කාර්මික සහ සේවා අංශයේ රැකියා සඳහා සෘජුව නිරතවීමට ඇති හැකියාව පිළිබඳ ගැටලු පවතින අතර, එමගින් ශ්‍රම සංචලනය පිළිබඳ ගැටලු මතු කරයි. ඉහළ වර්ධන මාවතකට අවතීර්ණ වීමට අවශ්‍ය වන්නා වූ අපේක්ෂිත ප්‍රමිතියෙන් යුතු පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟයක් දක්නට ඇති අතර, මෙය බොහෝ කාර්මික සහ සේවා අංශයන් මුහුණ දෙනු ලබන දීර්ඝකාලීනව පවතින ගැටලුවකි. මෙවැනි පසුබිමක් තුළ, කාර්මික නිෂ්පාදන වර්ධනය කිරීමේ සහ ඉහළ වටිනාකම් හා ඉහළ තාක්ෂණයෙන් යුතු නිෂ්පාදිත හා සේවා තුළින් තරගකාරීත්වය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව මානව සම්පත් සංවර්ධනය කිරීම, ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත්වීමට උත්සාහ ගැනීමේ දී අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන්ම අපනයන අංශය ඉලක්ක කරගනිමින් අවශ්‍ය දැනුම සහ වැඩි ඉල්ලුමක් පවතින නිපුණතා කාණ්ඩ කෙරෙහි පුහුණුව ලබාදීම සඳහා, ඕස්ට්‍රේලියාවේ කාර්මික සහ වැඩිදුර අධ්‍යාපන ආයතන (Technical and Further Education Institutions) හෝ ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රජා විද්‍යාල (Community Colleges) උදාහරණ වශයෙන් ගෙන, වෘත්තීය පුහුණු හෝ කාර්මික විද්‍යාල පිහිටුවීම සම්බන්ධයෙන් සලකා බැලීම ප්‍රයෝජනවත් විය හැකිය. මීට අමතරව, දේශීය විශ්වවිද්‍යාල වෙත ඇතුළුවීමට නොහැකි වූවන් සඳහා පවතින ඉඩප්‍රස්ථා වැඩි කරමින්, නිපුණතා පරතරය පියවීම සඳහා පවතින කාර්මික විද්‍යාල විදේශ සහභාගීත්වයන් මගින් හෝ වර්තමාන අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි පුළුල් කිරීම සහ තත්ත්වයෙන් උසස් කිරීම පිළිබඳව නැවත සලකා බැලීම ඵලදායී විය හැකිය. තවද, ගෝලීය ආර්ථිකයේ සිදුවන වේගවත් තාක්ෂණික දියුණුව මගින් ද දේශීය කර්මාන්ත සඳහා බලපෑම් ඇති කරයි. නම්‍යශීලී රැකියා අවස්ථා (Flexible work option) හඳුන්වාදීම ද ඇතුළත්ව, පවතින තත්ත්වයන්ට අමතරව මෙවැනි වර්ධනයන් මගින් නව අභියෝග රැසක් ඇති කරයි. තරගකාරී ආසියානු රටවල් කිහිපයක් සමඟ සැසඳීමේ දී ඉහළ වැටුප් සහ සාපේක්ෂව ඉහළ නිෂ්පාදන පිරිවැයක් පැවැතීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ අපනයන තරගකාරීත්වය ඉහළ නැංවීම සඳහා කර්මාන්තවල ස්වයංක්‍රීයකරණය කිරීමේ අවශ්‍යතාව ඉහළ යමින් පවතී. දැනටමත් ශ්‍රී ලංකාවේ සමාගම් කිහිපයක් ස්වයංක්‍රීය යන්ත්‍ර භාවිතය ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ කර්මාන්තශාලා සඳහා රොබෝ තාක්ෂණය යොදා ගැනීම සඳහා තීරණය කර ඇත. මෙවැනි තත්ත්වයක් තුළ තාක්ෂණය පාදක කරගත් වර්ධනයන් මගින් ඉල්ලුම් කරන ඉහළ මට්ටමේ නිපුණතා අවශ්‍යතාවන්ගෙන් ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය සන්නද්ධ කිරීමත්, උනන්දු කිරීමත් අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, දැනුම බෙදා දීම හා යහපත් ආකල්ප ඉගැන්වීමටත්, දේශීය කර්මාන්තයන්හි යහපත් වැඩපරිචයන් ඇති කිරීමටත් උපකාරී වීම සඳහා අධ්‍යාපනික, කාර්මික හා වෘත්තීමය සුදුසුකම් හා විදේශයන්ගෙන් ලැබූ අත්දැකීම් සහිතව නැවත ශ්‍රී ලංකාවට පැමිණි පුද්ගලයන් තවදුරටත් උනන්දු කරන අතර, විශේෂඥ දැනුමින් හා කාර්මික ඥානයෙන් යුත් විදේශගත ශ්‍රී ලාංකිකයන් නැවත පැමිණීම උනන්දු කිරීමට ද පියවර ගත යුතුය.

**නිදහස ලැබීමට පෙර පවා අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු කර ඇති සැලකිය යුතු ආයෝජනවල ඵල නෙළා ගැනීමට හා එම ජයග්‍රහණ ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපන පද්ධතිය ඉල්ලුම පදනම් කරගත් ක්‍රමයක් බවට විකාශනය කිරීම අත්‍යවශ්‍ය වේ.** අධ්‍යාපනය සඳහා සැමට ප්‍රවේශ වීමට හැකියාව ලබා දීම සඳහා, පැවැති රජයන් විසින් දරන ලද කැපවීම මෙරට ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට ආසන්න වශයෙන් සියලු දෙනාට ප්‍රවේශ විය හැකි

තත්ත්වයක් ඇති කිරීම සඳහා උපකාරී විය. ශ්‍රී ලංකාවේ ජනගහනය ඉහළ සාක්ෂරතාවයකින් යුතු වුව ද, ඉහළ ආදායම් ලබන ආර්ථිකයන්ට සාපේක්ෂව භාෂා හා සංඛ්‍යාත්මක කුසලතා සම්බන්ධයෙන් පසුගාමී බවක් පෙන්නුම් කරයි. විෂය අන්තර්ගතය පදනම් කරගත් හා විභාග ඉලක්ක කරගත් විෂයමාලා දැඩි ලෙස අනුගමනය කරනු වෙනුවට පද්ධතිය තුළින් ලබා දෙන අධ්‍යාපනය තුළින් සිසුන්ට ජීවන කුසලතා අත්කර ගැනීමට උපකාරී වෙමින් ඔවුන්ගේ නිපුණතා ඔප් නැංවිය යුතු අතර, නිදහස් චින්තනය ද ධෛර්යමත් කළ යුතුය. භාෂා ප්‍රවීණතාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම සහ සන්නිවේදනය, නායකත්වය, නිර්මාණශීලිත්වය හා ගැටලු නිරාකරණය වැනි මෘදු කුසලතා වැනි වෙළඳපොළ ඉලක්ක කරගත් කුසලතා සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීමට මෙමගින් හැකියාව ඇත. තෘතීයික මට්ටමේ දී, තිරසාර ආර්ථික වර්ධනයකට උපකාරී වීමට අවශ්‍ය ඉහළ මට්ටමක පර්යේෂණ හා සංවර්ධන (R&D) නිමැවුම් හි පවතින හිඟය අභියෝගයක්ව පවතී. ගෝලීය වෙළඳාම හා සේවා තරගකාරී බවට පත් කිරීම පිණිස ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ අපේක්ෂිත වාසිය ලබා දීම සඳහා අවශ්‍ය අපේක්ෂිත මට්ටමට ළඟාවීමට විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල පර්යේෂණ කිරීමේ කටයුතු අසමත් වී ඇත. කර්මාන්ත ක්ෂේත්‍රය හා විද්වතුන් අතර ශක්තිමත් නව නිපැයුම් ඉලක්ක කරගත් ආයතනික සම්බන්ධතා ගොඩනැගීම මේ සඳහා අවශ්‍ය වනු ඇති අතර, එය විශ්වවිද්‍යාල ව්‍යුහය, ස්වයං-පවත්වා ගැනීමේ ආකෘතියක් බවට පරිවර්තනය කිරීමට උපකාරී වීමට ද හැකිවනු ඇත. තවද, උසස් අධ්‍යාපනය සඳහා සිසුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් සැලකීමේ දී ශ්‍රී ලංකාව, වෙනත් මැදි ආදායම් ලබන රටවලට සාපේක්ෂව පසුපසින් සිටී. රාජ්‍ය අධ්‍යාපන පද්ධතියේ පවතින සීමිත ධාරිතාව මේ සඳහා විශාල වශයෙන් හේතු විය හැකි අතර, පෞද්ගලික අධ්‍යාපනය ලබා ගත හැකි බව හා දැරිය හැකි බව වැනි ගැටලු හේතුවෙන් එම ක්ෂේත්‍රයේ පවතින අවස්ථා සීමා වේ. රාජ්‍ය මූල්‍ය අංශයේ පවතින සීමා සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන පද්ධතියේ නිමැවුම්වල ඵලදායීතාව හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය ආයෝජන සැපයීමට පෞද්ගලික අංශයේ ඉහළ දායකත්වය උපකාරී වනු ඇති අතර, එමගින් පාසල් හැරයන්නන්ගේ හා උපාධිධාරීන්ගේ කුසලතා වැඩිදියුණු කර ගැනීමට සහාය ලැබෙනු ඇත.

**අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගය පසුගිය දශක දෙක පුරා ශ්‍රී ලංකාව තුළ බරපතල සෞඛ්‍ය ගැටලුවක් බවට පත් වී ඇත.** මෙම අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගය ප්‍රථම වරට 1990 දශකයේ මුල් භාගයේ දී උතුරු මැද පළාතෙන් අනාවරණය වූ අතර, වර්තමානයේ දී අනෙකුත් යාබද පළාත් හා දිස්ත්‍රික්ක 10 ක් පුරා ශීඝ්‍රයෙන් පැතිර යෑම විශාල අභියෝගයක් වී ඇත. ශ්‍රී ලංකාවට අමතරව මෙම වකුගඩු රෝගය ඉන්දියාව, එල්සැල්වදෝරය හා නිකරගුවාව යන රටවල ද දක්නට ලැබේ. කෙසේ වෙතත්, ඉහළ කෘෂි රසායන භාවිතය, කැල්සියම් සහ ෆ්ලෝරයිඩ් ඉහළ මට්ටමක් ඇති කිවුල් ජලය, ප්‍රමාණවත් ලෙස පානීය ජලය භාවිතා නොකිරීම සහ උණුසුම් වීම හේතුවෙන් ඇතිවන විජලනය සහ ආසනික් හා කැඩ්මියම් ඉහළ මට්ටමක පවතින සහ සෙලනියම් අඩු මට්ටමක පවතින ඇතැම් රසායනික සංයෝගයන් මෙම රෝගය හටගැනීම සඳහා රෝග කාරක සාධක කිහිපයක් ලෙස පෙන්වා දිය හැකිය. මෙම වකුගඩු රෝගයේ බලපෑමට ලක්වන කාන්තාවන් හා ළමුන් සංඛ්‍යාව වර්ධනය වෙමින් පවතින නමුත් බලපෑමට පත්වූවන්ගෙන් බහුතරයක් පවුල් නඩත්තුව සඳහා මුදල් උපයන වී ගොවීන් සහ කෘෂිකාර්මික කම්කරුවන්ගෙන් සමන්විත පිරිමි පුද්ගලයන් වේ. මෙම රෝගය නිසා ආදායම අහිමි වී යෑම හේතුවෙන් මුළු පවුලේම සමාජ ආර්ථික තත්ත්වයට අහිතකර ලෙස බලපෑම් ඇති වේ. ශ්‍රී ලංකාව තුළ පුළුල් විධිමත් සමාජ සත්කාරක පද්ධතියක් නොමැති වීම, වකුගඩු රෝගය ඇති වූ දා පටන් ඵලදායීතාව අහිමි වීම සහ වෛද්‍ය උපදෙස්, ඖෂධ, රුධිර කාන්දුකරණය සහ බද්ධකිරීම් සඳහා දැරීමට සිදුවන වියදම් හේතුවෙන් ප්‍රජාවන් සහ පවුල් ආර්ථික වශයෙන් අස්ථාවර තත්ත්වයන්ට පත් වේ. මෙම රෝගය වැළඳීමේ ඉහළ අවදානමක් සහිත ප්‍රදේශවල ජනගහනය වකුගඩු රෝගීන්දැයි පෙර හඳුනා ගත හැකි පරීක්ෂණ 2008 වසරේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී. සෞඛ්‍ය සඳහා වන රජයේ වියදම ඉහළ නැංවීමට දායක වන නිදන්ගත රෝගී තත්ත්වයන් වන අධි රුධිර පීඩනය හා දියවැඩියාව වැනි රෝග පාලනය කිරීම තුළින් රෝග කලින් හඳුනා ගැනීම රෝගීන්ගේ ආයු කාලය ඉහළ නැංවීමට හේතු වේ. මේ අතර, අවිනිශ්චිත සම්භවයක් සහිත වකුගඩු රෝගයට හේතුව කෘෂි රසායන බව ඇතැම් පර්යේෂකයන් විසින් හෙළි කිරීමෙන් පසුව මෙම රෝගය වැළැක්වීමේ පියවරක් ලෙස 2014 අප්‍රේල් මාසයේ සිට පලිබෝධනාශක තුනක් එනම් ක්ලොෆිරිෆෝල්, ප්‍රොපනිල් සහ වබාර්ලි ආනයනය රජය විසින් තහනම් කරන ලදී. පොහොර අධික ලෙස භාවිතය තහනම් කිරීමට සහ කාබනික පොහොර ධෛර්යමත් කිරීම සඳහා රජය විසින් දැනට පවතින පොහොර සහනාධාර වැඩසටහනට ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී.

මීට අමතරව, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගීන් සඳහා රුධිර කාන්දුකරණය, වකුගඩු බද්ධ කිරීමේ වැඩසටහන් හා ඖෂධ ඇතුළු ප්‍රතිකාර සඳහා රජය අඛණ්ඩව සහාය දෙනු ලබයි. තවද සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් ආර්ථික වරප්‍රසාද අහිමි හඳුනාගත් අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගීන් සඳහා රුපියල් 3,000 ක මාසික දීමනාවක් ලබා දීමට පියවර ගෙන ඇත. නල ජලය සපයා නොමැති ප්‍රදේශවලට පිරිසිදු පානීය ජලය ලබා දීමේ තාවකාලික පියවරක් ලෙස ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ප්‍රති-ආශ්‍රැති තාක්ෂණ යන්ත්‍රාගාර හරහා ජලය සපයනු ලබන අතර, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගය සඳහා එරෙහි පියවරක් ලෙස පමණක් නොව, රටේ සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය සඳහා ප්‍රවේශයක් ඇති බව තහවුරු කිරීමට සියලු වැසියන් විශේෂයෙන්ම, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අවදානමට ලක් වී ඇති ප්‍රදේශවල වැසියන් සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමට ජලසම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. තවද, මෙම වසංගතය පාලනය කිරීමේ අරමුණින් බලපෑමට පත් ප්‍රදේශවල ජලයේ තත්ත්වය පරීක්ෂා කිරීම හා රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම, පාසල් සහ රෝහල් සඳහා පිරිසිදු පානීය ජලය සැපයීම, අත් පොම්ප ප්‍රතිසංස්කරණය කිරීම හා පවතින ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම වැඩිදියුණු කිරීම ඉතා වැදගත් වනු ඇත.

**මාර්ගවල පවතින තදබදය විසින් ඇති කරනු ලබන ආර්ථික පාඩු පියවා ගැනීම සඳහා පොදු ප්‍රවාහන සේවා කඩිනමින් වැඩි දියුණු කිරීමට අවශ්‍ය වේ.** ආර්ථික වර්ධනයට, නගරවල වැඩිවන ජනගහනයට සහ නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය අංශ අතර ඉහළ යන ගමනාගමනය සඳහා සහාය දැක්වීමට රටේ ප්‍රවාහන ජාලයට හැකි විය යුතුය. පොදු ප්‍රවාහන පද්ධතියේ පවතින අකාර්යක්ෂමතාවයේ ප්‍රතිඵලයක් ලෙස එක වාහනයක අඩු මගීන් සංඛ්‍යාවක් ප්‍රවාහනය කරමින් මාර්ගවල ධාවනය වන පෞද්ගලික වාහන සංඛ්‍යාව ඉහළ යෑම මගින් දැඩි රථවාහන තදබදයකට මග පාදන අතර, එමගින් ගෘහ ඒකකවලට සහ ආර්ථිකයට දැරීමට සිදුවන ඉන්ධන පිරිවැය ඉහළ යෑම සහ ඵලදායී ශ්‍රම පැය සැලකිය යුතු ලෙස අඩු වීම තුළින් රටෙහි වර්ධන විභවතාව සැලකිය යුතු ලෙස අඩුවීමට හේතු වනු ඇත. ආදායම් මට්ටම ඉහළ යෑම හේතුවෙන් වාහන හිමිකමෙහි අපේක්ෂිත වර්ධනය සමඟ වාහන තදබදය නිසා ඇති වන ආර්ථික පාඩු තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. මාර්ග ඉදිකිරීම හා බස්රථ එක් කිරීම වැනි ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රජය විශාල වශයෙන් ආයෝජන කර ඇති නමුදු හොඳ තත්ත්වයේ සහ විශ්වසනීය පොදු ප්‍රවාහන ක්‍රමයක් නොමැති වීම නිසා වාහන තදබද ගැටලුව අඛණ්ඩව පවතී. එමනිසා, විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල පවතින මාර්ග සහ දුම්රිය ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීමට නිසි පියවර ගැනීම ඉතා වැදගත් වේ. බයිසිකල් සඳහා ආරක්ෂාකාරී සහ පැහැදිලිව වෙන්කරන ලද මාර්ග ස්ථාපිත කිරීම හා පොදු ප්‍රවාහනය සඳහා ඇල මාර්ග ජාලය ඵලදායී ලෙස භාවිතා කළ හැකි ලෙස ප්‍රවර්ධනය කිරීම වැනි විකල්ප ප්‍රවාහන මාධ්‍යයන් ප්‍රවර්ධනය කිරීම තුළින් වාහන තදබදය එක්තරා ප්‍රමාණයකට අඩුකර ගත හැකිය. මැදි කාලීනව, කාර්යක්ෂම පොදු ප්‍රවාහන මාධ්‍යයන් ප්‍රවර්ධනය කිරීම හා තනි පුද්ගලයකු පමණක් ගමන් කරන පෞද්ගලික වාහනවලින් සිදු කරන ගමන් බිමන් සඳහා ඉල්ලුම අඩු කිරීම හෝ පවතින ඉඩකඩ හා කාලය හරහා මෙම ඉල්ලුම නැවත බෙදාහැරීම සඳහා අවශ්‍ය වන්නා වූ උපයාමාර්ග හා ප්‍රතිපත්ති යොදා ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ප්‍රවාහන ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාවලියක් අනුගමනය කිරීම ද ඉතා වැදගත් වේ.

**කාලගුණික රටාවන් තුළ ඇති වන වෙනස්කම් සහ ඉන්ධන මිල ගණන් සමඟ බැඳී පවතින විචලනයන්, පුනර්ජනනීය බලශක්ති වර්ධනය කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන අතර, ශ්‍රී ලංකාව තුළ අඩු වියදමින් බලශක්ති උත්පාදනය කිරීමේ තිරසාරභාවය ඉහළ නැංවීම සඳහා ඇති බාධක මැඩපැවැත්වීමට මූලික ක්‍රියාමාර්ග ගත යුතුයි.** ශ්‍රී ලංකාව සියලුම ප්‍රධාන ජල සම්පත්වල බලශක්ති නිෂ්පාදන විභවතාවය ප්‍රයෝජනයට ගෙන ඇතත්, බලශක්ති සංයුතියට වැඩි දායකත්වයක් ලබා දිය හැකි, වාරිමාර්ග පද්ධතීන් ඇතුළුව මෙතෙක් භාවිතයට ගෙන නොමැති තවත් ජල සම්පත් කිහිපයක් ඇත. රට තුළ විශේෂයෙන්ම මන්නාරම, පුත්තලම සහ යාපනය මෙන්ම කඳුරට ප්‍රදේශවල ද සැලකිය යුතු සුළං බල විභවතාවයක් ඇති බව ද හඳුනා ගෙන ඇත. තවද, පහසුවෙන් සොයාගත හැකි ජෛව ස්කන්ධ සම්පත්, කෘෂිකාර්මික අපද්‍රව්‍ය සහ නාගරික ඝණ අපද්‍රව්‍ය තුළින් ද සැලකිය යුතු බලශක්ති ප්‍රමාණයක් උත්පාදනය කිරීමේ අති විශාල විභවතාවයක් පවතී. තවත් පහසුවෙන් ලබාගත හැකි විදුලිබල ප්‍රභවයක් වන සූර්ය බලශක්තිය විශාල පරිමාණයෙන් සහ විශාල ප්‍රවේශයෙන් යුතු හරිත බලශක්තීන්ට දායකත්වයක් පැවැතිය ද ශ්‍රී ලංකාව විසින් එය නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමට අපොහොසත් වී ඇත. එවැනි පුනර්ජනනීය බලශක්ති

ප්‍රභවයන්හි විභවතාවය ළඟා කර ගැනීමට සහ එම ප්‍රභවයන් භාවිතා කිරීමේ දී ඇති වන තාක්ෂණික, මූල්‍ය සහ ආර්ථික අවහිරතා මැඩපැවැත්වීමට අවශ්‍ය නව ක්‍රමෝපායයන් විමර්ශනය කිරීම සඳහා මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් එකට එක්වීම අත්‍යවශ්‍ය වේ. එවැනි ප්‍රතිපත්ති තුළින්, කුඩා පරිමාණ ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ආකර්ෂණය කර ගැනීම, තරගකාරී සම්පත්වල සහනදායී නොවන දිගුකාලීන පදනමකින් යුත් ආර්ථික පිරිවැය විශ්ලේෂණය, සුදුසු ප්‍රමුඛතා යාන්ත්‍රණයක් පැවැතීම, දිගුකාලීන හා අඩු වියදම් මූල්‍යන ක්‍රම පැවතීම ආදිය පිළිබඳව අවධානය යොමු කළ යුතු අතර, එමගින් පුනර්ජනනීය බලශක්ති මගින් වන ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වනු ඇත. මේ අතර, ගෘහස්ථ හා ව්‍යාපාරික අංශ දෙකෙහිම බලශක්තිය ඉතිරි කිරීමේ ක්‍රමවේද දිරිමත් කිරීම සඳහා අඛණ්ඩව ප්‍රයත්න දැරීම අවශ්‍ය වේ.

**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ වාණිජමය ශක්‍යතාව සහතික කිරීම සඳහා මෙන්ම ගෝලීය තෙල් මිලෙහි වෙනස්කම්වල බලපෑම් දේශීය පාරිභෝගිකයන්ට විනිවිදභාවයකින් ලබාදීමට දේශීය ඛනිජතෙල් නිෂ්පාදන සඳහා ශක්තිමත් මිල සූත්‍රයක් පැවතීම අත්‍යවශ්‍ය වේ.** ලෝක බොරතෙල් මිල, ගෝලීය ඉල්ලුම් සහ සැපයුම් කම්පන හා අපේක්ෂා හේතුවෙන් නිරතුරුවම වෙනස් වන බැවින්, දීර්ඝ කාලයක් සඳහා ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය මිල ගණන් යම් මට්ටමක ස්ථාවරව පවත්වාගෙන යෑම තුළින් දේශීය තෙල් සැපයුම්කරුවන් හෝ පාරිභෝගිකයන්හට පීඩනයක් නිර්මාණය කරනු ඇත. නැව් ගාස්තු වියදම් (FOB), භාණ්ඩ ප්‍රවාහන හා රක්ෂණ වියදම්, විනිමය අනුපාතය, වරාය ගාස්තු, තීරු බදු හා අනෙකුත් බදු, දේශීයව පිරිපහදු කළ හා පිරිපහදු ආනයනවල සංකලනය සහ විකුණුම් හා පරිපාලන වියදම් යනාදිය ඇතුළත් මිල සූත්‍රයක් මගින් එවැනි බාහිරතාවල බලපෑම අවම කරනු ඇත. මිල සංශෝධනයක් සිදු කළ හැකි වාර ගණන, සංශෝධනය කරන අවස්ථාව සහ බොහෝ විට සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස වර්තමාන සිල්ලර මිල කොපමණ ප්‍රමාණයකින් වෙනස් කරන්නේ ද යන කරුණු තීරණය කිරීම සඳහා රෙගුලාසියක් පැනවීම තුළින් මිල සූත්‍රය ශක්තිමත් කරනු ඇත. එබැවින්, දේශීය ඛනිජතෙල් නිෂ්පාදන සඳහා මිල සූත්‍රය හඳුන්වාදීමට රජය වර්තමානයේ දරන ප්‍රයත්නය නිවැරදි ලෙස ගත් පියවරක් ලෙස ධෛර්යමත් කළ යුතුය. මේ අතර රාජ්‍ය ව්‍යවසායයන්ගේ අලාභ අවම කිරීම සඳහා අනෙකුත් ප්‍රධාන මහජන උපයෝගීතාවයන් හා සම්බන්ධ පිරිවැය පිළිබිඹු වන මිල යාන්ත්‍රණ සැකසීම ද අවශ්‍ය වේ.

**කෘෂිකර්මාන්ත අංශයේ ඉදිරි ගමන හමුවේ අඩු ඵලදායීතාව, විවිධාංගීකරණය අඩු මට්ටමක පැවැතීම, ආහාර අනාරක්ෂිතභාවය, අකාර්යක්ෂම ජල කළමනාකරණය මෙන්ම දේශගුණික විපර්යාස සමඟ ඇතිවන ස්වභාවික අභියෝග වැනි බාධක රැසක් පවතී.** එබැවින්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ජල සම්පත් හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශාල වශයෙන් ආයෝජනය කිරීම හරහා කෘෂිකාර්මික අංශය යළි නඟා සිටුවීමේ වැදගත්කම නිරන්තරයෙන් අවධාරණය කරනු ලැබේ. විවිධාංගීකරණය, ඵලදායීතාව හා තරගකාරිත්වය වර්ධනය කිරීම මගින් සාම්ප්‍රදායික අඩු වටිනාකමින් යුතු කෘෂිකර්මාන්තයේ සිට ඉහළ අගයක් සහිත කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වෙත යොමු වීමට පහසුකම් සැලසීම සිදු කළ යුතු අතර, කෘෂිකාර්මික අංශය ඉහළ වර්ධනයකින් යුතු මාවතකට අවතීර්ණ කිරීමට හා එමගින් ආහාර සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීම සඳහා වත්මන් කෘෂිකාර්මික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමට ප්‍රයත්න දැරිය යුතුය. තවද, ප්‍රාග්ධනය පදනම් කරගත් සංවර්ධනය හා ඵලදාව ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක පදනමකින් යුත් ගොවිපළ ප්‍රවර්ධනය කිරීම, කෘෂි යෙදවුම් පදනම් කරගත් කර්මාන්ත ප්‍රවර්ධනය සහ ගොවි සංවිධාන හා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් යුතුව වාණිජ මට්ටමේ කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම ඉහළ අගය කිරීමකින් යුතු විවිධාංගීකරණය කරන ලද කෘෂි නිෂ්පාදන කෙරෙහි යොමු වීම විශේෂයෙන් වර්ෂා පෝෂිත ප්‍රදේශවල කෘෂිකාර්මික අංශයේ වර්ධනය සඳහා වැදගත් සාධකයක් වනු ඇත. ඒ අනුව ගත් කල කෘෂි නිෂ්පාදන සැකසුම් කර්මාන්ත පුළුල් කිරීම හා නිෂ්පාදකයන්, නාගරික වෙළඳ මධ්‍යස්ථාන හා අපනයන වෙළඳපොළවල් සමග සම්බන්ධ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. කෘෂිකාර්මික අංශයේ වර්ධනය සඳහා නවීන තාක්ෂණික ක්‍රමෝපායන්ට ප්‍රවේශ වීමට සීමිත අවස්ථා පැවැතීම හා යටිතල පහසුකම් සඳහා වූ අඩු ආයෝජන හේතුවෙන් පසුගිය වසර කිහිපය මුළුල්ලේම පීඩාවට පත් කෘෂි පර්යේෂණ හා ව්‍යාප්ති සේවාවන් ශක්තිමත් කිරීම කෙරෙහි අනිවාර්ය අවධානයක් යොමු කළ යුතුය. මේ අතර කාර්මික, ගෘහස්ථ හා කෘෂිකාර්මික අංශ ඇතුළත් වූ විවිධ පාර්ශ්වකරුවන්ගේ ජල පරිභෝජනය සඳහා වූ තරගය ඉහළ යාම මගින්, වාරි අංශයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හරහා ජල සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම, ජලය බෙදා හැරීමේ යාන්ත්‍රණය මෙන්ම වාරිමාර්ග කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.

**නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම, යල් පැනගිය යන්ත්‍රෝපකරණ භාවිතය, අඩු අස්වැන්න, බොහොමයක් වගාවන් පැරණි වීම, අඩු අගය එකතු කිරීම සහ ප්‍රමාණවත් නොවන විවිධාංගීකරණය වැවිලි කර්මාන්ත අංශයේ ප්‍රධාන ගැටලු ලෙස හඳුනා ගත හැක.** නැවත වගාව, වැඩිදියුණු කළ භෝග වගාව, ඵලදායී ලෙස පොහොර භාවිතය, පලිබෝධ පාලන ක්‍රියාවලීන්, විවිධාංගීකරණය, කෘෂි නිෂ්පාදන හා අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සහ සඵලදායී අලෙවිකරණ ජාලයන් ඇති කිරීම යනාදියෙහි අවශ්‍යතාව ඉහත ගැටලු මගින් පෙන්නුම් කරනු ලබයි. මේ අතර වෙළඳ ද්‍රව්‍ය මිල පහළ යෑමත් සමඟම නිෂ්පාදන පිරිවැය ඉහළ යමින් පැවැතීම, තේ සහ රබර් අංශයන්හි වර්ධනය හමුවේ ඇති ප්‍රධානතම අභියෝගය වේ. ශ්‍රී ලංකාව තුළ වගා කෙරෙන බොහෝ භෝග, අගය එකතු කිරීමකින් තොරව ප්‍රාථමික තත්ත්වයෙන්ම අපනයනය කෙරෙන බව දක්නට ඇති අතර එම භෝග යොදා ගනිමින් විවිධ කෘෂි සැකසුම් කර්මාන්ත සංවර්ධනය කිරීමේ සැලකිය යුතු ශක්‍යතාවයක් පවතී. එබැවින් වැවිලි අංශය වඩා ලාභදායී හා තිරසාර මට්ටමක් කරා ගෙන යෑමට සියලුම පාර්ශ්වකරුවන් විසින් ඉහළ ප්‍රයත්නයන් දැරීම අත්‍යවශ්‍ය වේ.

**ඉහළ යන අරමුදල් පරතරය සපුරා ගැනීම සඳහා, රාජ්‍ය සම්පත් හා රාජ්‍ය මූල්‍ය සීමාවන් මත පවත්නා සංරෝධක මධ්‍යයේ සමාජ ආර්ථික යටිතල පහසුකම් හා වාසිදායී ජීවන අවස්ථාවන් සලසා දීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය වැනි නව්‍ය යාන්ත්‍රණ පිළිබඳව ක්‍රියාකාරී ලෙස රජය විසින් සලකා බැලිය යුතුව ඇත.** අධ්‍යාපනය, සෞඛ්‍යය, විදුලිබලය, මාර්ග හා මහාමාර්ග වැනි අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සඳහා රජයේ අඛණ්ඩව සිදු වන ආයෝජන ශ්‍රී ලංකාව මැදි ආදායම් රටක් බවට ශීඝ්‍රයෙන් පරිවර්තනය වීමට දායක වී ඇත. කෙසේ වුවත්, විකල්ප මූල්‍ය ක්‍රම මගින් ප්‍රතිලාභ ලැබීම සඳහා රටට විශාල හැකියාවක් ඇති අතර, එමගින් පෞද්ගලික අංශයේ ප්‍රාග්ධනය හා විශේෂඥතාව ආර්ථිකයේ සියලුම අංශයන් වෙත යොදා ගැනීමට හැකි වනු ඇත. සාර්ථක රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය, අනෙකුත් අංශ අතර ක්‍රියාකාරීත්වයට උත්තේජනයන් ඇති කරමින් ශක්තිමත් ආයතනික සැකැස්මක් ඇතිකිරීමට සහ විශ්වසනීයත්වය වර්ධනය කිරීමට උපකාරී වන බැවින් එමගින් පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථා වැඩි කරනු ඇති අතර පෞද්ගලික අංශයේ මූල්‍යනය, රාජ්‍ය අංශයේ ණය සහ වියදම මත වන පීඩනය අඩු කිරීමට උපකාරී වේ. පෞද්ගලික අංශයේ ඇති තරගකාරී ස්වරූපය නිසා ඒවායේ මැදිහත් වීම වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබාදීම සඳහා ද මගපෙන්වනු ඇත. කෙසේ වුවද, පෞද්ගලික අංශයේ සහභාගිත්වය, ආකර්ෂණය කර ගැනීමේ සාර්ථකත්වය හා එවැනි උපායමාර්ගික හවුල්කාරිත්වයන්ගේ ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව, නිසි අරක්ෂාව, සේවා තත්ත්වය හා මිලකරණය පිළිබඳ ප්‍රමිතීන් නියමකර බලගැන්වීමට රජයට ඇති හැකියාව මත රඳා පවතී. එබැවින්, රජය රාජ්‍ය පාලකයෙක්, පහසුකම් සලසන්නෙකු මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙස සිය කාර්යභාරය සිදු කිරීමේ දී වඩා හොඳ යහ පාලනයක් ඇති කළ යුතු වේ. තවද, රජය මෙම ක්‍රියාකාරකම් සඳහා දේශීය බැඳුම්කර වෙළඳපොළ සංවර්ධනය කිරීම තුළින් මෙන්ම යටිතල ණය අරමුදල් ඇති කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තුළින් “යටිතල පහසුකම් බැඳුම්කර නිකුත් කිරීම” සඳහා පහසුකම් සැලසීම මගින් මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය ධෛර්යමත් කළ හැකිය. පෞද්ගලික අංශයේ සහභාගිත්වය ආකර්ෂණය කර ගැනීමේ සාර්ථකත්වය සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාවන්, රජයේ ප්‍රතිපත්තිවල ස්ථාවරත්වය හා කැපවීම සහ හිතකර නීති හා ආර්ථික පරිසරයක් ඇති කිරීම මත රඳා පවතී.

**ශීඝ්‍රයෙන් ජනගහනය වියපත් වීමත් සමඟ, රාජ්‍ය අංශයේ විශ්‍රාම යෝජනා ක්‍රමවල තිරසාරබව සහතික කිරීමේ අවශ්‍යතාවක් පවතින අතර, සමස්ත ශ්‍රම බලකායම ආවරණය වන පරිදි වෙළඳපොළ වෙත නැඹුරුවූ විශ්‍රාම හා පාරිතෝෂිත යෝජනා ක්‍රම හඳුන්වා දිය යුතු වේ.** විශ්‍රාමිකයන් සංඛ්‍යාව සහ විශ්‍රාමික දීමනාවන් ඉහළ යෑම රජයේ අයවැය තුළ පුනරාවර්තන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යාමට හේතු වේ. ක්‍රමයෙන් වියපත් වන ජනගහනය හා ආයු කාලය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස මධ්‍ය කාලීනව මේ හා බැඳුණු මූල්‍යමය අවශ්‍යතාවන්ගේ අඩුවීමක් අපේක්ෂා කළ නොහැකිය. ජනගහනයෙන් විශ්‍රාම වයසට ළඟාවන සංඛ්‍යාවේ ඉහළ යන ප්‍රතිශතයට සරිලන ලෙස පහසුකම් සපයන ඉතුරුම් හා විශ්‍රාමික ප්‍රතිලාභ ක්‍රම සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව මෙම ජන විකාශය තුළින් මතුකර දක්වයි. වෙළඳපොළ පවත්නා අඩු පොලී අනුපාත තත්ත්වය හා විශ්‍රාමිකයින් වැඩි ප්‍රමාණයක් පොලී ආදායම් මත යැපීමත් හේතුවෙන් මෙවැනි ක්‍රම සංවර්ධනය කිරීමේ කඩිනම් කිරීමේ අවශ්‍යතාවය ඉහළ නංවයි. මූල්‍ය ආයතන කිහිපයක් දැනටමත් ඇතැම් විශ්‍රාමික ක්‍රම හඳුන්වා දී ඇති අතර, දීර්ඝ කාලීන ඉතුරුම්කරුවන්ගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වාර්ෂිකයන්, පාරිතෝෂික යෝජනා ක්‍රම හා විශ්‍රාම සැලසුම් වැනි විකල්ප ඉතුරුම් හා විශ්‍රාම නිපැයුම් තවදුරටත් සංවර්ධනය

කිරීමේ අවශ්‍යතාව පවතී. මෙවැනි ක්‍රම හඳුන්වා දීම විශ්‍රාමිකයින්ට සහනයක් සලසන අතර, මූල්‍ය අංශයේ සංවර්ධනයට පහසුකම් සැලසීමටත් දීර්ඝ කාලීන ව්‍යාපෘතීන් සඳහා අරමුදල් ලබාදීමේ ප්‍රභවයක් ලෙසටත් වැදගත් වනු ඇත. මේ අතර, රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි තිරසාර බව සහතික කිරීම සඳහා 2016 අයවැය මගින් රාජ්‍ය අංශයට අලුතින් බඳවා ගන්නා සේවකයන් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් යෝජනා කර ඇත.

**මූල්‍ය අතරමැදිකරණයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, විවිධාංගීකරණය වූ මූල්‍ය නිෂ්පාදන හා සේවා හඳුන්වාදීම සහ විධිමත් මූල්‍යන සඳහා වූ ප්‍රවේශය ඉහළ නැංවීම තුළින් මූල්‍ය පද්ධතිය පුළුල් කිරීම, ආර්ථිකයේ ඉහළ වර්ධන ප්‍රවණතා තිරසාරව පවත්වා ගැනීමේ දී අත්‍යවශ්‍ය වේ.** මූල්‍ය අංශයේ සංවර්ධනය, ආර්ථිකයේ ශක්තිමත්භාවය වැඩිදියුණු කරන අතර, ඉතුරුම් ඒකරාශී කිරීම, තොරතුරු හුවමාරුව ප්‍රවර්ධනය, සම්පත් බෙදීයෑම වැඩි දියුණු කිරීම, විවිධාංගීකරණය සඳහා පහසුකම් සැපයීම සහ අවදානම කළමනාකරණය තුළින් ආර්ථික වර්ධනය වේගවත් කෙරේ. විවිධාංගීකරණය වූ මූල්‍ය උපකරණ සහිත වඩා පුළුල් හා ද්‍රවශීල මූල්‍ය පද්ධතියකට කම්පනවල බලපෑම අවම කිරීමට හැකියාව ඇති හෙයින්, මූල්‍ය අංශයේ සංවර්ධනය, මූල්‍ය ස්ථායීතාව ප්‍රවර්ධනය කිරීමට ද හේතු වේ. ඒ අනුව, සමාගම් අංශය සහ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් සඳහා මූල්‍ය පහසුකම් සපයන ප්‍රධාන සැපයුම්කරු ලෙස බැංකු අංශය අඛණ්ඩව කටයුතු කරන අතර, ආර්ථිකයේ විවිධ අවශ්‍යතා සඳහා පහසුකම් සපයමින් ප්‍රමාණවත් දිගුකාලීන මූල්‍ය පහසුකම් සැපයීම තහවුරු කිරීම සඳහා වෙළඳපොළ මත පදනම් වූ විකල්ප මූල්‍යන ක්‍රම ප්‍රවර්ධනය කිරීම අවශ්‍යව ඇත. මෙම ක්‍රියාමාර්ගය, පෞද්ගලික අංශයේ ආයෝජන ක්‍රියාකාරකම් ඉහළ නැංවීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ දී ඉතා වැදගත් වේ. ඒ අනුව, දේශීය හා විදේශීය ආයෝජකයන්ගේ වෙළඳපොළ සහභාගීත්වය ඉහළ නැංවීම මගින් කොටස් වෙළඳපොළ වර්ධනය කිරීමට පියවර ගන්නා අතර, මැදිකාලීනව වඩා පුළුල් හා ද්‍රවශීල සාංගමික ණය වෙළඳපොළ සංවර්ධනය සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය. ශ්‍රී ලංකාව කලාපීය මූල්‍ය කේන්ද්‍රස්ථානයක් ලෙස ඉදිරියට පැමිණීමට අපේක්ෂා කරන හෙයින්, ද්‍රවශීල ව්‍යවහාර මුදල් සහ සංකීර්ණ මූල්‍ය උපකරණවලට පහසුකම් සැපයීම සඳහා මූල්‍ය ව්‍යුත්පන්න හා භාණ්ඩ වෙළඳපොළ ක්‍රමිකව සංවර්ධනය කිරීම සහ ගතික සහ ගෝලීය නියාමන රාමුවක් සංවර්ධනය කිරීම ද වැදගත් වේ. මේ අතර, මැලේසියාව, වියට්නාමය, පිලිපීනය සහ ඉන්දුනීසියාව වැනි නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් තුළ දක්නට හැකි පරිදි එවැනි මූල්‍ය පහසුකම් කිසියම් රටකට, දැනුම් ආර්ථිකයක් බවට පත්වීම සඳහා අනුබලයක්ව ඇති බැවින් මනාව වැඩි දියුණු වූ පෞද්ගලික කොටස් සහ ප්‍රාග්ධන ව්‍යවසාය පහසුකම් තවදුරටත් අවධානයට ගත යුතු කරුණක් වී ඇත. ආර්ථිකමය වශයෙන් පසුගාමී ප්‍රදේශවල මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම, දිගු කාලීන ඉතිරි කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා විශ්‍රාම අරමුදල් ක්‍රම සහ විකල්ප ඉතුරුම් ක්‍රම සංවර්ධනය කිරීම සහ පුනර්ජනනීය හා විකල්ප බලශක්ති ආශ්‍රිත ක්‍රියාකාරකම් වැනි නවෝත්පාදන ක්‍රියාකාරකම් මූල්‍යනය කිරීම වැනි ආර්ථිකයේ මෙතෙක් සාක්ෂාත් කරගත නොහැකිව ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා මූල්‍ය අංශයේ සංවර්ධනයට හැකියාව ඇත.

**චීනයේ සිට යුරෝපය දක්වා විහිදෙන ඉන්දියානු සාගර නාවික සේද මාර්ගය මධ්‍යයේ පිහිටි දූපතක් ලෙස ශ්‍රී ලංකාව, එහි උපායමාර්ගික පිහිටීම, පවතින ඉහළ ශක්‍යතාවන්ගෙන් උපරිම ප්‍රයෝජන උකහා ගැනීම සඳහා යෙදවා ගත යුතුය.** උපාය මාර්ගික ලෙස පිහිටීමේ වාසියට අමතරව ශ්‍රී ලංකාවේ ශක්තීන් වන උගත් ශ්‍රම බලකාය, වැඩිදියුණු කළ භෞතික යටිතල පහසුකම්, කලාපයේ රටවලට සාපේක්ෂව ව්‍යාපාර පවත්වාගෙන යාමට පහසු පරිසරය, සාපේක්ෂව අඩු බදු අනුපාතික පවතින බදු ක්‍රමය, සම්මුතිවාදී දේශපාලනය තුළින් සාර්ව ආර්ථික ගැටලු පිළිබඳව පුළුල් ප්‍රතිපත්තිමය දැක්ම මෙන්ම කලාපයේ වේගයෙන් වර්ධනය වන රටක් වීම යන කරුණු කලාපයේ ප්‍රධාන ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිතා කළ හැකිය. ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපයේ රටක් වශයෙන් හඳුන්වනු ලබන නමුත්, එය සමාජ-ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් බලන කල කලාපයේ අනෙකුත් රටවල් සමඟ සැසඳීමේ දී පෙන්නුම් කරනුයේ සමානකම්වලට වඩා වෙනස්කම්වේ. මෙම තත්ත්වය කලාපයේ ඇති අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීමට රටට ඉඩ සලසන අතර, නැගෙනහිර සහ ආසියානු ආර්ථික දැවැන්තයන් මෙන්ම බටහිර දියුණු ආර්ථික සමඟ සම්බන්ධ වීමට අද්විතීය අවස්ථාවක් ලබා දී ඇත. ශ්‍රී ලංකාවට ගෝලීය වටිනාකම් දාමයෙහි ඒකාබද්ධ කොටසක් ලෙස කටයුතු කළ හැකි බැවින් ප්‍රවර්ධන සේවාවල වාසිය සහ නිපුණතාව මගින් ලැබෙන ප්‍රයෝජන ලබා ගැනීමට ද රටට හැකි වේ. මේ අනුව, ආයෝජක විශ්වාසය ඉහළ නැංවීමට සහ මැදිකාලීනව දකුණු ආසියාව තුළ වඩාත් විවෘත, ගෝලීයකරණය වූ හා තරගකාරී ආර්ථිකය බවට

ශ්‍රී ලංකාව පත් කිරීමට හා වෙළඳාම් සහ ආයෝජන සඳහා ඉන්දියන් සාගරයේ කේන්ද්‍රස්ථානය ලෙස තම තත්ත්වය නැවත ලබාගැනීමට පුළුල් ප්‍රයත්නයන් දැරීම අත්‍යවශ්‍ය වේ.

**කාලයක් මුළුල්ලේ වර්ධනය වෙමින් පැවැති ආර්ථිකයේ ව්‍යුහාත්මක ගැටලු 2015 වසර තුළ දී ද පැහැදිලිව දැක ගත හැකි වූ අතර, ඉහළ ආර්ථික වර්ධනයක් හා අඩු උද්ධමනයක් සහිත මාවතකට ගමන් කිරීම සහතික කිරීම සඳහා මෙම ගැටලු නිවැරදි කර ගැනීමට, ස්ථාවර ක්‍රියාමාර්ග අවශ්‍යව ඇත.** ආර්ථික වර්ධනයට අඛණ්ඩව සහාය වීම සඳහා කෙටිකාලීන රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති ප්‍රමාණවත් නොවන අතර, සම්පත් සංරෝධක සහ දැඩි ප්‍රතිපත්ති පැවැතීම තුළින්, එවැනි කෙටිකාලීන ප්‍රතිපත්ති තවදුරටත් යොදාගත නොහැකි බව පැහැදිලි වී ඇත. එමනිසා, ණය නොවන ප්‍රාග්ධන අරමුදල් ආකර්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිපත්ති අඛණ්ඩව පැවැතීම සහතික කිරීමට මෙන්ම ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ඉහළ නැංවීම සඳහා රාජ්‍ය ආදායම සහ වියදම් මෙන්ම රාජ්‍ය ව්‍යවසායන්ට අදාළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ඇතුළුව, සුදුසු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සම්මිශ්‍රණයක් හඳුන්වා දීම අවශ්‍ය වේ. පෞද්ගලික අංශයේ පුළුල් සහභාගීත්වය ඇතිව රටෙහි මානව සම්පත ඇතුළු ශක්තීන් උකහා ගැනීම සහ එක්තැන් කිරීම සඳහා මෙම ප්‍රතිසංස්කරණයන් ඉලක්ක කරගත යුතුය.